

# ග්‍රන්ථාභරණය



# ග ණ්ඨා භ ර ණ ය.

ආ චා ර්‍ය්‍ය
අරියවංසනම් මහාස්ථවිරපාදයන් වහන්සේ
විසින් විරචිතයි.

# වැලිතොට

විද්‍යාභාෂපරිවෙණාධිපති
ආචාර්‍ය්‍ය අමරපුර ගණප්‍රධාන සංඝ නායක
ඥාණතිලක නායක ස්ථවිරපාදයන් වහන්සේ

විසින්

ආචාර්‍ය්‍යඅරියවංසතිලකමෙධාවිතිස්ස
මහාස්ථවිරතුමන්ගේඅයැදුමෙන්
**ලි ය න ල ද වි ස්ත ර ව්‍යා ඛ්‍යා ස හි ත යි.**

ගරු කට යුතු දක්ෂිණ දිශාධිපති
**ඒච්. වෙස්. ඒජගන උන්නාන්සේ විසින්**
ගෞරවයෙන්පිළිගන්නාලදි.

**වී. සාලිස් ද සිල්වා මුනින්ද්‍රදස**
මුදලාලිමහත්මයාවිසින්

වැලිතොට
**විද්‍යාරත්නාකර යන්ත්‍රයෙහි**
මුද්‍රණයකරවනලදි.

ශ්‍රී.බු.ව.2442
1898.

# GANDHA BHARANAYA

COMPOSED BY THE

*ARIYAWANSA MAHA SAMI*

*TOGETHER WITH SINHALESE*
*pharaphrase by the*

*amarapura ganapradhana sanghanayaka*
*U. A. NANATILAKA*
HIGH PRIEST

THANKFULLY
*ACCEPTED BY H, WACE ESQUIRE*
GOVERNMENT AGENT
*for the southern province*

*published dy*
*T. SALIS SILVA MUNINDREDASA*

PRINTED AT THE

VIDYARATNAKARA PRESS

**WELITERA.**

*1898.*

# සංඥාපනය.

**ග්‍රන්ථකරණය**—මෙම පාළිව්‍යාකරණ ග්‍රන්ථය ශ්‍රී බුද්ධවර්ෂ 1980
වැන්නෙහි බුරුමදෙශයට අයත් **බෙම** නම් රටේ **රතනාපුර**
යෙහි රාජ්‍යය කළාවූ **මහානරපති** නම් රජතුමන්ගේ කාල
යෙහි එම රාජධානියෙහි වැඩිසිටි ආචාර්‍ය්‍ය **අග්ගවංස** නම් මහා
ස්ථවිරකෙනෙකුන් විසින් කරණලද්දේයි—

මේ මහා ස්වාමීන් ත්‍රිපිටකබුද්ධවචනයෙහිද මාගධිසංස්කෘතාදි
නානාභාෂාවන්හිද තච්ඡන්දෝලඞ්කාර ව්‍යාකරණාදි අනෙක
ශාස්ත්‍රයන්හිද අතිශය පටුත්වයක් ඇතිකෙනෙක්වූවෝයි—

මේ මහාස්ථවිරොත්තමයෝ **අභිධම්මත්ථවිභාවිනී** නම් අභිධම්මත්ථ
සඞ්ගහටීකාවට '**මණිසාරමඤ්ජූසා**' නම් මාහැඟි අනුටීකාවක්ද
'**මණිදීප**' නම් ග්‍රන්ථයක්ද '**ජාතකවිසෝධන**' නම් අනුටීකාවට
බුරුමභාෂාවෙන් ව්‍යාඛ්‍යාවක්ද කළෝයි—

මේ යතීශ්වරයන් '**මණිසාරමඤ්ජූසා**' නම් අනුටීකාව කරණ
කාලයෙහි අවසන්කළකළ පරිච්ඡෙදයන්හි යම් යම් දෙසක්
ඇත්නම් වදාළමැනවැයි සංඝයාට නියම කොට පොහෝ දි
නවල සෑමලුවට සංඝයා රැස් කොට කියවූබවද—එකල **අරිම
ද්දන** නුවරින් චෛත්‍යය වඳිනුපිණිස පැමිණි ස්ථවිරතුමෙක්
ඒ අසා ඉදු ස්වල්පදෝෂදෙකක් ඒ පරිච්ඡෙදවල පවත්නා බැව්
දැන ග්‍රන්ථකතෘවූ ඒ ස්ථවිරොත්තමයන්ට දැන්වූ බවද—උ
න්වහන්සේද විහාරයට ගොස් නැවත මූලපටන් බලාගෙණ
යනවිට ඒ දෙස්දෙක උන්වහන්සේටත් වැටහී පසුව ආගන්තු
ක ස්ථවිරයන්වහන්සේට සම්මුඛවී උන්වහන්සේට වැටහුනු
දොෂ කුමක්දැයි? විකාළ කල අසවල් දොෂයයි කීබවද—ඒද
උන්වහන්සේට වැටහුනු දෙස්දෙකම බව කියා ඉතා සතුටු
ව තමන්වහන්සේ පොරවා සිටි සඟළ සිවුර ආගන්තුක ස්ථ
විරයන්වහන්සේට පූද, මෙයින් නුබවහන්සේගේ ඥානයට පූ
දම් යයි කීබවද—මුන්වහන්සේ සූත්‍රනිද්දේශාදිය කළාවූ
**ඡපට** නම් මහාස්ථවිරතුමන්ගේ නිකායේ ස්ථවිරතුමෙක් බ
වද බුරුමරාජවංශයෙහි දක්වනලද්දේයි—

මෙය එකක්ඛරකොස කච්චායනභෙද කච්චායනසාර ශබ්ද
බින්දු කාරිකා ආදි ග්‍රන්ථයන් මෙන් දශවිධ ග්‍රන්ථයන්ට ඇතුළ
ත් නූයේයි-බුරුමරටේ ආචාර්‍ය්‍යවරු එම ග්‍රන්ථයන් මෙන් ශිෂ්‍යය

න්ව මෙසද පුහුණු කරවනී—ලක්දිව මෙස ඔවුනොවුන් අතර රහස්ගනව පැවත ආවේයි, මෙස උද්ග්‍රහණධාරණය කරන්න වූන්ට පාළිව්‍යාකරණයෙහිද ත්‍රිපිටකය සම්බන්ධ අර්ථකථන යෙහිද මනාපටුත්වයක් ලැබිය හැක්කේයි—එහෙත් මෙය ල බාගැන්මද ඉතා දුෂ්කරවූයේයි ලබාගත් නුමුත් කාලා න්තරජන්‍ය නා නා දොෂයන්ගෙන් ගහනද වන්නේයි. පොත්දෙකක් එකට තියවාබලනවිට කෙතරම් දුරට ව්‍යාකු ලව තිබේදැයි නිරායාසයෙන් දැනගන්ට හැක්කේයි—මිට බුරු මරටේම කාරණලද ටීකාවක්ද ඇත්තේයි—එයද කියවන්ට පවා දුෂ්කරපරිද්දෙන් වැරදි තිබෙන්නේයි—නිපාතොපසර් ගයන්ගේ අර්ථොදාහරණ දැනගැන්මට ශබ්ධසී ආදි ග්‍රන්ථවලට වඩා මෙය අතිශයින්ම ප්‍රයොජන වන්නේයි—මෙය පුරුද්දපුහු ණුකරණුලබන්නෝද බුදුවදන්හි පරමාධ්‍යශය ලැබීමෙහි බුහුවිද වන්නෝයි—

මේ ග්‍රන්ථයාගේ අගය දැනගත් මුල්ලේරිවියේ සුවණ්ණබිම්බා රාමාධිපති ආචාර්ය **අභිසවංශතිලක මේධාවී** තිස්ස මහාස්ථවිර තුමන්වහන්සේ විසින් අමරපුර **ගණප්‍රධාන සංඝ නායක ගු ණතිලක** නායක ස්ථවිරයන්වහන්සේට සන්නයක් කර දුන මැනවැයි අරාධනාකලහෙයින් එම නායකහිමිතුමන් විසින් නොයෙක් ග්‍රන්ථවලින් උදාහරණ දක්වා ඉතා විස්තරලෙස මෙම ව්‍යාඛ්‍යාව ලියා දෙනලද්දේයි—මේ ව්‍යාඛ්‍යාවේ ප්‍රයොජ නත්වය පොත කියවා බැලීමෙන්ම හැගියන බැවින් ඒ ගැණි සමක් මෙහිදී නොලියමු—

සව්ගෙන් ගෙවා දත් බුදුරජනුමෙකුගේ හැර සෙස්සන්ගේ රචනාවෝ කිසිසේත් දොෂවිනිර්මුක්ත නොවෙති—පෘථග්ජන යන්ගේ රචනා දොෂවිනිර්මුක්තයයි කීම ඒකාන්ත අසත්‍යයෙ කි—එබැවින් මෙහිදු පෘථග්ජනස්වභාව නොසික්ම විය හැකි හෙයින් ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිත දොෂාංශුවකුදු මෙහි නොමැත්තේයයි නොකියමු. එහි නිර්දොෂාර්ථය ප්‍රාඥවරයෝ සංලක්ෂණය කෙරෙත්වයි ආශිංසනය කරමු—

මේවගට,
කලුවාමෝදර පදින්චි
ඒ. සාලිස් ද සිල්වා මුනින්ද්‍රදාස
මුදලාලි වන මමය—

20 | 10 | 98.

(නැවත අච්චුගැසිමේ බලය ග්‍රන්ථකතෘන් වහන්සේගේ අවසරය පිට තබනලදි)

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධි. | ශුද්ධි. |
|---|---|---|---|
| 2 | 1 | විචිතන | විචිත්‍ර |
| ,, | 6 | ප්‍රාණම | ප්‍රණාම |
| 4 | 1 | විචිතන | විචිත්‍ර |
| ,, | 15 | විභාවීනා | විභාවිනා |
| ,, | 27 | විචිත්‍රානම්වෙත් | විචිත්‍රනම්වෙත් |
| ,, | 31 | සඞ්ඛ්‍යතෙන | සඞ්ඛාතෙන |
| 5 | 2 | ඔනතරගිතත්ථ | අවනතරගිතත්ථ-වෙනත් |
| 6 | 30 | විචිත්ත | විචිත්‍ර |
| 9 | 21 | බ්‍යහ්‍ය | බාහ්‍ය |
| 10 | 11 | කෙරේද | කරණලද්දේද |
| ,, | 14 | කායාවාචා | කායවාචා |
| ,, | 30 | කායවාචා | කායවාචා |
| 11 | 27 | මැකරණකොටගෙණ-මැකරණකොටගෙණ | |
| 12 | 25 | විප්‍රකීර්ණ | විප්‍රකීර්ණ |
| 16 | 20 | ඉනිවා | ඉතිවා |
| 18 | 18 | සමාසන්නාදි | සමාසනනාදි |
| 26 | 26 | විචාරිම | විතැරිම |
| 27 | 19 | ඒවාක්‍යය | ඒවාක්‍යයට නාගි |
| 29 | 20 | ආගමෙන | ආගමෙනව |
| 34 | 19 | ප්‍රතිලොමවනය | ප්‍රතිලොමවචනය |
| 37 | 28 | සඛිතතං | සඞ්ඛිත්තං |
| ,, | 30 | සංක්ෂෙපය | සංක්ෂෙපලක්ෂණය |
| 38 | 11 | විසුංභාවෙ | විසුංභාවො |
| ,, | 12 | වෙන්වූවත් | වෙන්වූබව |
| 41 | 12 | වාක්‍යරම්භ | වාක්‍යාරම්භ |
| 44 | 5 | (නිවපනනිපාතය) | වැඩියි |
| 46 | 14 | එත්ථාවිනිච්ඡයො | එත්ථවිනිච්ඡයො |
| ,, | 17 | කියා | කිහෙයින් |
| ,, | 20 | නෙව | නෙව |
| ,, | ,, | සම්පදූරෙකදේසභාවො-සම්පදූසෙකදෙසභාවො | |
| 48 | 15 | පදපූරණ | පදපූරණයෙහි |
| 49 | 8 | යෙනාටිඨිතොව | යෙනාටිඨිතොවෙ |
| ,, | ,, | දබ්බගුණ | ගුණදබ්බ |
| ,, | 24 | (යො යන්නට මුලින්) | වෙ, ඉදින්—අඩුයි |

| පිට. | පෙළ | අශුද්ධ, | ශුද්ධ. |
|---|---|---|---|
| 50 | 7 | තෙමෙ | තෙමේ |
| 52 | 25 | ආදිය | ආදිය |
| 53 | 27 | ආදෙස | ආදෙශ |
| 56 | 19 | සබ්බගෙෙහො | සබ්බගෙහො |
| 58 | 31 | ජිවිතින්ද්‍රියක්ඛඩ | ජීවිතින්ද්‍රියක්ඛව |
| 60 | 30 | ලද්දීවේ | ලද්දේවේ |
| 62 | 19 | යංච | යං |
| 63 | 14 | කඨාය | කතාය |
| 66 | 11 | පයිගාරයන්ගි | පරිහාරයන්ගේ |
| ,, | 20 | ආදිස | ආදිය |
| 71 | 18 | සිටිත් | සුටිත් |
| ,, | 24 | අනෙණ්ථිවිසයා | අනෙකත්ථවිසයා |
| 72 | 14 | ච්‍යකාරයහට | ත්‍යකාරයහට |
| | මුලපිටේ 6 ගාථාව | | ධීරක්ඛන්ධසුධීමතො |
| | අනන්තිමපිටේ 6 ගාථාව | | ගන්ධාභරණ |



ලඞ්කාය දක්ඛිණදිසාපති තිබ්බතෙජො
ඒච්. මෙස්. සමඤ්ඤසහිතො වර රාජමන්ති
ගන්ධාදිකාභරණ වත්ථක්ඛය මිමං උපනෙතා
පීත්‍යා පසන්නහදයො ව පටිග්ගහෙසි.

## මෙහි උදාහරණ දැක්වූ පොත්.

1 ධම්මපදය
2 ධම්මපදට්ඨකථාව
3 නිරුක්තිසංග්‍රහව
4 කාව්‍යදර්ශය
5 සුබොධාලඞ්කාරය
6 සමන්තපාසාදිකාව
7 ගන්ධට්ඨිය
8 ගන්ධට්ඨිටීකාව
9 මහානිරුක්තිය
10 ධාතුකථාප්‍රකරණටීකාව
11 ඛන්ධයමකටීකාව
12 අනුසයයමකටීකාව
13 ආයතනයමකටීකාව
14 ධාතුකථාඅනුටීකාව
15 අත්ථසාලිණිය
16 අභිධම්මාර්ථසඞ්ග්‍රහටීකාව
17 සාරාර්ථදීපනීටීකාව
18 ශබ්දබිඳුටීකාව
19 කච්චායනය
20 නෙත්තිඅට්ඨකථාව
21 අභිධම්මාර්ථසඞ්ග්‍රහව
22 පිරිත් පොත
23 පට්ඨානප්‍රකරණට්ඨකථාව
24 යමකප්‍රකරණට්ඨකථාව
25 විශුද්ධිමාර්ගය
26 මුඛමත්තදීපනීව්‍යාඛ්‍යාව

## අමරපුර ගණප්‍රධාන සංඝ නායක
## පූ. ඒ. ඤාණතිලක නායක ස්ථවිරයන් වහන්සේ
## විසින් වයස 21 සිට 35 දක්වා කරණලද ග්‍රන්ථ

1 මුඛමත්තදීපනී විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ) සර් ජෝසැප් වැස්ට් රිජ්වේ ලඞ්කාණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින් (පිළිගන්නා ලදී)

2 කාරිකා විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ) ස්‍යාමදෙශාධිපති චූළාලඞ්කාර සියම් මහරජතුමන්විසින් (පිළිගත්නාලදී)

3 නිරුක්තිරත්නාකරය (පාලිව්‍යාකරණ—ගාථා 10000) ස්‍යාමදෙශාධිපති චූලාලඞ්කාර මහා නරෙන්ද්‍රයන් විසින් (පිළිගත්නා ලදී)

4 එකක්ඛරකොස විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
5 කච්චායනසාර විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
6 ශබ්දබින්දු විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
7 ගන්ධාභරණ විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
8 ශබ්දවෘත්ති විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
9 නිරුක්තිසඞ්ග්‍රහ ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
10 වච්චවාචක විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
11 සංවණ්ණනානයදීපනී විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
12 වාචකොපදෙශ විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
13 විභත්‍යර්ථදීපනී ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
14 ගන්ධට්ඨි ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
15 සාසනවංසදීප විස්තර ව්‍යාඛ්‍යාව (පාලි සාසනවෘත්තාන්ත කාව්‍ය)
16 විදග්ධමුඛමණ්ඩන ව්‍යාඛ්‍යාව (සංස්කෘතකාව්‍ය)
17 ශෘඞ්ගාරතිලක විස්තර ව්‍යාඛ්‍යාව (සංස්කෘතකාව්‍ය)
18 මොහමුද්ගර ව්‍යාඛ්‍යාව (සංස්කෘත—නීතිශාස්ත්‍ර)
19 අෂ්ටාඞ්ගනිදාන ව්‍යාඛ්‍යාව (සංස්කෘත—වෛද්‍ය)

## උපස්ථම්භකග්‍රන්ථ

1 කච්චායනසූත්‍රනිර්දෙශය (පාලිව්‍යාකරණ)
2 සූත්‍රනිපාතය (සම්බුද්ධ ධර්ම)
3 කාලවිධානපද්ධතිය (ජ්‍යොතිශ්ශාස්ත්‍ර)
4 පදභෙද ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
5 සාරසඞ්ග්‍රහ ව්‍යාඛ්‍යාව (ධර්මප්‍රකරණ)
6 සංයුත්සඟිය (සම්බුද්ධධර්ම)
7 සංයුත්අටුවාව (අර්ථකථා)
8 දික්සඟිය අටුවාසහිත (ධර්ම)
9 දසදහනවසත්‍යප්‍රකරණය (ධර්මප්‍රකරණ)
10 බුද්ධවංශය (සිංහල—ධර්ම)
11 සාමණේර බණදහම් පොත (සාමණේර ශික්ෂා)
12 හංසරාජනිදාන (වෛද්‍ය)

අමරපුර ගණප්‍රධාන සංඝනායක යූ. ඒ. ඤාණතිලක නායකස්ථවිරයන්වහන්සේ



"HIS HOLINESS"

Amarapuraganapradhana Sanghanayaka

U. A. NANATILAKA, HIGH PRIEST.

සන්න සහිත

# ගන්ධාභරණය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

1 යො චාණිතභාය මුනිනො, බොධිපුබ්බඞ්ගිතො දිතො
බොධය ඔඝම්බුජෙ හත්ථා, තමක්ඛූණිතමං නාමෙ—

2 යො නාලයද්දසාහෙසා, චාණිසංසු රුදිතො දිතො
ඒකාලොක මකා ලොකං, නුස්සරෙ ත මනාරතං—

3 විසුද්ධං බුද්ධිනා බුද්ධං, ගුණගන්ධ සුගන්ධිතං
බුද්ධාලි නිස්සිතං සංඝං, කලෙඤ්ජාසං වණ්ණයාමි තං—

4 පදුමාරාම නාමො යො, සීලාලඞ්කාර ලඞ්කතො
විනෙසි මං මහා ථෙරො, වරභෙසජව ස මෙ ගරු—

5 ගන්ධාභරණි ගන්ථං යං, නීපාතත්ථ විභාවිනං
ථෙරො අරියවංසාඛ්‍යො, අකා මතිවිසාරදො—

6 මජ්ඣ මණ්ඩකභූතස්ස, මහාථෙරස්ස ධිමතො
සොබ්භාවී නාම ථෙරෙන, සිස්සෙනාභං නිමන්තිතො—

7 පාළිඤ්ච ට්ඨකථාදිඤ්ච, ගන්ධටීකාදිං සටීකකං
නිස්සාය දීපභාසාය, කරොම ස්ස ත්වණ්ණනං—

8 ඉස්සා විබද්ධචෙතානං, බාලානං ච කුබුද්ධිනං
විසෙගි රසනා මූචජං, නිතාව සච්චදීපනෙ—

9 තස්මා යෙ පණ්ඩිතා සන්ති, අනිස්සා මානිනො ඉහ
පමාණං තෙව න පරෙ, ගුණදොස විවෙචනෙ—

10. මති බ්‍යාම ජපමාදාදි, ජාතා යෙ ඛලිතා ඉහ
නිද්දොසත්ථං ච තෙසානං, සලලකෙබන්තු විචක්ඛණා—

1 විචිත්‍රනයසම්පන්නා, දෙසනා යස්ස තාදිනො
නමො සද්ධම්මසංඝස්ස, තස්ස ආදිච්චබන්ධුනො —

---

(නානාර්ථ ඇති හි ච සහාදිවූ පදයන්ගේ ආදිමධ්‍යාවසානයන්හි නිපතන ශීලභාවයෙන් නිපාත නම්වූ අව්‍යයශබ්දයන්ගේ අර්ථය කියනු කැමැතිවූ මේ ආචාර්‍ය්‍යතෙමේ අතිමඞ්ගල්‍ය සම්භූත රත්නත්‍රයට ප්‍රණාමය පළමු කොට දක්වන්නේ "**විචිත්‍රනයසම්පන්නා**" යන ආදී ගාථාව කිය —

පදත්ථං පදසම්බන්ධං පදච්ඡෙදං තථෙනා කරෙ
නිබ්බචනං ච චොදනා පරිහාරඤ්ච ජප්පිතා
වණ්ණනං කතුකාමෙහි වත්තබ්බා අත්ථදීපනා —

යී කිහෙයින් මේ ගාථාවගේ පදාර්ථයම කිවමනාතන්හි වර්ණනාවන්ට පදච්ඡේදය පූර්වක බැවින් පදච්ඡේදය පළමු කොට මෙසේ දතයුත්තේය—

විචිත්‍රනයසම්පන්නා යනු එක් පදයෙක, දෙසනා යනු එක් පදයෙක, යස්ස යනු එක් පදයෙක, තාදිනො යනු එක් පදයෙක, නමො යනු එක් පදයෙක, සද්ධම්මසංඝස්ස යනු එක් පදයෙක, තස්ස යනු එක් පදයෙක, ආදිච්චබන්ධුනො යනු එක් පදයෙක; යි විභක්ත්‍යන්ත පද විභාගවශයෙන් මේ ගාථා තොමෝ පද අටක් ඇත්තීයයි දතයුත්තීය—මේ පදච්ඡේද වර්ණනායි—

"විචිත්‍රනය සම්පන්නා" යනු නානාප්‍රකාරනයවිශේෂයෙන් යුක්තවූ—මේ නවිශේෂණ නිර්දේශයි—"දෙසනා" යනු ධර්ම දේශනායි. මේ කර්තෘනිර්දේශයි—'අත්ථි' යනු ක්‍රියා නිර්දේශයි, මෙ අධ්‍යාහාර කටයුතු—"යස්ස" යනු අනියමයෙන් සම්බන්ධ නිර්දේශයි—'තාදිනො' යනු තාදිගුණයෙන් යුක්තවූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ—මේ අනියමයෙන් දක්වනලද්දහුගේ ස්වරූපනිර්දේශද ස්වාමි නිර්දේශද වේ—

සෙලො යථා එකඝනො, වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු, න සමිඤ්ජන්ති පණ්ඩිතා —

යී නින්දා ප්‍රශංසා ප්‍රදේශයෙන් ලාභා ලාභාදිවූ අෂ්ටලෝක

———※○※———

ධර්මයන්ගේද ගත්තාලද බැවින් අෂ්ටලෝක ධර්මයන්හි අනුන්නතභාවයෙන්ද—

ලාභෙන උන්නතො ලොකො, අලාභෙන ච ඔනතො
සමො ලාභෙ අලාභෙ ච, තාදිසො සමණො මම—

යසෙන උන්නතො ලොකො, අයසෙනච ඔනතො
සමො යසෙ අයසෙ ච, තාදිසො සමණො මම—

නින්දාය ඔනතො ලොකො, පසංසාය ච උන්නතො
සමො නින්දා පසංසාසු, තාදිසො සමණො මම—

සුඛෙන උන්නතො ලොකො, දුක්ඛෙනාපි ච ඔනතො
සමො සුඛෙ ච දුක්ඛෙ ච, තාදිසො සමණො මම—

යි මෙසේ සුභද්‍රනම් සිටුදූවපිසින් කියනලද ලාභාදියෙහි අනුන්නත ඔනතභාවයෙන්ද සමභාවයෙන්ද අභින්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේගේ තාදිභාවය ප්‍රකාශ කටයුත්තේය—'නමො' යනු කායවාක්චිත්තයෙන් තන්නිම්න තත්ප්‍රොණ තත්ප්‍රාග්භාරවශයෙන් ආදරයෙන් නමස්කාර කිරීමයි—"අත්ථු" යනු වාක්‍යශෙෂයි, ඒ අධ්‍යාහාර කටයුතු—"සධම්ම සඞ්ඝස්ස" යනු සපර්යාප්තික නවලොකොත්තර ධර්මයන් හා ආර්ය පුද්ගලසමූහසඞ්ඛ්‍යාත සඞ්ඝයා සහිතවූ—මෙහි සහශබ්දයහට සකාරාදෙශ වේ—'ඝචිච්' යන ආදි මහානිරුක්ති සූත්‍රයෙන් සහශබ්දයහට සකාරාදෙශ කොට **වග්ගෙ ඝොසාඝොසාදි** සූත්‍රයෙන් දකාරයෙන් පර ධකාරයහට විකල්ප දතයුතු—'තස්ස' යනු නියමවශයෙන් සම්ප්‍රදාන නිර්දේශයි "**නමො යොගාදීස්වපි ච**" යි කියගෙයින් සම්ප්‍රදානයෙහි චතුර්ථී වේ—ඒෂය විෂයිවයද අනුවෘත්ත වේ—"ආදිච්චබන්ධුනො" යනු ආදිත්‍යගොත්‍ර ඇති බැවින් ආදිත්‍ය සඞ්ඛ්‍යාත සූර්යයාගේ නෑවූ ගොත්‍රවශයෙන් පිළිබඳවූ—සූර්යතෙමේ වනාහි ආදිත්‍ය ගොත්‍ර ඇත්තේය, ඔහුගේ බන්ධුභාවයෙන් භාග්‍යවත්තෙමේද ආදිත්‍යබන්ධුයයි ව්‍යවහාර කරණලැබේ—නොහොත් ආදිත්‍යවංශයයි කියනලද මහාසම්මත වංශයෙහි උපන්නාවූ සුද්ධෝදන් මහරජතෙමේ ආදිත්‍ය නම් වේ මේ භාග්‍යවත්තෙමේ ඔහුගේ පුත්‍රතුයි ආදිත්‍ය බන්ධුයයි ප්‍රකටවූයේය—'ආදිච්චබන්ධුනො' යන මෙය 'තස්ස' යි නියමවශයෙන් දක්වනලද "තාදිනො" යන පදයට විශේෂණ බැවින් තද්විශේෂණ නිර්දේශයයි දතයුතු|

1 යස්ස, යම් සර්වඥවරයෙකුගේ; විචිත්‍රනයසම්පන්නා, නානා ප්‍රකාර නයින් යුක්තවූ; දෙසනා, දෙශනාවෙක්; (අජ්ජ) අද්‍යත් ද; සද්ධම්මස්ස, (සපර්‍යාප්ති නවලොකොත්තර) ධර්මය හා (ආර්‍ය)සංඝයා සහිතවූ; ආදිච්චබන්ධුනො, සූර්‍යබන්ධුවූ; තස්ස තාදිනො, ඒ තාදිගුණයෙන් යුක්තවූ සර්වඥයන් වහන්සේට, නමො, (අත්‍ථු) නමස්කාර වේවා—

මේ ඒ ඒ දෙවන් වෙන්වූ පදයාගේ අර්ථවර්ණනා බැවින් පදාර්ථ වර්ණනා නම් වේ—

පදසම්බන්ධය වනාහි විශෙෂණ විශෙෂිතව්‍යවූ පදයන්ගේ පැමිණෙන පදයොජනායයි කියනු ලැබේ—ඒ මේ පදසම්බන්ධයතෙම සතරප්‍රකාරයකින් පූර්වතනයන්විසින් වර්ණනාකරණලදී—උක්තංහි—

පාඨානුසාරී සම්බන්ධො, සම්බන්ධො උපමාය ච
හෙතුනා පිච සම්බන්ධො, උපමාහෙතුනා පිච
සම්බන්ධභෙද විඤ්ඤෙය්‍යා, චතුරොති විභාවිනා—ති

ඔවුන් අතුරෙන් පාඨානුසාරී සම්බන්ධයතෙම මෙසේ දතයුත්තේය—"දෙසනා සද්ධම්මස්ස පකාසනා විචිත්‍රනයසම්පන්නා පිච්ඡෙනි නයෙහි සමන්නාගතා යස්ස තාදිනො සම්මාසම්බුද්ධස්ස අජ්ජ නමො කායවාචා චිත්තෙහි මම නමක්කාරො අභිවාදනකරණං තස්ස තාදිනො සම්මාසම්බුද්ධස්ස ආදිච්චබන්ධුනො අත්‍ථු"යි—සෙසූනූත්සම්බන්ධවිශෙෂයෝ, ගන්ධවිඨිටීකාදියෙහි නය බලා කටයුත්තාහුය අතිවිස්තරභයින් නොදක්වූ—මේ පදසම්බන්ධ වර්ණනායි—

"විසෙසෙන විවිධෙනවා චින්තෙතබ්බාති විචිත්‍රා"—විසෙසෙනවා, විශෙෂයෙන් හෝ; විවිධෙනවා, නොයෙක් ප්‍රකාරයෙන් හෝ; චින්තෙතබ්බා ඉති, සිතියයුත්තාහුනුයි; විචිත්‍රා, විචිත්‍රා නම් වෙත්—"නයන්ති ඤාපයන්ති එතෙහි විධානෙහීති නයා" නයන්ති යී සේයි; එතෙහි විධානෙහි, මේ විධානයෙන්; ඤාපයන්ති ඉති, හඟවත්නුයි; නයා, නය නම් වෙත්—යස්ස යනු ශුද්ධ සර්වනාමපදයි—"ලාභාදීසු උන්නතරහිතතා සඞ්ඛාතෙන තාදීසො—අලාභාදීසු ඔනතරහිතතා සඞ්ඛාතෙන අසම්භාවෙන තාදිසොති තාදී" ලාභාදීසු; ලාභාදියෙහි; උන්නතරහිතතා සඞ්ඛාතෙන, උන්නතරහිතතාව ස

ඞ්ඛාතතයෙන්; යාදිසො, යම් බඳුද; අලාභාදිසු, අලාභාදියෙහි; ඔනතරඟිතතාසඞ්ඛාතෙන, ඔනතරඟිතත්වයයි කියනලද; අසමභාවෙන, අසදෘශභාවයෙන්; තාදිසො ඉති, එබඳුනුයි; තාදී, තාදීනම්—"අලාභාදිසු වා ඔනතරඟිතතා සඞ්ඛාතෙන යාදිසො ලාභාදිසු උන්නතරඟිතතා සඞ්ඛාතෙන සමභාවෙන තාදිසොති තාදී'' අලාභාදිසුවා, අලාභාදියෙහි හෝ; ඔනතරඟිතතාසඞ්ඛාතෙන, ඔනතරඟිතත්ව සඞ්ඛාතතයෙන්; යාදිසො, යම් බඳුද; ලාභාදිසු, ලාභාදියෙහි; උන්නතරඟිතතා සඞ්ඛාතෙන, උන්නතරඟිතත්වයයි කියනලද; සමභාවෙන, සමභාවයෙන්; තාදිසො ඉති, එබඳුනුයි; තාදී, තාදීනම්—''අථවා තෙනෙව උන්නතොනතරඟිතතා සඞ්ඛාතෙන සමභාවෙන දිස්සතීති තාදී'' තස්ස තාදිනො—අථවා, නොහොත්; තෙන එව උන්නතොනතරඟිතතාසඞ්ඛාතෙන; එම් උන්නතඔනතරඟිතත්ව සඞ්ඛාතනවූ; සමභාවෙන, සමානභාවයෙන්; දිස්සති ඉති, දක්නාලැබේනුයි; තාදී, තාදීනම්—(හේ සම්‍යක්සම්බුද්ධයි) ''නමනං අඤ්චනං නමො'' නමනං යී සෙයි; අඤ්චනං, මනාකොට වැඳීම; නමො, නමනම්—''නමියතෙතිවා නමො'' නමියතෙ ඉතිවා, වඳිනුලැබේනුයි හෝ; නමො, නමනම්—''නමති ඔනමති එතෙනාතිවා නමො'' නමති යී සේයි; එතෙන, මේ කරණකොටගෙණ; ඔනමති ඉතිවා, වඳිනුයි හෝ; නමො, නමනම්—(හේ ප්‍රණාම ක්‍රියාගේවත් නිපන් ශුද්ධාපූර්වකමවූ කා මා, ච ච ර කු ශල චෙතනායි) ''ධාරෙතීති ධම්මො'' ධාරෙති ඉති, දරානුයි; ධම්මො, ධර්මනම්—''දිට්ඨිසීලාදිගුණසඞ්ඝාතෙන සංහනතී සමං ගච්ඡතීති සංඝො'' සංහනති යී සේයි; දිට්ඨිසීලාදී, දෘෂ්ටිශීලාදිවූ; ගුණසඞ්ඝාතෙන සමං, ගුණසමූහය හා සමග; ගච්ඡති ඉති, යේනුයි; සඞ්ඝො, සඞ්ඝනම්; (හේ ආචාර්‍ය්‍යශ්‍රී පුද්ගලසමූහයයි) ''ධම්මො ච සඞ්ඝො ච ධම්මසඞ්ඝා'' ධම්මො ච ධර්මයද; සඞ්ඝොච, සඞ්ඝයාද; ධම්මසඞ්ඝා, ධම්මසඞ්ඝ නම්වෙත්—''සහ ධම්මසඞ්ඝෙහි සධම්මසඞ්ඝො'' තස්ස සධම්මසඞ්ඝස්ස—ධම්මසඞ්ඝෙහි සහ, ධර්මසංඝයන් හා සමග; සධම්මසඞ්ඝො, සධම්මසඞ්ඝනම්—තස්ස යන්නු ශුද්ධසර්වනාමපදයි—මෙයින් යස්ස'' යී අනියමයෙන් කියනලද්ද නියම් කෙරේ—''අදිනියා අපච්චං ආදිච්චො'' අදිනියා, දිව්‍යමාතෘවගේ; අප

ච්චං, දරුතෙම; ආදිච්චො, ආදිච්චනම්—"ආදිම්හි අච්චති රාජ
භාවන්ති වා ආදිච්චො" ආදිම්හි, ආදියෙහි; අච්චති සී සේසී;
රාජ භාවනී ඉති වා, රජ වෙනුයී හෝ; ආදිච්චො, ආදිච්චනම්;
(හේ මහාසම්මත රජයි) "තස්ස ගොත්තං ආදිච්චං" තස්ස,
ඔහුගේ; ගොත්තං, ගොත්‍රය; ආදිච්චං, ආදිච්ච නම්—"තස්ස
ආදිච්ච ජාතො ආදිච්චො" තස්ස, ඒ රජහුගේ; ආදිච්ච, ආදි
ත්‍යගොත්‍රයෙහි; ජාතො, උපන්නේ; ආදිච්චො, ආදිච්ච නම්—
එසේ පූර්වනයින් හිරුතෙමේද පශ්චිමනයින් ශුද්ධොදන මහරජ
තෙමේද දක්වනලදී—"ආදිච්ච බන්ධුගොත්තවසෙන සම්බ
න්ධත්තාය තස්ස ඤාතත්තාය වා ආදිච්චබන්ධු" තස්ස ආදිච්ච
බන්ධුනො—ආදිච්චබන්ධුගොත්තවසෙන, සූර්ය්‍යයාගේ ඥාති
ගොත්‍රවශයෙන්; සම්බන්ධත්තායවා, සම්බන්ධභාවයෙන් හෝ;
තස්ස, ඔහුගේ; ඤාතත්තායවා, ඥාතිභාවයෙන් හෝ; ආදිච්චබ
න්ධු, ආදිච්චබන්ධු නම් (හේ සම්‍යක්සම්බුද්ධයි)—මේ නිර්වචන
සඞ්ඛ්‍යාත විග්‍රහවර්ණනායි—

කුමක් හෙයින් වනාහි ග්‍රන්ථය ආරම්භකරන්නාවූ ආචාර්ය්‍ය
තෙමේ සමුද්‍රයට යනු කැමැත්තෙක් හිමවතට යන්නාක්මෙ
න්ද තෙනක් කපනු කැමැත්තෙක් මහවනයකට ප්‍රවිෂ්ට
වන්නාක්මෙන්ද ග්‍රන්ථාරම්භයෙහි රත්නත්‍රයාභි නමස්කාරය කො
ළේද? යනු චොදනායි—පූර්ණාචාර්ය්‍යයන්ගේ කැමැත්ත නො
සිස්වනු කැමැති බැවින්ද ප්‍රණාමයාගේ මඞ්ගල්‍යභාවයෙ
න්ද භයාදි උපද්‍රව විනාශනයට සමර්ථභාවයෙන්ද අසින්ම
තමාහට සැප උපදවනු කැමැති බැවින්ද යන්‍යාපරිහාරයි—වැ
ලිදු රත්නත්‍රයට ප්‍රණාමය කරණු කැමැති ආචාර්ය්‍යයා විසින්
"නමො සබ්බසඞ්ඝස්ස තස්ස ආදිච්චබන්ධුනො" යන මොප
මණෙක්ම කියනුය කුමක්පිණිස"විචිත්තනයසම්පන්නාදෙස
නා යස්ස තාදිනො" යන මේ ගාථාපාදද්වය කියනලද්දේදයි!
සමස්ත සත්වයන්ගේ නමස්කාරකරණයට සුදුසුවූ සර්වඥයන් ව
හන්සේගේ සම්‍යක් සම්බොධිය දක්වනුපිණිසද අභිත්වය දක්
වනුපිණිසද කියනලද්දේය-එහි"විචිත්තනය සම්පන්නා"යන
මෙයින්ම සර්වඥයන් වහන්සේගේ සම්‍යක්සම්බොධිය දක්වයි-
"තාදිනො" යන මෙයින් වනාහි අභිත්වයද සියලු රාග මෙහා
දී පාපධර්මයන්ගෙන් දුරුවීම ඇතිකල්හි තාදිත්වයට ප්‍රාප්තවී
මෙන් මේ ගුණවිශෙෂයද දක්වනලදකල්හි සියලුම සුගත

විද්‍යාචරණ සම්පන්නතාදීහු දක්වනලද්දාහු වෙත් මේ බලසම්ප න්නිභූතවූ ගුණවිශෙෂයන් දක්වනලද කල්හි නිරවශෙෂ හෙතු සම්පද්භූතවූ සමත්‍රිංශත් පාරමිධම් පඤ්ච මහාපරිත්‍යා ගාදිවූ ගොත්‍රගුණඥනය පයඝීනන කොට ඇති පූර්වභාග ප්‍රතිප ද්වූ බුද්ධගුණවිශෙෂයෝ දක්වනලද්දාහුය—මෙසේ ගුණවිශෙ ෂයෙන් සමන්විතවූද භාග්‍යවත්තෙමේ නිචකුලඇත්තේ නොවේ ඉක්ඛිනිව මිශ්‍රනුවූ උපක්‍රොශ නොකරණලද ආදිත්‍ය වංශසඞ්ඛ්‍යාත මහාසම්මතරාජවංශයෙහිම උපන් හෙයින් උසස් කුලඇත්තේයයි දක්වනුපිණිස “ආදිච්චබන්ධුනො” යන විශෙෂණ පදය කියනලද්දේය—ඒ භාග්‍යවත්වූ අභින්වූ සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ විසින් තෙමේම අධිඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශකරණලද ස්වාක්ඛාතතාදි ගුණයෙන් යුක්තවූ යම් ධර්මයෙක් ඇත්තේද. ඒ ධර්මය අසා අනුශාසනාකරණලද පරිද්දෙන් පිළිපන්නාවූ ද සුප්‍රතිපන්නතාදිගුණයෙන් යුක්තවූ යම් සංඝසමූහයෙක් ඇත්තේද මොව්හු දෙදෙන සමස්තලොකයා විසින් නමස්කාරකරණයට සුදුස්සෝයයි දක්වනුපිණිස ‘‘සධම්මසඞ්ඝස්ස’’ යි කියනලද්දේය—සහයොගයෙන් වනාහි මෙහි ධර්මසංඝයන්ට නමස්කාරය දක්වන ලද්දේයි—මෙහි ‘‘සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ” යන ආදියෙහි මෙන්ද ‘‘සපුත්තදාරො ආගතො’’ යන ආදියෙහි මෙන්ද තද්ගුණසංවිඥාන් බහුබ්‍රීහි සමාසය දතයුත්තේය යනු මෙහි චොදනා පරිහාර වර්ණනායි—

සර්ග බන්ධො මහාකාව්‍ය, මුච්‍යතෙ තස්‍ය ලක්ෂණම්
ආශීර්නමස්ක්‍රියා වස්තු, නිර්දෙශොවාපි තන්මුඛම් —යි

කාව්‍යාදර්ශයෙහිද—

සග්ගබන්ධො මහාකබ්බං, වුච්චතෙ තස්ස ලක්ඛණං
පණාමො වත්ථුනිද්දෙසො, ආසීසො පිච තං මුඛං —යි

මාගධී සුබොධාලඞ්කාර නම් අලඞ්කාරශාස්ත්‍රයෙහිද කියනලද සර්ගබන්ධ සඞ්ඛ්‍යාත මහාකාව්‍යයාගේ මුඛභූතවූ ප්‍රකරණාදියෙහි කියයුතුවූ ප්‍රණාම වස්තුනිර්දෙශ ආශිංසනයන් අතුරෙන්.ප්‍රණාමය දක්වා සංක්ෂිප්ත පඤ්චකය දක්වන්නේ ‘‘වන්දනායස්‍ය පණාමස්ස’’ යන ආදි ගාථාත්‍රය කිය)

2 විඤ්ඤෙය්‍ය පණාමස්ස, අනුභාවෙනු පද්දවෙ
සොසෙත්වා හං කරිස්සාමි, නිපාතත්ථවිභාවිනිං —

3 පොරාණෙහි අනෙකාපි, කතා තදත්ථජොතනා
න හි තා බන්ධජාතෙහි, අකතා ලං සුඤාතවෙ —

4 තස්මා නිස්සාය තා යෙව, **ගන්ධාභරණ** නාමකං*
වක්ඛාමි බන්ධගාථාහි, සිස්සානං සුඛබොධියා —

---

2 අහං, මම; විඤ්ඤෙය්‍යපණාමස්ස, (සමස්තලොකයා විසින්) වැඳුපුතුවූ රත්නත්‍රයෙහි කරණලද ප්‍රණාමයාගේ අනුභාවෙන, තෙජස්සාමර්ථ්‍යයෙන්; උපද්දවෙ, (රොගාදි නානා ප්‍රකාර) අන්තරායයන්; සොසෙත්වා, නසා; නිපාතත්ථවිභාවිනිං, නිපාතයන්ගේ අර්ථ ප්‍රකාශිකාවක්; කරිස්සාමි, කරන්නෙමි —

3 පොරාණෙහි, පෞරාණිකාචාර්‍ය්‍යයන් විසින්; අනෙකා තදත්ථජොතනා අපි, නොයෙක් ඒ නිපාතාර්ථවර්ණනාවෝද; කතා, කරණලද්දාහුය; තා, ඒ නිපාතාර්ථවර්ණනාවෝ; බන්ධජාතෙහි, ගාථාබන්ධන පඞ්ක්තියෙන්; අකතා, නොකරණලද්දානු; සුඤාතවෙ, සුවසේ දන්වන්ට; හි, යම් හෙයකින්; න අලං, සමර්ථනොවෙද්ද —

4 තස්මා, එසේහෙයින්; තා, ඒ නිපාතාර්ථවර්ණනාවන්; නිස්සාය එව, නිශ්‍රය කොටම; සිස්සානං, ශිෂ්‍යයන්ගේ; සුඛබොධියා, සුඛාවබොධය පිණිස; බන්ධගාථාහි, ගාථාබන්ධනයෙන්; ගන්ධාභරණනාමකං, ගන්ධාභරණ නම් ප්‍රකරණයක්; වක්ඛාමි, කියන්නෙමි —

(එහි "විඤ්ඤෙය්‍ය—පෙ—සොසෙත්වා" යන මේ පාදමයෙන් තමාවිසින් කැමැතිවනලද ප්‍රණාම ප්‍රයොජනය දක්වයි—රොගාදි උපද්‍රවයන්ගේ නැස්ම ප්‍රණාම ප්‍රයොජනනම්—යේ රත්නත්‍රය ප්‍රණාම නම් අර්ථවශයෙන් සෞමනස්‍ය සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරිකවූ ශ්‍රද්ධාපූර්වඞ්ගම කරුණා ප්‍රධාන කාමාවචර මහාකුශලචෙතනායි—ඒ විඤ්ඤෙය්‍ය විඥානානොමෝ ක්ෂෙත්‍රාධ්‍යාශය සම්පත්තියෙන් දෘෂ්ටධර්මවෙදනීය

---

* බන්ධාභරණ නාමිකන්ති පි පාඨො —

උපපීඩක උපඝාතකවූ ඒ පෞරාණික අකුශලකර්මයාගේ ඵ
ලය ප්‍රතිබාහණය කොට ඒ කර්මයාගේ විපාකවූ සමස්තකර්
යෙන් ජනිතවූ විපාකපරම්පරාවගේ මධ්‍යයෙහි පැවැත්මට
හුදුහුගෙසින් අන්තරායසඞ්ඛ්‍යාත රෝගාදි උපද්‍රවයන් නසන්
ට සමර්ථම වේ එම අන්තරාය විනාශනය විශේෂයෙන් කැමැ
තිවන්නාවූ ග්‍රන්ථකාරකාචාර්‍ය්‍යයෝ ප්‍රකරණාරම්භයෙහි ප්‍රණ
මාදිය කෙරෙත්—ආචාර්‍ය්‍යයන්විසින් එසේම කියනලදී—**සම
න්තපාසාදිකා** නම්වූ විනයාර්ථකථාවගේ ආදියෙහි—

ඉච්චෙවමච්චන්ත නමස්සනෙය්‍යං
නමස්සමානො රතනත්තයං යං
පුඤ්ඤාභිසන්දං විපුලං අලත්ථං
තස්සානුභාවෙන හතන්තරායො—යි.

සූත්‍රාභිධර්ම අර්ථකථාවන්ගේ ආදියෙහිද එසේම කියනලදී—
අවිශෙෂ අඛ්‍යෙතය්‍ය ගාථාවලින්—

සඤ්ඤනිමිත්තං කත්තාච, පරිමාණං පයොජනං
සබ්බාගමස්ස පුබ්බෙව, වත්තබ්බං වත්තු මිච්ඡතා—යි

කියනලද සංඥාදි පූර්වපක්ෂවත්‍ය ලීනාන්තර චොදනාවහා
සමග දක්වයි—එහි 'අහං කරිස්සාමි—වක්ඛාමි' යන මෙයින්
කර්තෘ දක්වනලදී—'අකතාලං සුඤ්ඤතමෙව' යන මෙයින් විප්‍ර
කාරවූ ග්‍රන්ථකරණ නිමිත්තයන් අතුරෙන් බාහ්‍යනිමිත්ත ද
ක්වනලදී—ප්‍රකරණ නිමිත්තයෝ ආධ්‍යාත්මික බාහ්‍යවශයෙන්
දෙදෙනෙක් වෙත්—ඔවුන් අතුරෙන් ආධ්‍යාත්මික නිමිත්ත
නම් ආචාර්‍ය්‍යයාහට ශිෂ්‍යයන්ගේ නොදන්ම හෝ වරදවා ද
න්මු හෝ දැක උපදින කරුණාසී—කරුණාවෙන්ම ග්‍රන්ථය
මෙමේ කරණුලැබේ ඕතොමෝ කර්තෘහු දක්වනලද කල්හි
දක්වනලද්දීම වේ—ශිෂ්‍යයන්ගේ වනාහි අවිශ්‍රැත දුර්විශ්‍රැත
භාවය බාහ්‍යනිමිත්ත නම් වේ—'සිස්සානං සුඛබොධියා' යන
මෙහි සුඛවචනයෙන් ප්‍රමාණය දක්වනලදී—අනතිසංක්ෂිප්ත
භාවයෙන් හා අනතිවිස්තරභාවයෙන් සුවසේ දතහැක්කේ
සී—'බොධියා' යන මෙයින් ප්‍රයොජනය දක්වනලදී—දනාග
න්ට කැමැත්තහුගේම අවබොධය ග්‍රන්ථකරණයාගේ ඵල
නම් වේ—"පොරාණෙහි අනෙකාපි" යන ආදියෙන් වනාහි

ලීනාත්‍ථර චොදනාව හා පරිහාරය දක්වනලදී—ඒ චොද නාවද පදසම්බන්ධයෙහි කියන්නෙමු—මේ මෙසේ මෙහි නමස්කාර ප්‍රයොජන පූර්වපක්ෂික පදච්ඡෙදවශයෙන් වර්ණ නාව දක්වා පදාර්ථාදීහු සුදුසු පරිද්දෙන් දක්වියයුත්තාහුය—එසේ ඇතිකල්හි ඔවුන් අනුරෙන් පදච්ඡෙදය මනාව දතහැක්කේමය—චොදනාපරිහාරයෝ විනාහි පදනුමයෙන් කිය නුලබන්නාහු ග්‍රන්ථගෞරවයපිණිස පවතින්නාහුයැයි—මේත ණ සියලු ප්‍රකාරයෙන් කියන්නෙමු—පදාර්ථ පදසම්බන්ධ නිර්වචනයන් සුදුසු පරිද්දෙන් වර්ණනාකරන්නෙමු—**ශබ්දබිඳු** ආදී ප්‍රකරණයෝ බොහෝ වෙති නැවත කුමක් හෙයින් ආචාර්‍ය්‍යපාදයින් මේ ප්‍රකරණය කෙරේදැ?යන චොදනාව මෙනෙහි කොට එය පරිහරණය කරන්නේ "**පොරාණෙහි අනෙකාපි**" යන ආදී ගාථාමය කිය—නිර්වචනය වනාහි මෙසේ දතයුතු—"වන්දියතෙ කායා වාචා චිතෙතහි තන්නින්න තප්පොණ තප්පබ්භාරතාය පණමීයතෙති වන්දනං" (වන්දනාභි වාදනානුහිසු—පු) වන්දියතෙ සී සේයී; කායවාචාචිතෙතහි, කායවාක් චිත්තයෙන්; තන්නින්නතප්පොණ තප්පබ්භාරතාය, තත්නිම්න තත්ප්‍රොණ තත්ප්‍රාග්භාරභාවයෙන්; පණමීයතෙ ඉති, වඳිනුලැබේනුයී; වන්දනං, වන්දනා නම්—"තං අරහන්තං සබ්බලොක සෙට්ඨ ජෙට්ඨ භාවතො අනුත්තරපුඤ්ඤක්ඛෙත්තතායච පටිග්ගහෙතුං යුජ්ජතීති වන්දනෙය්‍යං" තං, එයට; අරහන්තං සී සේයී; සබ්බලොක සෙට්ඨජෙට්ඨ භාවතො, සියලු ලොකයාට ශ්‍රෙෂ්ඨ ජ්‍යෙෂ්ඨභාවයෙන්ද; අනුත්තරපුඤ්ඤක්ඛෙත්තතායච, නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර භාවයෙන්ද; පටිග්ගහෙතුං, පිළිගන්ට; යුජ්ජති ඉති, යෙදේනුයී; වන්දනෙය්‍යං, වන්දනෙය්‍යනම් (හේ කිමෙක්ද? රත්නත්‍රයයි) "**ගාදස්ස ධාත මිස්සොව**" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් හෝ "**ඊයෙය්‍ය ඝභ**" යන සූත්‍රයෙන් හෝ අභිධ්‍රෙයහි ඊය්‍ය ප්‍රත්‍යය වේ—"පකාරෙන කායවාචා චිතෙතහි නමීයතෙ නමනං වා පණාමො" පකාරෙන, ප්‍රකාරයෙන්; කායවාචාචිතෙතහි, කායවාක් චිත්තයෙන්; නමීයතෙවා, වඳිනුලැබේනුයී හෝ; නමනංවා, වැඳීම හෝ; **පණාමො**, පණාමනම්—"පණමන්ති කායවාචාචිතෙතහි අභිවන්දන්ති එතායාති වා පණාමො" (පපූර්‍වබ-නමනමනෙ—ණ)පණමන්ති සී සේයී; එතාය, මෑකරණ කොට ගෙණ; කායවාචාචිතෙතහි, කායවාක් චිත්තයෙන්; අභිවන්දන්ති

ඉති, වදිනුයි; පණාමො, පණාමනම් (හේ නමස්කාරයෙන් නිපන් කාමාවචර කුශලචෙතනායි) මේ **පණාම** ශබ්දයතෙම **ආනුභාව** ශබ්දයමෙන් දතයුතු—"වන්දනෙය්‍යස්ස පණාමො වන්දනෙය්‍ය පණාමො" තස්ස වන්දනෙය්‍ය පණාමස්ස—වන්දනෙය්‍යස්ස, වැඳයුත්තහුට; පණාමො, නමස්කාරකිරීම; වන්දනෙය්‍යපණාමො, වන්දනෙය්‍ය පණාමනම්—"තං තං බලවිසෙසං අනුභවති එතෙනාති අනුභාවො" (අනුපුබ්බභූසත්තායං—ණ)තෙන ආනුභාවෙන—එතෙන, මේ කරණ කොටගෙණ; තං තං බලවිසෙසං, ඒ ඒ බලවිශෙෂය; අනුභවති ඉති, මැඩපවත්වානුයි; ආනුභාවො, ආනුභාවනම්—(හේ බම්තෙජසයි)"කුසලත්තානං උපගතස්ස විපාකං දුනාති ජිනාතීති උපද්දවා" තෙ උපද්දවෙ—(උප පුබ්බ දු පරිතාපෙ—අ) කුසලත්තානං, කුසල්බවට; උපගතස්ස, පැමිණියහුගේ; විපාකං, විපාකය; දුනාති යී සේයි, ජිනාති ඉති, සිඳිත්නුයි; උපද්දවා, උපද්දවනම්වෙත්—(හේ අකුශලකර්මයෝයි) ඒ අකුශලකර්මයන්ගේ විපාකභූත රොගාදි අන්තරායයෝද කාරණෝපචාරවශයෙන් උපද්‍රවයෝනම් වෙත්—ඔවුනු මෙහි ගන්හාලද්දැහූය—"තෙසු තෙසු අත්ථෙසු නිපතන්තීති නිපාතා" තෙසු තෙසු අත්ථෙසු, ඒ ඒ අර්ථයන්හි; නිපතන්ති ඉති, වැටෙත්නුයි; නිපාතා, නිපාතනම් වෙත්—"පදානං ආදිමජ්ඣාවසානෙසු නිපාතියන්තෙවා ගන්ථකාරකෙහීති නිපාතා" (නිපුබ්බ පත පතනෙ—ණ) පදානං, පදයන්ගේ; ආදිමජ්ඣාවසානෙසු, ආදිමධ්‍යාවසානයන්හි, ගන්ථකාරකෙහි, ග්‍රන්ථකාරචාර්‍යයින් විසින්; නිපාතියන්තෙ ඉති වා, හෙලනුලැබෙත්නුයිහෝ; නිපාතා, නිපාතනම් වෙත්; (හේ අව්‍යයශබ්දයෝයි) "තෙසං නිපාතානං අත්ථා විභාවියන්ති පකාසියන්ති එතායාති අත්ථවිභාවිනී" තං අත්ථවිභාවිනිං—එතාය, මේ කරණ කොට ගෙණ; තෙසං නිපාතානං, ඒනිපාතයන්ගේ; අත්ථා, අර්ථයෝ; විභාවියන්ති යීසේයි; පකාසියන්ති ඉති, ප්‍රකාශකරණලැබෙත්නුයි; නිපාතත්ථවිභාවිනිං, නිපාතත්ථවිභාවිනිනම්— "පුරෙ භවා පොරාණා"තෙහි පොරාණෙහි—පුරෙ, පෙර; භවා, වූවාහු; පොරාණා, පොරාණ නම් වෙත්; "**සද්දසුසමණ්නා**"යන ආදි සූත්‍රයෙන් භාවාර්ථයෙහි ණප්‍රත්‍යය කොට ආදිවෘද්ධි කොට රූපසිද්ධි වේ—"තෙසං නිපාතානං අත්ථා තදත්ථා" තෙසං නිපාතානං, ඒනිපාතයන්ගේ; අත්ථා, අර්ථයෝ; තදත්ථා, ත

දත්නම් වෙත්—“තදත්ථා ජෝතියන්ති දීපයන්ති එත්ථ එතාහි
වාති තදත්ථජෝතනා” එත්ථ වා, මෙහිහෝ; එතාය වා, මැ
කරණකොටගෙණ හෝ, තදත්ථා, තදර්ථයෝ; ජෝතියන්ති
යි සේයි; දීපයන්ති ඉති, ප්‍රකාශකරණු ලැබෙත්නුයි; තදත්
ජෝතනා, තදත්ථජෝතනානම් වෙත්; (ප්‍රෞරාණිකයන් විසි
න් රචනාකරණලද වචනපඞ්ක්තීහුයි—ඒනම් **ගණ්ඨියි** ප්‍රකර
ණාදීහුයි)“ගාථාබන්ධ එව ජාතා බන්ධජාතා”තෙහි බන්ධජාතෙ
හි—ගාථා බන්ධ එව, ගාථාබන්ධනයෙහිම; ජාතා, වූවාහු; බන්ධජා
තා, බන්ධජාතනම් වෙත්—මෙහි ආදි ගාථාශබ්දයට ලොප් කො
ට ‘බන්ධජාතෙහි’ යී කියනලදී—ජාතශබ්දයතෙම ‘දිට්ඨිග
තං’ යන ආදියෙහි ගතශබ්දය මෙන් තබ්භාවාර්ථ වාචකයි—
අනික් ක්‍රමයෙන් කියනුලැබේ. “බන්ධනන්ති අත්ථානුකූලතාය
නීතා අනවජ්ජා භවන්තීති බන්ධා” බන්ධනන්ති යී සේයි; අත්ථා
නුකූලතාය, අර්ථයට සුදුසුභාවයෙන්; නීතා, පමුණුවන ල
ද්දෑහු; අනවජ්ජා, වරද නැත්තාහු; භවන්ති ඉති, වෙත්නුයි;
බන්ධා, බන්ධනම් වෙත්—“ජායන්ති පවත්තන්තීති ජාතා” ජා
යන්තියි සේයි; පවත්තන්ති ඉති,(උපින්ම)පවතිත්නුයි; ජාතා,
ජාතනම් වෙත්—“බන්ධා ච තෙ ජාතා චෙති බන්ධජාතා” තෙ
හි බන්ධජාතෙහි—බන්ධාචතෙ, බන්ධවූවාහුද ඔහුමය; ජාතාච
ඉති, ජාතවූවාහුද ඔහුමනුයි; බන්ධජාතා, බන්ධජාතනම් වෙ
ත්; (ඔව්හු කවුරුද? ශබ්දයද අර්ථයද යන මොහුයි) **සුබෝ
ධාලඞ්කාරයෙහි**—“බන්ධො ච නාම සද්දත්ථා සහිතා දො
සවජ්ජිතා”යී ද—“පජ්ජගජ්ජවිමිස්සානං භෙදෙනායං තිධා භ
වෙ”යීද කියනලදී—එහි අක්ෂරයෙන් නියමිත පදසමූහය තෙ
මේ පද්‍යනම්—තද්‍භය මිශ්‍රවූයේ විමිශ්‍රනම්—ශරීරයද බන්ධනය
ද යන දෙකම එකෙකි—ඔවුන්අතුරෙන් මේ ‘බන්ධජාතෙහි’
යන පදයෙහි පද්‍යබන්ධනය කැමැතිවනලදී—“සුභෙනා විස
යෙන විවිධෙන වා නයෙන ජානාපෙතුං සුසඞ්ඛතමෙව” සුභෙන
විසයෙනවා, සැපවූ විෂයෙන් හෝ; විවිධෙන නයෙනවා, අ
නෙකප්‍රකාරනයින් හෝ; ජානාපෙතුං, දන්වන්ට යන අර්ථයෙ
හි; සුසඞ්ඛතමෙව, සුසඞ්ඛතමෙව යනු වේ—මේ කාරිතාන්ත නිර්දේ
ශයී—“ගන්ථයන්ති අවිප්පකිණ්ණෙ සද්දෙ අත්ථෙච එකතො
බන්ධිතෙ කරොන්තීති එත්ථ එතෙහිවාති ගන්ථා”—ගන්ථයන්ති
යි සේයි, එත්ථවා, මෙහිහෝ; එතෙහිවා, මොවුන් කරණකො
ටගෙණ හෝ; අවිප්පකිණ්ණෙ, විප්‍රකීර්ණ නූවූ; සද්දෙ, ශ

———✻✻✻———

බිඳයන්ද; අපෙච්ච; අපීයන්ද; එකතො, එක්ව; බාධිතෙ ක
රොන්ති ඉති, බැඳුනවුන් කෙරෙත්නුයි; ගන්ධා,ගන්ධනම් වෙ
ත්—(ශේ බන්ධන සඞ්ගහයෝයි) "ගන්ථානං ආභරණං අලඞ්ක
රණං ගන්ථාභරණං" ගන්ථානං, ග්‍රන්ථයන්ගේ; ආභරණං;
යි සේයි; අලඞ්කරණං අලඞ්කාරකිරීම; ගන්ථාභරණං, ගන්ථා
භරණනම්—"තං කරොති එතෙනාති වා ගන්ථාභරණං" එතෙ
න, මේකරණකොටගෙණ; තං, එය; කරොති ඉතිවා, කෙරේ
නුයිහෝ; ගන්ථාභරණං,ගන්ථාභරණ නම් (ශේ ද්‍යකරණයි)"ග
න්ථාභරණං ඉති නාමං එතස්සාති ගන්ථාභරණනාමකංතං"
ගන්ථාභරණං ඉති, ගන්ථාභරණ යන; නාමං, ;නාමය; එත
ස්ස ඉති, මෙහට නුයි; ගන්ථාභරණ නාමකං, ගන්ථාභර
ණනාමක නම්—ශේ 'වක්ඛාමි' යනුහා සම්බන්ධයි—"බන්ධීය
න්ති සහ ගච්ඡීයන්තෙති බන්ධා" (බන්ධ බන්ධනෙ—අ)
බන්ධීයන්තෙති සේයි; සහ ගච්ඡීයන්ති ඉති, සමග යනුලැබෙ
ත් නුයි; බන්ධා, බන්ධනම් වෙත්—"ගීයන්ති පාදනියමෙන
කථියන්තෙති ගාථායො" (ගෙ සද්දෙ-ඊ) ගීයන්ති යි සේයි;
පාදනියමෙන, පාදයන්ගේ නියමයෙන්; කථීයන්ති ඉති, කි
යනුලැබෙත් නුයි; ගාථායො, ගාථානම් වෙත්—"බන්ධා එව
ගාථායො බන්ධගාථායො" තාහි බන්ධගාථාහි- බන්ධාඑව, බ
න්ධනයෝම; ගාථායො, ගාථාවූවාහු, බන්ධගාථා, බන්ධගාථා
නම්වෙත්— "සික්ඛිතුං උග්ගහණ පරිපුච්ඡන ධාරණාදිව
සෙන පරිපූරෙතුං ඉච්ඡන්තීති සිස්සා" සික්ඛිතුංයිසේයි, උග්ග
හණ පරිපුච්ඡන ධාරණාදිවසෙන, උද්ග්‍රහණ පරිපුච්ඡන ධාර
ණාදිවශයෙන්, පරිපූරෙතුං, පූරන්ට, ඉච්ඡන්ති ඉති, කැමැති
වෙත්නුයි, සිස්සා, සිස්සනම්වෙත් (ශේ තරුණ ප්‍රඥවත් කුලපු
ත්‍රයෝයි)මෙහි 'සික්ඛපූරණෙ' යන ධාතුහුකෙරෙන් "**මනුපූරසු
ණාදීහි උස්සනුසිසා**"යන සූත්‍රයෙන් ඉසප්‍රත්‍යය කොට'**වඝාදීහි**'
යන ආදි සූත්‍රයෙන් 'සික්ඛඉස'යන ධාතුප්‍රත්‍යයදෙදෙනාහට සි
ස්ස යන ආදෙශ කොට රූපසිද්ධි වේ—අථවා"සුස්සූසන්ති සො
තුමිච්ඡන්තීති සිස්සා"තෙසං සිස්සානං—අථවා, නොහොත්,
සුස්සූසන්තියි සේයි, සොතුං, අසන්ට, ඉච්ඡන්ති ඉති, කැමැති
වෙත් නුයි, සිස්සා, සිස්සනම් වෙත්—මෙහි 'සු සවණෙ' යන
ධාතුහුකෙරෙන් එම සූත්‍රයෙන් ඉසප්‍රත්‍යය කොට ධාත්වන්ත
ලොපය කොට සකාරය පරකුරකරු පමුණුවා ඒත්ව කොට රූ
පසිද්ධි වේ—"සුඛෙන බොධනං සුඛබොධං" තාය සුඛබොධි

5 පදානං ආදිමජ්ඣෙසු, අන්තෙසුච නිපාතකෙ
පුච්ඡාදීනං විභාවත්ථං, සදා යුජ්ජන්ති පණ්ඩිතා.—

යා—සුබොධන, සුවසේ, බොධනං, අවබොධකිරීම; සුබබොධි, සුඛබොධිනාමි—මේ මේගාථාවන්හි පදවිග්‍රහ සඞ්ඛ්‍යාත නිර්වචනයි)

(මෙසේ ප්‍රණාමසහිතවූ පූර්වපඤ්චකය දක්වා දැන් තමාවිසින් ප්‍රතිඥාකරණලද ග්‍රන්ථය ප්‍රාරම්භ කරන්නාවූ මේ ආචාර්යතෙමේ '**පදානං ආදි මජ්ඣෙසු**' යනා ආදිය කිය)

5 පණ්ඩිතා, ප්‍රාඥයෝ, පදානං, පදයන්ගේ, ආදිමජ්ඣෙසු, ආදිමධ්‍යයන්හිද, අන්තෙසුච, අන්තයන්හිද; නිපාතකෙ, නිපාතයන්; පුච්ඡාදීනං, ප්‍රශ්නාදින්ගේ; විභාවත්ථං, ප්‍රකාශකිරීමපිණිස; සදා, හැමකල්හි; යුජ්ජන්ති, යොදත්.—

(''පජ්ජන්ති අනෙන අත්ථා ඤායන්ති එතෙහීති පදානි'' තෙසං පදානං—පජ්ජන්තීතිසේයි, එතෙහි, මොවුන් කරණකොටගෙණ; අත්ථා, අර්ථයතෙම; ඤායන්ති ඉති, දන්නාලැබෙත්නුයී; පදානි, පදනම්වෙත්—''පඨමං ආදියති ගණ්හියතීති ආදි'' පඨමං, පළමුකොට; ආදියතීතිසේයි, ගණ්හියති ඉති, ගන්නාලැබෙත්නුයී; ආදි, ආදිනම් (පූර්වප්‍රදෙශයි) ''මධ්‍යති අන්තරෙ භවතීති මජ්ඣං'' මධ්‍යතීතිසේයි; අන්තරෙ, අතරෙහි; භවති ඉති, වේනුයී; මජ්ඣං, මජ්ඣනම් (අන්තරප්‍රදෙශයි) ''ආදිච මජ්ඣඤ්ච ආදිමජ්ඣා'' තෙසු ආදිමජ්ඣෙසු— ආදිච, පූර්වප්‍රදෙශයද; මජ්ඣංච, අන්තරප්‍රදෙශයද; ආදිමජ්ඣා, ආදිමජ්ඣනම්වෙත්—''අමති ආදිමජ්ඣානං පච්ඡිමෙ භාගෙ භවතීති අන්තො'' අමතීතිසේයි, ආදිමජ්ඣානං, ආදිමධ්‍යයන්ගේ; පච්ඡිමෙ භාගෙ, පශ්චිම භාගයෙහි; භවති ඉති, වේනුයී, අන්තො; අන්තනාමි. (අවසානප්‍රදෙශයි) ''අන්තොච අන්තොච අන්තා'' තෙසු අන්තෙසු—අන්තොච, අන්තයද; අන්තොච, අන්තයද; අන්තා, අන්තනම් වෙත්—''නිපාතා එව නිපාතකා'' තෙ නිපාතකෙ—නිපාතා එව, නිපාතයෝම; නිපාතකා, නිපාතකනම්වෙත්—''පරිහාරතො පඨමං තදත්ථං ඤාතුකාමතාය පුච්ඡතෙති පුච්ඡා'' පරිහාරතො, පරිහාරවශයෙන්; පඨමං, පළමුකොට; තදත්ථං, ඒඅර්ථය; ඤාතුකාමතා

ය, දන්නාකැමැති බැවින්; වුච්චතෙ ඉති, කියනුලැබේනුයි; පු
ච්ඡා,පුච්ඡානම්—මෙහි පපුච් 'වච ජියතාතියංචාචාෘයං' යන මේ
ධාතුහුගේ අන්තලොපය කොට 'භුජශසුභග' දි සූත්‍රයෙහි
චග්‍රහණයෙන් ජප්‍රත්‍යය කොට ධාතුවන්තවකාරය පරාක්‍ෂරයා
කරා පමුණුවා ''වවවාඃවු'' යන සූත්‍රයෙන් වකාරයහට උ
කාර කොට 'සරාසරෙ ලොපං' යන සූත්‍රයෙන් පකාරාන්ත
ස්වරය ලොප් කොට පරක්‍ෂරයකරා පමුණුවා 'පුච්ඡ' යන ප්‍රකෘ
තිහු කෙරෙන් ''ඉත්ථියමතියවොවා'' යන සූත්‍රයෙන් අප්‍ර
ත්‍යය කොට නැවත 'ඉත්ථියමතො' යන ආදි සූත්‍රයෙන් ආ
ප්‍රත්‍යය කොට ස්‍යුත්පත්‍යාදිය කළකල්හි රූපසි—''පුච්ඡා ආ
දි යෙසං අත්ථවිසෙසානං තෙ පුච්ඡාදයො'' තෙසං පුච්ඡාදි
නං—පුච්ඡා, පෘච්ඡාව; ආදි, ශිමාවූවා; යෙසං අත්ථවිසෙසානං,
යම් අර්ථවිශෙෂයකෙණකුන්ටද; තෙ, ඔව්හු; පුච්ඡාදයො,
පුච්ඡාදිහුනම් වෙත්—''විභාවීයතෙ පකාසියතෙ ඤාපීයතෙ
ති විභාවො'' තස්ස විභාවත්ථං—විභාවීයතෙ යි සේයි,
ප කා සි ය තෙ යි සේ යි, ඤා පී ය තෙ ඉ ති, හ ග
වනුලැබේ නුයි; විභාවො, විභාවනම්—තදත්ථසම්ප්‍රදාන
යෙහි 'සවිභත්ති හට 'අයවතුසෙඃකාවචනස්සතු' යන සූ
ත්‍රයෙහි තුග්‍රහණයෙන් 'ත්ථං' යන ආදෙශ වේ—''විභා
වො එව අත්ථො ''පයොජනං විභාවනත්ථො'' තස්ස විභා
වත්ථං- විභාවො එව, විභාවයම; අත්ථොයි සේයි; පයොජ
නං,ප්‍රයොජනවූයේ; විභාවනත්ථො විභාවනත්ථනම්—මෙපක්‍ෂයෙහි
සවිභක්තිහට එමතුග්‍රහණයෙන් අං යන ආදෙශ වේ—**මහා
නිරුක්ති** යෙහි අත්ථං යන ආදෙශයයි කියනලදි—''පකාරෙ
න සබ්බධම්මෙසු තෙසං ලක්ඛණාදිසුච ඤාති පවත්තති
ති පඤ්ඤා'' පකාරෙන, ප්‍රකාරයෙන්; සබ්බධම්මෙසු, සියලු
ධර්මයන්හිද; තෙසං, ඒධර්මයන්ගේ; ලක්ඛණාදිසුච, ලක්‍ෂණා
දියෙහිද; ඤාතියි සේයි, පවත්තති ඉති, පවතිනුයි; පඤ්ඤා, ප
ඤ්ඤානම්—(හේප්‍රඥායි) ''පඤ්ඤාය ඉතා ගතා සමන්නාගතා
ති පණ්ඩිතා'' පඤ්ඤාය, ප්‍රඥාවෙන්; ඉතායි සේයි; ගතායි
සේයි; සමන්නාගතා ඉති, යුක්ත වූවාහුනුයි; පණ්ඩිතා, පණ්ඩි
තනම්වෙත්; (ඒ නානාප්‍රකාර නයින් සමන්විතවූ යම් කිසි
ග්‍රන්ථයක් ප්‍රාරම්භ කරන්නාවූ ආචාර්‍යොත්තමයෝයි)

(මෙසේ පෘච්ඡාදීන්ගේ හැඟවීමපිණිස ඒවාක්‍යාදීන්ගේ

6 හිසද්දෙ චේව චසද්දෙ, පන වාපි තථා පිච
කිඤ්චාපි යදි කාමඤ්ච, නිපාතා නෙකධා සියුං.

7 වාක්‍යාරම්භෙව විත්ථාරෙ, දළ්හීයෙ ඵල හෙතුකෙ
තප්පාකටිකරණෙව *, විසෙසෙ අන්වයෙ පිච
බ්‍යතිරෙකෙව **හිසද්දෙ**, නවත්ථෙසු පකාසිතො.

---

ආදිමධ්‍යාවසානයන්හි නිපාත ප්‍රයොගය ආචාර්‍යොත්තමයන් ගේ ආචිණ්ණයයි දක්වා ඔව්හු කවුරුදැයි? ඔවුන් ඒකදෙශය කින් දක්වන්නේ '**හිසද්දෙචෙව**' යන ආදිය කිය)

6 හිසද්දෙ, ච එව, හිශබ්දයද; (නොහොත්) හිසද්දෙච, හි ශබ්දයද; එව, එවශබ්දයද; චසද්දෙ, චශබ්දයද; පනච, ප නශබ්දයද; අපි, අපිශබ්දයද; තථාපිච, තථාපිචශබ්දයද; කි ඤ්චාපි, කිඤ්චාපිශබ්දයද; යදි, යදිශබ්දයද; කාමඤ්ච, කා මඤ්චශබ්දයදැයි; නිපාතා, නිපාතයෝ; අනෙකධා සියුං, නො යෙක් වැදෑරුම් වෙත්.

(පූර්වපක්ෂයෙහි 'හිසද්දෙ චෙච' යන මෙහි චශබ්දය ආදී දීප කයි—එවශබ්දය පදපූරණාර්ථයි—"න එකො අනෙකො" න එකො, එකෙක් නොවන්නේ; අනෙකො, අනේක නම්-"අනෙ කොපකාරෙ එතෙසං අත්ථීති වා අනෙකධා" අනෙකො, නො යෙක්; පකාරො වා, ප්‍රකාරයහෝ; එතෙසං, මොවුන්ට; අත්ථි ඉ ති වා, ඇත්තේනුයිහෝ; අනෙකධා, අනෙකධා නම්—ප්‍රකාරා ර්ථයෙහිද අස්ති අර්ථයෙහිද '**විභාගෙධා**' යන සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් 'අට්ඨධා ලොකමූලානි' යන ආදියෙහි මෙන් ධා ප්‍රත්‍යය වේ—නිපාතයෝ බොහෝ ප්‍රකාර වෙත්—මේ බාලාව තාරයෙහිද අභිධානප්‍රදීපිකාවෙහි අව්‍යයවර්ගාදියෙහිද. බලා දැනගතයුතු)

(මෙසේ නිපාතයන්ගේ ඒකදෙශයකින් ස්වරූපය දක්වා අ නෙකාර්ථවූ **හි ච පන** ශබ්දයන් අතුරෙන් හිශබ්දයාගේ අර්ථ ය පළමුකොට දක්වන්නේ "**වාක්‍යාරම්භෙව විත්ථාරෙ**" යන ආදිය කිය)

7 හිසද්දෙ, හිශබ්දයතෙමේ; වාක්‍යාරම්භෙව, වාක්‍යාරම්

---

* 'තප්පාටීකරණෙව වා' ති පොත්ථකෙසු දිස්සති.

——※※0※※——

හයෙහිද; විත්ථාරෙ, විස්තරයෙහිද; දළ්හියෙ, අතිශයාර්ථයෙහිද;
ඵල, ඵලය; හෙතුකෙ, කාරණය යන මෙහිද; තප්පාකට්ක
රණෙච, එය ප්‍රකාශකිරිමෙහිද; විසෙසෙ, විශෙෂයෙහිද; අ
ඣයෙ අපිච, අධ්‍යයෙහිද; ඛ්‍යතිරෙකෙච, ව්‍යතිරෙකයෙහිද?
යන; නවත්ථෙසු, නවාර්ථයන්හි (වේයයි) පකාසිතො, ප්‍රකා
ශකරණලද්දේය.

(''වුත්තාබ්බිනාති වාක්‍යං'' වුත්තාබිබිං ඉති, කියන්නත්තේනුයි;
වාක්‍යං, වාක්‍ය නම්—''ආහුසො රඝියතෙ අභිමුඛං කරිය
තෙති ආරම්භො'' ආහුසො, අතිශයින්; රඝියතෙ සී සෙයි,
අභිමුඛං කරියතෙ ඉති, අබිමුව කරණුලැබේනුයි; ආරම්භො,
ආරම්භනම්—''වාක්‍යස්ස ආරම්භො වාක්‍යාරම්භො'' වාක්‍ය
ස්ස, වාක්‍යයාගේ; ආරම්භො, පටන්ගැන්ම; වාක්‍යාරම්භො,
වාක්‍යාරම්භ නම්(ගේහිසිටක් කියා අත්තක් කියන්නානැමැත්තහු
ගේ පශ්චිමවචනයි) අථවා ''වුච්චිත්ථාති වාක්‍යං'' අථවා, නො
හොත්; වුච්චිත්ථ ඉති, කියනුලැබීනුයි, වාක්‍යං, වාක්‍යනම්
(ගේපූර්වවචනයි)''වාක්‍යස්ස පච්ඡා වුත්තත්ථෙන ආරම්භො වා
ක්‍යාරම්භො'' තස්මිං වාක්‍යාරම්භෙ—වාක්‍යස්ස, වාක්‍යයා
ගේ; පච්ඡා; පසුව; වුත්තත්ථෙන, කියනලද අර්ථයෙන්; ආ
රම්භො, පටන්ගැන්ම; වාක්‍යාරම්භො, වාක්‍යාරම්භනම්, ගේ
(පශ්චිම වචනයි)''ගි පන සද්දෙ යෙවා නෙකත්ථෙ පයොජෙ
න්ති'' සී කියා අතිකක් කියනුනැමැත්තහුගේ ''එත්ථ ගි තාවගි
සද්දෙ'' යන ආදී පශ්චිමවචනය වාක්‍යාරම්භය වේ—මෙහි ගි
ශබ්දයතෙම වාක්‍යාරම්භද්‍යොතකනම්—මෙය ශබ්දවිසිට්ඨකා
වෙහිද මෙසේම කියනලදී— එයින් පූර්වනයින් 'එත්ථ ගි තා
ව ගිසද්දෙ' යන ආදී වචනයම වාක්‍යද ආරම්භද වේයයි හැ
ගේ- පශ්චිමනයින් ''ගිචපනසද්දෙ—පෙ—පයොජෙන්ති''
යන වචනය වාක්‍යනම් පූර්වයෙහි කියනලදබැවින්—'එත්ථ ගි
තාව ගිසද්දෙ' යන ආදිය ආරම්භ නම්—පූර්වොක්ත කාරණ
යෙ නැයි දතයුතු—''සඞ්ඛෙපෙන වුත්තස්ස විත්ථාරණං ප
පඤ්චනං ව්‍යාසො විත්ථාරො'' තස්මිං විත්ථාරෙ—සඞ්ඛෙ
පෙන, සංක්ෂෙපයෙන්; වුත්තස්ස, කියනලද්දහුගේ; විත්ථාර
ණංයිසෙයි, පපඤ්චනංයිසෙයි, ව්‍යාසො විස්තරකිරීම; විත්ථා
රො, විත්ථාරනම්—'ගිසද්දෙ විත්ථාරවාක්‍යාරම්භ—පෙ—ව්‍යති

රෙතෙසු දිස්සති' යී සංඛෙපය වේ "තෙසුහි පඨමද්‍ධිබ්බි ඛෙක්ඛුයො" යන ආදිය විස්තර නම්වේ--සංඛෙපයෙන් කියන ලදදනුගේ විස්තර කොට කියනලදහෙයිනි--මෙහි හිශබ්දය විස්තරද්‍යෝතකනම්වේ-මෙය **ශබ්ධවිධිකාංඩ**හිද මෙසේම දක්වනලදී--"දළ්හං කරොයිති දළ්හියං" දළ්හං, දෘඪ කොට; කරෙන්ඉති, කෙරේනුයී; දළ්හියං,දළ්හියනම්--දළ්හං කරොති එතෙනාතිවා දළ්හියා" තස්මිං දළ්හියෙ-එතෙන, මේකරණ කොටගෙණ; දළ්හාංකරොති ඉතිවා,දෘඪ කෙරේනුයීහෝ;දළ්හියං, දළ්හියනාම්--පූර්වවචනය දළ්හියනම් පශ්චිමවචනය කාරණනම්--"වුත්තං හි භගවතා" යන ආදියයි--මෙහි හිශබ්දය දළ්හිය ද්‍යෝතකනාම්--"ඵලස්ස වචනං ඵලං" ඵලස්ස, ඵලයාගේ; වචනං, කිම; ඵලං, ඵලනම්--'ඵලවචනං' යී කිවමනා තත්හිඋත්තර පදලොපවශයෙන් 'ඵලං'යී කියනලදී—"හෙතුස්ස වචනං හෙතු" හෙතුස්ස, හෙතුහුගේ; වචනං, කිම; හෙතු, හෙතුනම්--හෙද උත්තරපදලොපවශයෙනි--ඵලඤ්ච හෙතුච ඵලහෙතුකං" තස්මිං ඵලහෙතුකෙ--ඵලංච, ඵලයද; හෙතුච, හෙතුවද; ඵලහෙතුකං, ඵලහෙතුකනම්--මෙහි **ඛඩ්ඩසඞ්ඝසඞ්ඝාදි** සූත්‍රයෙනි කාරග්‍රහණයෙන් සමාසාන්තයෙහි කකාරාගම වේ--ඉදින්වනාහි 'ඵලහෙතුසු' යන පාඨයෙක් ඇත්තේනම් ඒසුන්දරම වේ-"ලොමහංසො වා සො පතියෙඨාපි නොපිපතියෙඨ" යනුද 'දානං නාම තිස්සො චෙතනා පරිපූර්ණං කාතුං සකොකාන්තස්ස මහප්ඵලං හොති" යනුද ඵලනම්--"සකොකා හි ඡක්කවෙ දෙවානම්නෙද, අඤ්ඤතරාගො--පෙ--උත්‍රාසි පලායි"--යනුද 'අපරචෙතනං පරිපූර්ණං කාතුං අසකොකාන්තස්ස හි භොගෙ ලභිත්වා භුඤ්ජිතුං අසමත්ථතාව' යනුද හෙතුනම්--මෙහි හිශබ්දය කාරණ සඞ්ඛාත හෙතුද්‍යෝතකනම් වේ--"සත්ති ආපත්ති ආවිකාතබ්බා" යනුද "පුබ්බෙ දානස්ස අදින්නත්තා දළිද්දෙ ජාතො" යනුද කාරණ නම්--"අවිකතා හි ස්ස ඵාසු හොති" යනුද 'භොගසම්පන්නං හි තම්වහන්ති' යනුද ඵලනම්—මෙහි හිශබ්දයතෙම ඵලද්‍යෝතකනම් වේ--"පුබ්බෙ වුත්තං අපාකටත්ථං පාකටං කරොතිති පාකටීකරණං" පුබ්බෙ,පෙර;වුත්තං, කියනලද; අපාකටත්ථං, අප්‍රකටාර්ථය; පාකටං කරොති ඉති, ප්‍රකට කෙරේනුයී; පාකටීකරණං, පාකටීකරණනම්—"යථා වුත්තත්ථං පාකටං කරොති එතෙනාති වා පාකටීකරණං"

යථා වුත්තත්ථං, යථොක්ත අර්ථය; එතෙන. මේ කරණකොට
ගෙණ; පාකටං කරොති ඉති, ප්‍රකටකෙරේනුයි; පාකටීකර
ණං,පාකටීකරණනම්-'තස්ස පාකටීකරණං තප්පාකටීකරණං'
තස්මිං තප්පාකටීකරණෙ—තස්ස, ඔහුගේ; පාකටීකරණං,
ප්‍රකටකිරීම; තප්පාකටීකරණං, තප්පාකටීකරණ නම්—**ධාතු
කථා ටීකාවෙහි** "දුතියනයුද්දෙස සඞ්ඛෙපිත විසිඃසඞ්ගහිත
ධම්මනිස්සිතං පුච්ඡා විස්සජ්ජන නයුද්දෙසං වත්වා එසන
යො තතියාදීසු දසමාවසානෙසු නයුද්දෙසෙසු අණුවිජ්ජෙ
සු'' යන මෙයද අප්‍රකටනම්—"තෙසුපි හි වුත්තනයෙන විහි
පදෙහි පුච්ඡිතබ්බ ධම්මවිසෙස නිද්ධාරණං වත්වා තත්ථ තත්ථ
අනත්මපදසදිසෙන ලද්ධනිද්දිසෙන තත්‍යපදෙන පුච්ඡන
විස්සජ්ජනනයා උද්දිට්ඨා'' යනු තත්පාකටීකරණනම්—මෙහි
හිශබ්දයතෙම තත්පාකටී කරණ ද්‍යොතකනාම් වේ—"වි
සෙසයති සාමඤ්ඤතො ව්‍යවච්ඡින්දතීති විසෙසො'' තස්මිං
විසෙසෙ—විසෙසයති යී සේයි, සාමඤ්ඤතො, සාමාන්‍යයෙ
න්; ව්‍යවච්ඡින්දති ඉති, සිඳිනුයි; විසෙසො, විසෙසනම්—"දා
නංනාම දාතබ්බං සීලං රක්ඛිතබ්බං මෙත්තාදිභාවනා ච භා
වෙතබ්බා'' යන පූර්වවචනය සාමාන්‍යනම්—"තෙසු හි සීලදා
නතො ච භාවනා වරතරා'' යන මේ පශ්චිම වචනය විශෙ
ෂනම්—මෙහි හිශබ්දයතෙම විශෙෂද්‍යොතකනම්—"පච්ච
නියත්වචන මුඛුගන්ත්වා තදනුලොමෙන අයති ගච්ඡති
පවත්තතීති අන්වයං'' තස්මිං අන්වයෙ—පච්චයනියත්වච
නං, පච්චනීයාර්ථ වචනය; අනුගන්ත්වා අනුවගොස්; තදනු
ලොමෙන, එයට සුදුසුපරිද්දෙන්; අයති යී සේයි, ගච්ඡති
යී සේයි, පවත්තති ඉති, පවතිනුයි; අන්වයං, අන්වයනම් (හේ
අර්ථයටපැමිණි වචනයි)"නවා සමා සිරොවා පි ගමනා මය්හං
ච රජ්ජති අන්තරායොපි මෙ අස්ස''යනු පච්චනීයාර්ථ වචනයි-

නාහෙතා යාච යොගීනං අන්තරායස්ස කාරියා
ඉස්සියො මන්ති ජානන්ති සප්පගණ්ඩන්ති වා මතො

යනු එයට අනුලොමවශයෙන් අර්ථයට පැමිණි වචනය
අන්වයනම්—කාරකනාමයෙහි වනාහි "පරමත්ථවසෙන ස
ද්දප්පයොගො'' යන මෙය පච්චනීයාර්ථ වචනනම් වේ—
"ලොකසඞ්කෙතන සිද්ධො හි සද්දප්පයොගො'' යන මේ එයට
අනුලොමවශයෙන් අර්ථයට පැමිණි වචනය අන්වයනම් වේ—

---

8 වාක්‍යාරම්භෙ කාරණෙ ච, එලෙවෙව විසෙසනෙ
තප්පාකටි කරණෙ ච, දළ්හියම්හි පක්ඛන්තරෙ
අභාවෙ බ්‍යතිරෙකෙ ච, වසද්දො පි පවත්තති.

---

මෙහි හිශබ්දය අභියද්‍යොතකනම්—"අනුලොමස්ස විරුද්ධ භාවෙන අන්තරෙන් අතික්කමම වතනතින් බ්‍යතිරෙකං" තස්මිං බ්‍යතිරෙකෙ—අනුලොමස්ස, අනුලොමයට; විරුද්ධභාවෙන, විරුද්ධභාවයෙන්;අන්තරෙනි සී සේයී, අතික්කමම, ඉක්මී; වතතති ඉති, පවතිනුයී; බ්‍යතිරෙකං, බ්‍යතිරෙකනම් (ශේෂ පච්චනීකවශයෙන්අර්ථයට පැමිණි වචනයි) "රතනත්තයං වන්දිත්වා තං වන්දනොසකහසාදි උපද්දවනිවාරණ සමත්ථා, නහි තං ඨපෙත්වා අඤ්ඤං සත්තුපටිසරණා අත්ථි" යන මෙය ව්‍යතිරෙකනම් වේ—**ධාතුකථා** **පිකාවෙහි** "තාහි අඤ්ඤාන අසම්මිස්සත්තා අසම්පයුත්තෙන අසම්මිස්සන්තී විඤ්ඤාණක්ඛන්ධාදි වදන්ති අත්ථො" යනු අනුලොමාර්ථ වචනනම්—"අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා පාණීපි හි සම්පයුත්තෙහි සම්මිස්ස විඤ්ඤාණාදිපදානි ඉධ ගහිතානි" යනු පච්චනීය වශයෙන් අර්ථයට පැමිණි වචනය ව්‍යතිරෙකනම්—මෙහි හිශබ්දය ව්‍යතිරෙක ද්‍යොතකනම් වේ)

(මෙසේ නවවැදෑරුම්වූ හිශබ්දාර්ථය දක්වා දැන් වශබ්දයාගේ අර්ථය දක්වන්නේ "**වාක්‍යාරම්භෙ එලෙව**" යන ආදිය කිය)

8 ව සද්දො අපි, වශබ්දයතෙමේද; වාක්‍යාරම්භෙ, වාක්‍යාරම්භයෙහිද; කාරණෙච, කාරණයෙහිද; එලෙව එව, ඒලයෙහිද; විසෙසනෙ, විශෙෂයෙහිද; තප්පාකටිකරණෙච, තත් ප්‍රකටකිරීම්අර්ථයෙහිද; දළ්හියම්හි, දෘඪාර්ථයෙහිද; පක්ඛන්තරෙ, පක්ෂාන්තරයෙහිද; අභාවෙ, අභාවයෙහිද; බ්‍යතිරෙකෙච, ව්‍යතිරෙකයෙහිද; පවත්තති, පවතී.

("පඨම මහාසඞ්ගීති ච නාමෙසා—පෙ—වෙදිතබ්බා" යන මෙහි වශබ්දය වාක්‍යාරම්භද්‍යොතකනම්—විනයෙහි වනාහි "සම්පටිපන්නො භික්ඛු සීලසම්පදං නිස්සාය තිස්සො විජ්ජා පාපුණාති තාසං යෙවච තප්පභෙදවචනතො" යනු කාරණය වේ—මෙහි වශබ්දය කාරණ ද්‍යොතකනම්—මෙහිද පාළියෙහි "නිජ්ඣිත්වා අපිසජ්ජිතානම්පි සන්නිපටඨානාදිකං නිජ්ඣිත්වා ගහණං කරොන්තො තෙසං නිජ්ඣිත්වාව විසජ්ජෙතබ්බ

———※○※———

9 වාක්‍යාරම්භෙ විසෙසෙච, හෙතු ඵලෙසු අන්වයෙ
දළ්හී තප්පාකටිකාරෙ * බ්‍යතිරෙකෙ පක්ඛන්තරෙ
සම්භාවනෙ ගරහෙච, පනසද්දො පකාසිතො—

---

තං දසෙසති" යන මෙහි වශබ්දය ඵලද්‍යොතකනම්—"පඤ්ච
ඛන්ධානි ආදීහි රූපක්ඛන්ධානි පදානි දස්සිතානි" යනු
සාමාන්‍යය වේ—"පටිච්චසමුප්පාදවචනෙනච යෙසු වාදෙස
සු අභෙදසු පච්චකං පටිච්චසමුප්පාදසද්දො වදන්ති තද
ත්‍ථානි වාදසපදානි දස්සිතානි" යනු විශේෂය වේ—මෙහි ව
ශබ්දය විශේෂද්‍යොතකනම්—"නහි රූපස්ස රූපෙන නිබ්බා
ණේන වා නිබ්බාණස්ස වා රූපෙන" යනු අප්‍රකටය වේ—
"යොචායං විප්පයොගො අනාරම්මණස්ස අනාරම්මණ විස්ස
කස්සච නහොති" යනු තත්ප්‍රාකටිකරණය වේ—මෙහි වශ
බ්දය තත්ප්‍රාකටීකරණ ද්‍යොතකනම්—"සාතස්සුඛං වා කායි
කා චෙතසිකස්සුඛං සන්තං සුඛං උපෙක්ඛා සුඛං" යන සවච
නය දළ්හිය වේ—"තථා චාහු උපෙක්ඛා පන සන්තත්තා සු
ඛමිච්චෙවුත්ත" යනුද දළ්හීකරණය වේ—මෙහි වශබ්දය දළ්හි
ය ද්‍යොතකනම්—"වචීරාමස්ස සඞ්ඛාරොති කම්මපථො සාමි
චචිකා" යනු එක් පක්ෂයෙක් වේ—"විතක්කං සඞ්ඛාරොති ච න
ත්ථ අත්‍ථෙසවා" යනු පක්ෂාන්තරය වේ—මෙහි වශබ්දය ප
ක්ෂාන්තර ද්‍යොතකනම්—"අත්‍ථසද්දො චෙත්‍ථ න ධම්මවාචකො
හෙතු ඵලාදිවාචකො අත්‍ථො දළ්හියත්‍ථ වාචකො" යනු
අන්වය වේ—මෙහි වශබ්දය අන්වයද්‍යොතකනම්—"යථාච රූප
පදස්ස ඛන්ධත්‍ථෙදෙසො ඛන්ධපදස්ස ච ඛන්ධසමුදායෙක දෙ
සො තන්නිස්සිතො යථාධිප්පෙතො අඤ්ඤො එකෙකපදස්ස
යථාධිප්පෙතත්‍ථාභාවතොති අධිප්පායො" යනු ව්‍යතිරෙක
ය වූ—මෙහි වශබ්දය ව්‍යතිරෙකද්‍යොතකනම් වේ)

(මෙසේ වශබ්දයාගේ අර්ථ දක්වා දැන් පනශබ්දයාගේ අර්ථ
දක්වනුපිණිස 'වාක්‍යාරම්භෙ විසෙසෙ ච' යන ආදිය කීහ)

9 පනසද්දො, පනශබ්දයතෙම; වාක්‍යාරම්භෙ, වාක්‍යාරම්භ
යෙහිද; විසෙසෙච, විශේෂයෙහිද; හෙතුඵලෙසු, කාරණ
යෙහිහා ඵලයෙහිද; අන්වයෙ, අන්වයෙහිද; දළ්හිතප්පාකටී
කාරෙ, දළ්හියෙහිහා තත්ප්‍රාකටීකරණයෙහිද; බ්‍යතිරෙ

---

* තප්පාකටිකාරෙණෙ චාති පොත්කෙසු දිස්සති—

තෙ, ව්‍යතිරේකයෙහිද; පක්‍ෂාන්තරෙ, පක්‍ෂාන්තරයෙහිද; සම්භාවනෙ, පැසසීමෙහිද, ගරහෙච, ගර්හාකිරීමේහිද; (වැටෙයයි) පකාසිතො, ප්‍රකාශ කරණලද්දේය.

("සම්භාවියතෙ පසංසියතෙ ති සම්භාවනං" තස්මිං සම්භාවනෙ—සම්භාවීයතෙ යී සේයි,පසංසියතෙ ඉති,පසසනලැබේනුයී; සම්භාවනං, සම්භාවනනම්—'කාරුණිකො අවිහිංසං සත්තානං විහෙසමත්තම්පි න කරොති කො පන වාදො පාණාතිපාතෙ'' යන මේ ප්‍රශංසායී—මෙහි පන ශබ්දය සම්භාවන ද්‍යොතකනම්—"ගරහියතෙ නින්දියතෙති ගරහං" තස්මිං ගරහෙ—ගරහියතෙ යී සේයී, නින්දියතෙ ඉති, නින්දාකරණලැබේනුයී; ගරහං, ගරහනම්—"භගවතො පන පටිපක්ඛා රාගාදයොපිනසන්තිතෙ ජහිතබ්බා" යන මේ නින්දායී—මෙහි පනශබ්දය ගර්හාද්‍යොතකනම්—පූර්වපදයන්ගේ උදාහරණයෝම දක්වනුලැබෙත්- **ඛන්ධයමකටීකාවෙහි** 'කාලභෙද පන නෙත්‍ථ එවං වුත්තා' යනු ව්‍යාකරම්භයි-මෙහි පන ශබ්දය ව්‍යාකරම්භ ද්‍යොතකනම්—**එම ටීකාවෙහි** "යථා පන නිරුජ්ඣතීති වචනං සමුප්පන්නෙනපි උප්පාදක්ඛණසමඞ්ගිම්හි පවත්තති එවං උප්පජ්ජිත්‍ථාති වචනං පච්චුප්පන්නෙන පවත්තති අත්‍ථො උප්පජ්ජිත්‍වා විගතෙ අතීතෙ එව" යනු විශෙෂය වේ—මෙහි පන ශබ්දය විශෙෂ ද්‍යොතකනම්—**අනුසය යමක ටීකාවෙහි**"ධාතුත්තය වෙදනාත්තයතො පන අඤ්ඤං තුදනුසයට්ඨානං අත්‍ථි තස්මා තං න වුත්තං" යනු කාරණනම් වේ-මෙහි පන ශබ්දය කාරණ ද්‍යොතකනම්—**ධාතුකථා ටීකාවෙහි** "වික්ඛායතනෙන පන සඞ්ගහිතානි ඔළාරිකායතනානෙව" යනු ඵලනම් වේ—මෙහි පන ශබ්දය ඵලද්‍යොතකනම්— "සද්දත්‍ථතො පන කම්මභවො භවති එතස්මාති භවො ඉතරො භවති භවනංවාති භවො" යන **ධාතුකථා ටීකාවචනය** අන්වයනම්—මෙහි පනශබ්දය අන්වය ද්‍යොතකනම් වේ—**අනුසය යමකටීකාවෙහි** "අථකථා යං පන විස්ස වෙදනාසු ඉට්ඨාරම්මණතො දොමනස්සුප්පත්තිං වත්‍වා දොමනස්සමෙව වුත්තං හොති න පටිඝානුසයො ති වුත්තත්තා යථා තත්‍ථ පටිඝො පටිඝානුසයො නහොති එවං දුක්ඛාදීසු උප්පජ්ජමානෙන දිට්ඨානුසයෙන සහ ජාතො ලොභො කාමරාගානුසයො න නහොති චෙව විඤ්ඤායති" යන වචනය දල්විකා

10 සබ්බපෙනෙව පුබ්බන්තෝ, පච්ඡිමෙන විත්ථාරිතො
හිසද්දො ජෝතකො වුත්තො, සාඛාභඞ්ගසමාහිතො.

රණනම්—'අට්ඨකථායං පන' යන මෙහි පන ශබ්දය අලංකාරණ ද්‍යොතකනම් වේ—ආයතන සම්මෝහවිනෝදනී විභඞ්ගට්ඨකථාවෙහි සමුදයසභාවෙන පන ගහිත චක්ඛායතනං ද්වීලකානං සඞ්කපවිසජ්ජනකානං සදිස විස්සජ්ජනතා දස්සනභාවෙන කාරණත්ති සභායතන යමකෙන සදිසවිස්සජ්ජනතානි ආහ'' යන වචනය තත්පාකටී කරණනම්—මෙහි පන ශබ්දය තත්පාකටීකරණ ද්‍යොතකනම් වේ—''න පන රූපස්ස රූපෙන නිබ්බානේනවා නිබ්බානස්සවා රූපෙන කත්ථචි සම්පයොගො අත්ථි'' යන ධාතුකථා අනුටීකාවචනය ව්‍යතිරෙකනම්—මෙහි පනශබ්දය ව්‍යතිරෙක ද්‍යොතකනම් වේ—ධම්මසඞ්ගණීටීකාවෙහි ''තං විස්සජ්ජනස්ස පන පුරිමකොට්ඨාසෙන සදිසත්තාය පච්ඡා පඤ්හො තිච නාම වතතති'' යන වචනය පක්ෂාන්තරනම්—''වචනතෝ පන'' යන අට්ඨසාලිණී වචනයද පක්ෂාන්තරයයි දතයුතු—මෙහි පන ශබ්දය පක්ෂාන්තර ද්‍යොතකනම්)

(මෙසේ හි ච පන ශබ්දයන්ගේ අර්ථ දක්වා ඔවුන්ගේ තංත්ථද්‍යොතක ලක්ෂණයත් දක්වන්නේ ''සබ්බපෙනෙව පුබ්බන්තෝ'' යන ආදි තුදුස් ගාථාවන් කිය)

10 [3] පුබ්බන්තෝ, පූර්වාර්ධයතෙමේ; සබ්බපෙනඑව, සංක්ෂෙපයෙන්ම; (කියනලද්දේය) පච්ඡිමෙන, පශ්චිම වචනයෙන්; විත්ථාරිතො, විස්තරකරණලද්දේය, හිසද්දො, හිශබ්දයතෙම; ජෝතකො, (විස්තර) ද්‍යොතකයයි; වුත්තො, කියනලද්දේය; සාඛාභඞ්ගසමාහිතො, (මාගීපාශ්වයෙහි) කඩා තබනලද ව්‍යක්ෂශාඛාවක් සමාන වේ.

(මෙහි 'හි ච පන' ශබ්දයෝ විස්තාරද්‍යොතක වෙත්—ඔවුන් අතුරෙන් හි ශබ්දය බොහෝසෙයින් විස්තාරද්‍යොතක වේ අනික් ච පන ශබ්දයෝ ස්වල්පවශයෙන් විස්තාරද්‍යොතක වෙත්—''විත්ථාරියති පපඤ්චියති ති විත්ථාරිතො''--විත්ථාරීයති යි යෙහි; පපඤ්චියති ඉති, විස්තරකරණුලැබේනුයි; විත්ථාරිතො, විත්ථාරිතනම්—''හි ඉති සද්දො හි සද්දො'' හි ඉති, හි යන

සද්දෙ, ශබ්දයතෙම; හිසද්දෙ, හිසද්දනම්—"තදත්ථං ජොතෙතීති ජෝතකො" තදත්ථං, ඒ අර්ථය; ජොතෙති ඉති, ප්‍රකාශ කෙරේනුයි; ජොතකො, ජොතකනම්—"විත්ථාරස්ස ජොතකො විත්ථාරජොතකො" විත්ථාරස්ස, විස්තරයාගේ; ජොතකො, දෙඅතනය; විත්ථාරජොතකො, විත්ථාරජොතක නම්—මෙහි 'විත්ථාරජොතකො'යී කිවමනානන්හි ජඥෙතුරස්සණසප්‍රණිස ආදි විත්ථාරශබ්දයහට ලොප් කොට 'ජොතකො' යී කියන ලදී—'හදයවිතුං' යී කිවමනානන්හි ආදි ලොපවශයෙන් 'විතුං' යී කිවාක් මෙනි—මෙහි ඉතිශබ්දය සාඝුදෙතනකයි යේ ලුප්තනිර්දෘෂ්ටයි—"සමනනතො ආකාරියති පසාරියන්ති සාඛො" සමන්තතො, හාත්පසින්, ආකාරියති යී සේයි; පසාරියන්ති ඉති, ප්‍රසාරණයකරණලැබේනුයි; සාඛො, සාඛනම්(ඒ වෘක්ෂාවයවයි) මෙහි සං, ආපූර්ව 'කරපසාරණෙ' යන ධාතුහුගෙරෙන් චිසරුජාදි සූත්‍රයෙන් ණ ප්‍රත්‍යය කොට ණිකාරානුබන්ධය ලොප් කොට 'පුරසමුපපරිහි' යන ආදි සූත්‍රයෙන් කරයන ධාතුහට ඛ යන ආදෙශ කොට විභක්ත්‍යුත්පත්තිය කළ කල්හි රූපසිද්ධි වේ—'සාඛ' ශබ්දය පුල්ලිඞ්ගයෙහිද ස්ත්‍රීලිඞ්ගයෙහිද වැටේ—"භඤ්ජියන්ති භඞ්ගා" භඤ්ජියන්ති ඉති, බිඳිනුලැබේනුයි; භඞ්ගා, භඞ්ගනම්—"සාඛො එව භඞ්ගං සාඛාභඞ්ගා" සාඛො එව, අත්තම; භඞ්ගා, භඞ්ගවූයේ; සාඛාභඞ්ගා, සාඛාභඞ්ගනම්—'සාඛභඞ්ගා' යී කිවමනානන්හි මධ්‍යයෙහි දීර්ඝ කොට 'සාඛාභඞ්ගා' යී කියනලදී—"මග්ගසම්පෙ ආහිතො ඨපිතො සමාහිතො" මග්ගසමීපෙ, මාර්ග සමීපයෙහි; ආහිතො යී සේයි; ඨපිතො, තබනලද්දේ; සමාහිතො, සමාහිතනම්—"සාඛාභඞ්ගා එව සමාහිතො සාඛාභඞ්ගසමාහිතො" සාඛාභඞ්ගා එව, සාඛාභඞ්ගයම; සමාහිතො, සමාහිතවූයේ; සාඛාභඞ්ගසමාහිතො, සාඛාභඞ්ගසමාහිතනම්—**හි ච පන** යන ආදි නිපාත ශබ්දයෝ මාර්ගපාර්ශ්වයෙහි තබනලද වෘක්ෂශාඛාවන් වැන්නාහ යම්සේ මංමුළාවූ යාත්‍රාමාර්ග නොදන්නාවූ එකෙකුට සලකුණුකිරීම පිණිස මාර්ගසමීපයෙහි කොලඅතුහෝ තල්පත් ආදියහෝ කඩා තබනලද්දාහුද ඒ දැක මේ යායුතුමාර්ගයයි ඒ සලකුණෙන් මුළාවූයේ දන්නේ සැපසේ යේද එසේම පශ්චිමවච නයාගේ අර්ථයෙහි මුළාවූද නොදන්නාවූද තැනැත්තේ

———※0※———

11 පුබ්බෙ වුත්තස්ස වත්ථස්ස, චොදනාපි සියා පුන
යං පරං වත්තුකාමස්ස, වාක්‍යාරම්භොහොති භාසිතො—

12 එලෙව පඨමං වුත්තෙන, කිදිසං තස්ස කාරණං
පුච්ඡිතො කථනං තස්ස, පච්ඡිමං කාරණං භවෙ—

---

සාධාභාඞිඹ සමානවූ '**හි ච පන**' යන ආදි ශබ්දයන් දැක මේ මෙහි අර්ථයයි ඒ අර්ථය සැපසේ දනී—මේ මෙහි උපමාසංඥන යයි – මේ ගාථාවෙන් විස්තරලක්‍ෂණය දක්වනලදැයි දතයුතු)

11 පුබ්බෙ, පූර්වයෙහි; වුත්තස්ස එව, (යම් කිසිවකු විසින්) කියනලද්දාවූම; අත්ථස්ස, (යම් කිසි) අර්ථයක්හුගේ; චොදනාඅපි, චොදනාවෙක්ද; සියා, වන්නීය; පුන, නැවත; වත්තුකාමස්ස, කියනුකැමැත්තහුගේ; පරං, අනාගතවූ; යං, යම් වචනයෙක් වේද;(එය) වාක්‍යාරම්භො ඉති, වාක්‍යාරම්භයයි; භාසිතො, කියනලද්දේය—

('**හි ච පන**' ශබ්දයෝ වාක්‍යාරම්භ ද්‍යොතක නම් වෙත් ඔවුන් අතුරෙන් **ච** ශබ්දය බොහෝසෙයින් වාක්‍යාරම්භ ද්‍යොතක වේ—අනික් **හි පන** ශබ්දයෝ මදවශයෙන් වාක්‍යාරම්භද්‍යොතක වෙත්—'වුත්තස්ස වත්ථස්ස' යනා මෙහි 'වුත්තස්ස එව' යී පදච්ඡෙද කළකල්හි '**සරෙ සරෙ ලොපං**'යන සූත්‍රයෙන් පූර්වස්වරලොපය පැමිණිකල්හි 'පඨමං ලභූ සබ්බත්ථ' යී කියනලදහෙයින් ඡන්දානුරක්‍ෂණයපිණිස අකාරලොපය නොකොට '**වා පරො අසරූපා**' යන සූත්‍රයෙන් එකාරයාගේ ලොප් කරණලද්දේය—'අරියතෙ ඤායතෙති අත්ථො' තස්ස අත්ථස්ස—අරියතෙ යී සේයි; ඤායතෙ ඉති, දන්නාලැබේනුයි; අත්ථො, අත්ථනම්—''චුදියතෙ පුච්ඡියතෙති චොදනා'' චුදියතෙ යී සේයි; පුච්ඡියතෙ ඉති, විචාරණුලැබේනුයි; චොදනා, චොදනානම්—මේ ගාථාවෙන් වාක්‍යාරම්භලක්‍ෂණය දක්වනලදි)

12 ච අන්‍ත්පක්‍ෂයක්නියම්; එලෙ, එලෙස; පඨමං, පළමු කොට; වුත්තෙන, කීකල්හි; තස්ස, ඒ අර්ථයාගේ; කාරණං, කාරණය; කිදිසං, කෙබඳුදැයි? පුච්ඡිතො, විචාරිමහෙතු කොට ශෙණ;

13 පුබ්බෙච කාරණෙ වුත්තෙ, එතංච කිමත්ථං ඉති
පුච්ඡිත්වා කථනං තස්ස, පච්ඡිමං ඵලභාසනං.

---

තස්ස, ඒ ඵලයාගේ; පච්ඡිමං, පසුව කියනලද; කථනං, වචනය; කාරණං භවෙ, කාරණ නම් වන්නේය.

(**හි ච පන** ශබ්දයෝ කාරණද්‍යොතක නම් වෙත්--ඔවුන් අතුරෙන් **හි** ශබ්දය බොහෝ සෙයින් කාරණද්‍යොතක නම් වේ-අන්‍ය **ච පන** ශබ්දයෝ දෙදෙන විකල්පවශයෙන් කාරණද්‍යොතක වෙත්-ඵලෙච යන මෙහි චශබ්දය පක්ෂාන්තරද්‍යොතකයි-"පුථුනො පුරා භූයතෙති පඨමො" තං පඨමං--පුථුනො සී සේයි, පුරා, පෙර; භූයතෙ ඉති, වීමනුයි; පඨමො, පඨම නම්—මෙහි පුථුශබ්දයාකෙරෙන් "**පුථස්ස පුථුපඨාමොවා**" යන සූත්‍රයෙන් අමප්‍රත්‍යය කොට පුථුශබ්දයහට පථ යන ආදෙශය කොට නැවත ථකාරයහට ඨකාර කොට 'පඨමො' සී රූපසිද්ධි වේ—"කිං විය දිස්සන්ති කිදිසං" කිං විය, කුමක් මෙන්; දිස්සන්ති ඉති, දකිනු ලැබේනුයි; කිද්දිසං, කිදිසනම්—එහි රූපසිද්ධිය බාලාවතාරාදියෙන් දතයුතු—'පුච්ඡිත්වා' යන මෙහි හෙත්වර්ථයෙහි ත්වා ප්‍රත්‍යය වේ—"පුබ්බා පර සමානෙව කාලෙ හෙතුම්හි ත්වාදයො" යී කියනලදහෙයිනි—"කථියතෙ වුච්චතෙති කථනං" කථියතෙ සී සේයි, වුච්චතෙ ඉති, කියනුලැබේනුයි; කථනං, කථනනම්--මේ ගාථාවෙන් කාරණලක්ෂණය දක්වනලදී)

13 **ච**, අනිස්පක්ෂයක්තියම්; කාරණෙ, කාරණයවූ; වුත්තෙ, කියනලද; පුබ්බෙ, පූර්වවාක්‍යය ඇතිකල්හි; පච්ඡිමං කථනං, පශ්චිම වචනය; එතංච, මේ කාරණයද; කිමත්ථං ඉති, කුමක් ප්‍රයොජනකොට ඇත්තේදැයි? තස්ස, ඒ ඵලයාගේ; පුච්ඡිත්වා, විචාරිමහෙතුකොටගෙණ; ඵලභාසනං, ඵලභාෂණ නම් වේ.

(**හි ච පන** ශබ්දයෝ ඵලද්‍යොතකනම් වෙත්—ඔවුන්අතුරෙන් **ච** ශබ්දය බොහෝසෙයින් ඵලද්‍යොතකනම් වේ—අනික් **හි පන** ශබ්දයෝ මඳවශයෙන් ඵලද්‍යොතකනම් වෙත්-"පුරය ති පුරෙ භවතිති පුබ්බො" තස්මිං පුබ්බෙ—පුරයති සී සේයි, පුරෙ, පෙර; භවති ඉති. වේනුයි; පුබ්බො, පුබ්බනම්—මෙහි වාක්‍ය ශබ්දය අපෙක්ෂා කොට පුබ්බශබ්දය නපුංසක ලිංගික

14 සාමඤ්ඤෙනෙව පුබ්බත්ථෙ, භෙදනං යත්ථ තස්සහි
විසෙස වචනං තං හි, ජොතකාව නිපාතකා—

වේ—මෙහි 'පූරෙ භවති' යන අර්ථයෙහි පූරෙශබ්දයා කෙරෙන් ණ්‍යප්‍රත්‍යය කොට ණකාර ලොප් කොට 'භූතොඛ්බ' යන සූත්‍රයෙහි බ්බ යන යොගවිභාගයෙන් හෝ 'වජා දිහි' යන ආදි සූත්‍රයෙන්හෝ රකාරයහා යප්‍රත්‍යයහට බ්බ යන ආදෙශ කොට රූපසිද්ධි වේ—'පුබ්බ' යන මෙහි වශබ්දය පදාන්තර ද්‍යොතනයයි—'එතඤ්ච' යන මෙහි චශබ්දය වොදනාද්‍යොතකයි—"කථියතෙ අනෙන වචනෙනාති කථනං" අනෙන වචනෙන, මේ වචනයකරණකොටගෙණ; කථී යතෙ ඉති, කියනුලැබේනුයි; කථනං, කථනනම්—"ඵලං භාසති එත්ථ කථෙතිති ඵලභාසනං" එත්ථ, මෙහි; ඵලං, ඵලය; භාසතියි සේයි, කථෙති ඉති, කියානුයි; ඵලභාසනං, ඵලභාසනනම්—මේ ගාථාවෙන් ඵලලක්ෂණය දක්වන ලදී)

14 පුබ්බත්ථෙ, පූර්වාක්‍යයාගේ අර්ථය; සාමඤ්ඤෙන එව, සාමාන්‍යයෙන්ම; (කිහල්හි) තස්සහි, ඒ සාමාන්‍යයාගේ වනාහි; භෙදනං, වෙසෙසා කිම; යත්ථ, යම් වාක්‍යයෙක්හි වේද; තං හි, ඒ වාක්‍යය; විසෙස වචනං, විශෙෂවචන නම් වේ; නිපාතා, (හි ච පන සඞ්ඛ්‍යාත) නිපාතයෝ; ජොතකා එව, (විශෙෂ) ද්‍යොතකම වෙත්—

("අක්ඛුමක්ඛුහි සමං නියතෙ ඤායතෙනි සමානං" අක්ඛුමක්ඛුහිසමං, ඔවුනොවුන්හා සමග; නියතෙයි සේයි, ඤායතෙ ඉති, දන්නාලැබේනුයි; සමානං, සමානනම්—මෙහි සමං ශබ්දොපපද 'නී ඤාණෙ' යන ධාතුනුකෙරෙන් අප්‍රත්‍යයද නිගෘහීත ලොපයද මධ්‍යයෙහි දීර්ඝද කොට රූපසිද්ධි වේ-"අක්ඛුමක්ඛුහි සහ වා මඤ්ඤතෙ ඤායතෙති සමානං" මෙහි අර්ථ සුබොධයි—මේ පක්ෂයෙහි සහ ශබ්දොපපද 'මන ඤාණෙ' යන ධාතුහුකෙරෙන් අප්‍රත්‍යයද මහා නිරුක්ති සූත්‍රයෙන් සහ ශබ්දයහට සකාරද මකාරාන්තයහට දීර්ඝද කොට රූපසිද්ධි වේ—(සමානනම් අභෙද,ර්ථ වචනයි) "සමානස්ස භාවං සාමඤ්ඤං" මෙතන සාමඤ්ඤන—සමානස්ස,

15 පුබ්බෙ අපාකටෙ යෙව, උපමාදිහි යම්පන
පාකටීකරණං තප්පා, කටීකරණ නාමකං

සමානයාගේ; භාවං, වීම; සාමඤ්ඤං, සාමඤ්ඤනම්—මෙහි එවශබ්දය සන්නිට්ඨානාවධාරණාර්ථයි—''පුබ්බං වාක්‍යං පුබ්බං'' පුබ්බං වාක්‍යං, පූර්ව වාක්‍යය; පුබ්බං, පුබ්බනම්—මෙහි උත්තරපදලෝපයි—''පුබ්බස්ස අත්ථො පුබ්බත්ථො'' තස්මිං පුබ්බත්ථෙ—පුබ්බස්ස, පූර්වවාක්‍යයාගේ; අත්ථො, අර්ථයතෙම; පුබ්බත්ථො, පුබ්බත්ථනම්—''භිජ්ජියතෙ සාමඤ්ඤතො විසෙසියතෙ අත්ථො අනෙනාති භෙදනං'' අනෙන, මේ කරණකොටගෙණ; අත්ථො, අර්ථයතෙම; භිජ්ජියතෙ යී සේයී; සාමඤ්ඤතො, සාමාන්‍යයෙන්; විසෙසියතෙ ඉති, ශවසෙසනු ලැබේනුයි, භෙදනං, භෙදනනම්—'තස්සහි' යන මෙහි හිශබ්දය පනශබ්දාර්ථයි—''විසෙසස්ස වචනං විසෙස වචනං'' විසෙසස්ස, විශෙෂයාගේ; වචනං, වචනය; විසෙසවචනං, විසෙසවචනනම්—දෙවන හිශබ්දය පදපූරණයෙහි වැටේ—''ජොතෙන්ති එතෙහීති ජොතකා'' එතෙහි, මොවුන් කරණකොටගෙණ; ජොතෙනි ඉති, ප්‍රකාශ කෙරේනුයි; ජොතකා, ජොතකනම් වෙත්—එවශබ්දය අවධාරණාර්ථයි—''නිපාතා එව නිපාතකා'' නිපාතාඑව, නිපාතයෝම; නිපාතකා, නිපාතකනම් වෙත්—මෙහි ස්වාර්ථයෙහි කප්‍රත්‍යය වී—මේ ගාථාවෙන් විශෙෂලක්ෂණය දක්වනලදි)

15 පුබ්බෙ, පූර්වවාක්‍යයෙහි කියනලද අර්ථය; අපාකටෙ එව, අප්‍රකටකල්හිම; උපමාදිහි, උපමානාදියෙන්; යං පාකටීකරණං පන, (ඒ පූර්වවාක්‍යයෙහි කියනලද අර්ථයාගේ) යම් ප්‍රකටකිරීමෙක් වනාහි වේද; තප්පාකටීකරණ නාමකං, (ඒ) තප්පාකටිකරණනම් වේ—

('හි **ච පන**' ශබ්දයෝ තප්පාකටීකරණ ද්‍යොතකනම් වෙත්—ඔවුන් අතුරෙන් **ච**ශබ්දය බොහෝසෙයින් තප්පාකටීකරණ ද්‍යොතක වේ—අනික් හි **පන** ශබ්දයෝ දෙදෙන ස්වල්පවශයෙන් තප්පාකටීකරණ ද්‍යොතක වෙත්—''පච්චක්ඛං කරොන්ති ඤාණස්ස අපාථං ගච්ඡන්තීති පාකටො'' පච්චක්ඛං කරොන්තීයී සේයී, ඤාණස්ස, ඥානයාගේ; අපාථං, හමුවී

16 දළ්හියවචනෙ වුත්තෙන, ඔපිතත්ත ආගමෙනච
දළ්හීකරණි මෙතස්ස, පච්ඡිමං දළ්හීකරණං.

මට; ගච්ඡති ඉති, යේනුයී; පාකටො, පාකටනම්—මෙහි ප යන උපසර්ගය ප්‍රත්‍යක්ෂාර්ථවාචකයී—'කර ආපාථගතියං' යන ධාතූන්ගෙන් රන් තප්‍රත්‍යය කොට ඕහට ටකාර කොට රූපසිද්ධ වේ—"න පාකටො අපාකටො" තස්මිං අපාකටෙ—න පාකටො, ප්‍රකට නොවන්නේ; අපාකටො, අපාකටනම්—එවශබ්දය සන්නිට්ඨානාවධාරණාර්ථයි—"උපෙච්ච සඤ්සතානං උපනෙත්වා මඤ්ඤති ජානාති එතෙනාති උමානං" උපෙච්චයී සේයී, සඤ්සතානං, සඤ්ශබ්දවට; උපනෙත්වා, පමුණුවා; මඤ්ඤතියී සේයී, එතෙන, මේ කරණකොටගෙණ; ජානාති ඉති, දනීනුයි; උපමානං, උපමානනම්—(ඒප්‍රකටාර්ථවචනයි) 'උපමානං ආදි යෙසං තෙ උපමාදයො" තෙනි උපමාදිහි—උපමානං, උපමානය; ආදි, ආදිවූයේ; යෙසං, යම්කෙනෙකුන්ටදී තෙ, ඔව්හු; උපමාදයො, උපමාදිහුනම් වෙත්—මෙහි 'උපමානාදිහි' යී ⁿකිචමනානත්හි ජපෙද්, තුරක්ෂණය පිණිස නකාර ලොපය කොට 'උපමාදීහි' යි කියනලදී)

16 දළ්හියවචනෙ, දළ්හියවචනය, හෙවත් දෘඪතුවුවනු දෘඪකටයුතුය යන වචනය; වුත්තෙන, කිකල්හි; ඔපිතත්ත, සූක්ති සඞ්ඛ්‍යාත අට්ඨකථාදි සංවණ්ණනාවෙන්ද; ආගමෙන, ආගමසඞ්ඛ්‍යාත බුද්ධාදීන්ගේ පාඨයෙන්ද; එතස්ස, මේ දළ්හියවචනයාගේ; දළ්හීකරණං, දෘඪකරන්නාවූ; පච්ඡිමං, පශ්චිම වචනය; දළ්හීකරණං, දළ්හීකරණනම් වේ—

(**හි ච පන** ශබ්දයෝ දෘඪාර්ථද්‍යොතක වෙත් ඔවුන් අතුරෙන් චශබ්දය බොහෝසෙයින් දෘඪාර්ථද්‍යොතක වේ—අන්‍යත් හි පන ශබ්දයෝ දෙදෙන මදවශයෙන් දෘඪාර්ථ ද්‍යොතක වෙත්—"අදළ්හං දළ්හං කාතබ්බන්ති දළ්හියං" අදළ්හං, දෘඪනුවූවනු, දළ්හං කාතබ්බං ඉති, දෘඪ කටයුත්තේයයි; දළ්හියං, දළ්හියනම්—"වුච්චති එති වචනං" වුච්චති ඉති, කියනුලැබේනුයි වචනං, වචනනම්—"දළ්හියස්ස තං වචනඤ්චාති දළ්හිය වචනං" තස්මිං දළ්හිය වචනෙ—දළ්හියංච තං, දළ්හියවූයේද යේතෙමේය; වචනංච ඉති, වචනවූයේ

——❋○❋——

17 බුද්ධාදීනඤ්හි පාඨේන, වුත්තං ආගම දල්හිකං *
කාරණානා විරෝධේන, වුත්තං තං යුත්ති දල්හිකං †

---

ද හේතෙමේනුයි; දල්හියවචනං,දල්හිය වචනනම්—මේ ත්‍ය
විලක්ෂණයෙහි සප්තමියි--'වුච්චිත්ථාහි වුත්තං' තස්මිං වුතෙත-
වුච්චිත්‍ථ ඉති, කියනුලැබිනුයි; වුත්තං, වුත්තනම්—''අවගා
හෙත්වා පාළියාදිසු අනුපවිසිත්වා ඨයනිති ඔචිතානි'' තාය ඔ
චිතය—අවගාහෙත්වායි සේයි, පාළියාදිසු, පෙළආදියෙහි; අනු
පවිසිත්වා, අනුවවැද; ඨයති ඉති, රැස්කරණු ලැබේනුයි; ඔචි
තානි, ඔචිතානිනම්—(ඒ සූක්තිසඞ්ඛ්‍යාත අර්ථකථාදි සංවණ්ණ
නායි) ♣තොශණාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් තා වචනය
හට අ යන ආදෙශ කොට යකාර කොට තකාර විසංයොග
කොට රූපසිඞ්ඩි වේ—''තං නිස්සය ආගම්යති පාපුණීයනීති
ආගමො'' නෙත ආගමෙන—තං නිස්සාය, ඒ නිසා; ආගමීය
තියි සේයි, පාපුණීයති ඉති, පැමිණෙනුලැබේනුයි; ආගමො,
ආගමනම්—''අදල්හං දල්හං කරොතීති දල්හීකරණං'' අද
ල්හං, දැඩිනුවූවනු; දළ්හං කරෙනි ඉන්, දැඩි කෙරේනුයි; දල්හී
කරණං, දල්හීකරණනම්)

17 බුද්ධාදීනංහි, බුද්ධාදීන්ගේ වනාහි; පාඨේන, පාඨයෙන්;
ආගමදල්හිකං, ආගමදල්හීකරණය: වුත්තං, කියනලද්දේය;
කාරණානං අවිරොධෙන, බුද්ධවචනාදීන්ට අවිරුද්ධවූ අර්ථක
ථාදී වචනයෙන්; තං යුත්තිදල්හිකං, ඒ යුක්ති දල්හීකරණය;
වුත්තං, කියනලද්දේය

(''බුද්ධා ආදි යෙසං මහාසාවකානං තෙ බුද්ධාදයො'' ඉත
සං බුද්ධාදීනා—බුද්ධො, සර්වඥතෙම; ආදි, ආදිවූයේ; යෙසං ම
හාසාවකානං, යම් මහාශ්‍රාවකකෙණකුන්ටද; තෙ, ඔව්හු;
බුද්ධාදයො,බුද්ධාදීනුනම් වෙත්·''පඨියති උච්චාරියතීති පාඨො''
නෙන පාඨේන—පඨියතීයි සේයි, උච්චාරියති ඉති, කියනු
ලැබේනුයි; පාඨො, පාඨනම්—(ගේ අර්ථඥාපක අක්ෂරප්‍රබන්ධ
යි)ගේ පාළිපාඨය අර්ථකථාදි සංවණ්ණනා පාඨයයි විවිධයි—
ඔවුන් අතුරෙන් මෙහි පාළිපාඨය කැමැතිවනලදී) ''ආගමෙ
න දළ්හං කරොති එතෙනාති ආගමදල්හිකං'' එතෙන. මේ

---

* 'ආගමදල්හිය' ත්‍යපි පාඨො, † 'යුත්තිනාමක' ත්‍යපි පාඨො

18 සභාව බ්‍යතිරේකානං, වසෙනාපි චතුබ්බිධං
පුබ්බං අත්ථානුලොමෙන, පරන්තු විපරීතකං.—

කරණකොටගෙණ; ආගමෙන, ආගමයෙන්; දළ්හං කරොති ඉති, දැඩි කෙරේනුයී; ආගමදළ්හිකං, ආගමදළ්හිකනම්; (යෝ පශ්චිම වචනයි) දළ්හශබ්දෙ,පපද කර යන ධාතුහුකෙරෙන් ඛිප්‍රත්‍යය කොට කරධාතුහුගේ අන්‍තරකාරයද ඛිප්‍රත්‍යය ද ලොප් කොට 'දළ්හක' කියා සිටිකල්හි "**සඨාගම ඉකාරෙ**" යන සූත්‍රයෙන් දළ්හශබ්දයාකෙරෙන් ඉකාරාගමද අකාර ලොපයද කොට සිව්භක්තියගේ උත්පත්‍යාදිය කළකල්හි රූපය වේ—"ආගමෙන දළ්හිකං ආගම දළ්හිකං" යී තත්පුරුෂ සමාසයෙහි කටයුතු—'යුත්තිදළ්හිකං' යන මෙහිද මෙම ක්‍රමයයි—"කරොන්ති අට්ඨකථාදයො සංවණ්ණනා එතෙනාති කාරණං" තෙසං කාරණානං—එතෙන, මේ කරණකොටගෙණ; අට්ඨකථාදයො, අට්ඨකථාදීහු; සංවණ්ණනා, සංවණ්ණනාවක්; කරොන්ති ඉති, කෙරෙත්නුයී; කාරණං, කාරණනම්වේ (යෝ බුද්ධාදීන්ගේ වචනපාඨයි) "විරුජ්ඣනා පටිලොමෙන වත්තනං විරොධො" විරුජ්ඣනංයී සේයී, පටිලොමෙන, ප්‍රතිලොමයෙන්; වත්තනං, පැවැත්ම; විරොධො, විරොධනම්—"න විරොධො අවිරොධො" තෙන අවිරොධෙන—න විරොධො, විරොධ නොවන්නේ; අවිරොධො, අවිරොධනම්—"බුද්ධාදි වචනෙහි යුජ්ජතීති යුත්ති" බුද්ධාදිවචනෙහි, බුද්ධාදීන්ගේ වචනයන්හා; යුජ්ජති ඉති, යෙදේනුයී; යුත්ති, යුක්තිනම් (යෝ අට්ඨකථාදි සංවණ්ණනායී) "යුත්තියා දළ්හිකං යුත්තිදළ්හිකං" යුත්තියා, යුක්තියෙන්; දළ්හිකං, දැඩිකරන්නේ යුත්තිදළ්හිකං, යුත්තිදළ්හිකනම්)

(මෙසේ ආගම යුක්තිවශයෙන් ද්විප්‍රකාර දළ්හීකරණය දක්වා නැවත ද්විප්‍රකාරවූ එකක් එකක්හුගේ ද්විප්‍රකාර ප්‍රභෙදය දක්වන්නේ "සභාව බ්‍යතිරේකානං" යන ආදි ගාථාව කීය)

18 සභාවබ්‍යතිරෙකානං,ස්වභාව ව්‍යතිරෙකයන්ගේ; වසෙන අපි, වශයෙන්ද; චතුබ්බිධං, සිව්වැදෑරුම් වේ; පුබ්බං, පූර්වවූ ස්වභාව දළ්හීකරණයතෙම; අත්ථානුලොමෙන, (පූර්වවචනයාගේ) අර්ථයට අවිරුද්ධපරිච්ඡෙදෙන් වේ; පරංතු, අනික් ව්‍යතිරෙක දළ්හීකරණයවනාහි; විපරීතකං, එයින් විපරීත වූයේ වේ.—

("සභාවො අවිපරිතො භාවො අඤ්ඤො සභාවො" සභාවො
යි සේයි; අවිපරිතො, විපරිතනුවූ; භාවො යි සේයි; අඤ්ඤො,
අන්‍යතෙම; සභාවො, සභාවනම්—"ව් අතිරෙකො අවිපරි
තො අඤ්ඤො බ්‍යතිරෙකො" වි අතිරෙකො, යි සේයි; අවිප
රිතො, විපරිතනුවූ; අඤ්ඤො, අන්‍යතෙම; බ්‍යතිරෙකො, බ්‍ය
තිරෙකනම්—"සභාවොච බ්‍යතිරෙකොච සභාවබ්‍යතිරෙ
කා" සභාවොච, සවභාවද; බ්‍යතිරෙකොච, ව්‍යතිරෙකයද;
සභාවබ්‍යතිරෙකා, සභාවබ්‍යතිරෙක නම් වෙත්—"සභාව
බ්‍යතිරෙකා එතෙසං වචනප්පකාරානං අත්ථීති සභාව බ්‍යති
රෙකා" තෙසං සභාවබ්‍යතිරෙකානං—සභාවබ්‍යතිරෙකා,
ස්වභාවව්‍යතිරෙකයෝ; එතෙසං වචනප්පකාරානං, මේ ව
චන ප්‍රකාරයන්ට; අත්ථි ඉති, ඇත්තාහුනුයි; සභාවබ්‍යතිරෙ
කා, සභාවබ්‍යතිරෙක නම් වෙත්—"විසෙසතො සයනං පව
ත්තනං වසො" විසෙසතො, විශෙෂයෙන්; සයනං යි සේ
යි; පවත්තනං, පැවැත්මි; වසො, වසනම්—මෙහි 'විසො' යි
කිවමනාතන්හි ඉකාරයට අකාර කොට 'වසො' යි කියන
ලදී—අථවා "විසෙසතො අසනං පවත්තනං වසො" තෙන
වසෙන—අථවා, නොහොත්; විසෙසතො, විශෙෂයෙන්; අ
සනං යි සේයි; පවත්තනං, පැවැත්ම; වසො, වසනම් (ශේ
භෙදයි) මේ පක්ෂයෙහි ඉකාරලොපය කොට වකාරය පර
ස්වරයා කරා පමුණුවා 'වසො' යි රූපසිද්ධි වේ—"චත්තාරො
විධා භෙදා එතස්සා ති චතුබ්බිධං" විධා යි සේයි; චත්තාරො
භෙද, සතරභෙදයෝ; එතස්ස ඉති, මෝහටනුයි; චතුබ්බිධං,
චතුබ්බිධනම්—"පුබ්බෙ ඨිතානං පුබ්බං" පුබ්බෙ, පෙර; ඨිතානං,
සිටනලද්ද; පුබ්බං, පුබ්බනම්—"අනුරූපං රචනි පවත්තතීති
අනුලොමං" අනුරූපං, අනුරූප කොට; රචති යි සේයි; පව
ත්තති ඉති, පවිත්නුයි; අනුලොමං, අනුලොමනම්—මෙහි
අනුසබ්බෙපපද 'රු ගතිම්හි' යන ධාතුහුකෙරෙත් '**ඛ්‍යාදීහි
මණ්ඩවසොවා**' යන සූත්‍රයෙන් මණ්ප්‍රත්‍යය කොට කාරිත
සංඥ කොට ණකාරානුබන්ධයහට ලොප් කොට '**අසංයො
ගන්තස්ස**' යන ආදි සූත්‍රයෙන් ධාතුවාන උකාරයහට වෘද්ධි
කොට "**ලදුඛස්සච**" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් රකාරයට
ලකාර කොට නම් වත් කොට විභකත්‍යුත්පත්‍යාදිය කළක
ල්හි 'අනුලොමං' යි රූපය වේ—"අත්ථස්ස අනුලොමං අත්ථානු
ලොමං" තෙන අත්ථානුලොමෙන—අත්ථස්ස, අර්ථයට; අනු

———※0※———

19 තස්ස පක්ඛං කථෙන්තාන, අප්පක්ඛම්පි වදන්තු විජ්ජිතා
වුත්තානං යං පච්ඡිමකෙව්ව, තං පක්ඛන්තරනාමකං—

---

ලොමං අනුලොමවූයේ; අන්වානුලොමං, අන්වානුලොමනම්--
"විපරියං අසති පටිබිම්බං භවති ති විපරීතන්තකං" විපරියං යී
සේයි, අසති යී සේයි; පටිබිම්බං භවති ඉති, ප්‍රතිබිම්බ වෙනුයි;
විපරීතන්තකං, විපරීතන්තකනම් (ශේ ප්‍රතිලොමවචනයි)—මෙහි
වි පරි පූර්වවූ අසධාතුහුකෙරෙන් තප්‍රත්‍යය කොට '**භූජාදීන**
**මන්තො**' යන ආදි සූත්‍රයෙන් තකාරයහට විත්වද ධාත්වන්තයට
ලොප්ද කොට '**පච්චයාදනිට්ඨානිපාතනා**' යන ආදි සූත්‍රයෙන්
කප්‍රත්‍යය කොට විභක්ත්‍යුත්පත්‍යාදිය කළකල්හි රූපය වේ)

19 තස්ස පක්ඛං, තිසි පක්‍ෂයක්; කථෙන්තාන, කියා; අප්පක්ඛං
අපි, අනිකුදුපක්‍ෂයක්; වදන්තු, කියත්වා; විජ්ජිතා, නැමි ජාන
භූජිත්; යං, යම්වචනයෙක්; වුත්තානං, කියනලද්දෙද්ද; තංප
ච්ඡිමංච එව, ඒ පශ්චිමවචනයම; පක්ඛන්තරනාමකං, පක්‍ෂා
න්තාරදූශිත නම් වේ—

(**පණ**ශබ්ද **ච**ශබ්දයෝ දෙදෙන බොහෝසෙයින් පක්‍ෂාන්ත
රංදූශනක නම් වෙත්-ජිශබ්දයනොම මදවශයෙන් පක්‍ෂාන්ත
රංදූශනක නම් වේ-'තස්ස'යනු කිං ශබ්ද විශබ්දයන් තබා ඔ
වුන්කෙරෙන් පරව අං විභක්තිසගේ උත්පත්තිය කොට'**කිංස**
**කාංචම**' යන සූත්‍රයෙන් අං විභක්තිපරනිමිත්තින් කිං ශබ්දය
හට ක යන ආදෙශ කොට ක ශබ්දයාගේ අන්ත්‍යස්වරය ලොප්
කොට පරකුරතර පමුණුවා විශබ්දයාකෙරෙන් පරවූ අංවිභ
ක්තිහට '**සබ්බාසමාවුසෝ**' යන ආදි සූත්‍රයෙන් ලොප් කො
ට ක ශබ්දයාකෙරෙත් පරවූ නිගගහිතයාහට '**වග්ගන්තං**'
යන ආදි සූත්‍රයෙන් සකාරාදෙශ කොට පරකුරතර පමුණුවා
රූපය වේ—'පජ්ජතෙ එකෙතං සභාවෙන සයන්ති පක්ඛො'
තං පක්ඛං—පජ්ජතෙ යී සේයි; එකෙතං, එකස් එකස්; ස
භාවෙන, ස්වභාවයෙන්; සයන්ති ඉති, දන්නාලැබේනුයි;
පක්ඛො, පක්ඛනම් (ඒ කොටස්ඨාසයි) මෙහි 'පදසංගෙන' යන
ධාතුහුකෙරෙන් තප්‍රත්‍යය කොට ඔහට "**ධුසසච සකාරණො**
**සකඛකාම**" යන සූත්‍රයෙහි විග්‍රහණයෙන් ක්ඛ යන ආදෙශ
කොට දකාරලොපයද කොට 'විභක්ත්‍යුත්පත්‍යාදිය කළක

20 වුත්තෙන පච්චනීයෙචෙව, පච්ඡිමං අනුලොමතො
අන්වයම්හි විඤ්ඤෙය්‍යං, විඤ්ඤුනා චිත්‍රසඤ්ඤිනා —

---

ල්හි රූපය වේ—"වජ්ජිතවෙ වත්තුං" වජ්ජිතවෙ, කියන්ට යන අර්ථයෙහි; වත්තුං, වත්තුං යනු වේ - තදර්ථයෙහි තුංප්‍රත්‍යය වේ—"ඉච්ඡතීති ඉච්ඡන්තො" තෙන ඉච්ඡතා—ඉච්ඡති ඉති, කැමැතිවේනුයී; ඉච්ඡන්තො, ඉච්ඡන්තනම්—"පක්ඛඤ්ච තං අනන්තරං චෙති පක්ඛන්තරං" පක්ඛං ච තං, පක්ෂවූයේද ගේ නෙමේය; අනන්තරං ච ඉති, අනන්තරවූයේද ගේනෙමේනුයී; පක්ඛන්තරං, පක්ඛන්තරනම්—අ. නම් අව්‍යයීකොණෙක් මෙහි අනන්තරශබ්දය අව්‍යයශබ්දය කියා මෙය අව්‍යයීභාවසමාස යයි කියත්—"පක්ඛන්තරස්ස දස්සනං පක්ඛන්තරං" පක්ඛන්තරස්ස, පක්ෂාන්තරයාගේ; දස්සනං, දැක්ම; පක්ඛන්තරං, පක්ඛන්තරනම්—මේ උත්තරපදලොපවශයෙනැයි දතයුතු—"පක්ඛන්තරං ඉති නාමං එතස්සාති පක්ඛන්තරනාමකං" පක්ඛන්තරං ඉති, පක්ෂාන්තරදර්ශනය යන; නාමං, නාමය; එතස්ස ඉති, මේහටනුයී; පක්ඛන්තරනාමකං, පක්ඛන්තරනාමකනම් - **ඛච්සමාසන්තගතානාදි** සූත්‍රයෙන් කප්‍රත්‍යය වේ--මේ ගාථාවෙන් පක්ෂාන්තරලක්ෂණය කියනලදී)

20 පච්චනීයෙ, ප්‍රතිලොමවචනය; වුත්තෙනචඑව, කීතල්හිම; අනුලොමතො, අප්‍රතිපක්ෂභාවයෙන් (කියනලද) පච්ඡිමං, පශ්චිමවචනය; අන්වයං ඉති, අන්වයයි; චිත්‍රසඤ්ඤිනා, විචිත්‍රඥානැත්තාවූ; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; විඤ්ඤෙය්‍යං, දතයුත්තේය—

(මෙහි වනාහි ඒ පශ්චිමවචනයෙහි **හි ච පන** ශබ්දයන් අතුරෙන් එක්තරා ශබ්දයක් යොදත්මැය **හි ච පන** ශබ්දයෝ අන්වය දෙකතකම් වෙත්-"පටිපක්ඛස්සභාවෙන අනති පවත්තතීති පච්චනීයං" තස්මිං පච්චනීයෙ—(පටිපුබ්බ අන පවත්තනෙ—ණ්‍ය) පටිපක්ඛස්සභාවෙන, ප්‍රතිපක්ෂස්වභාවයෙන්; අනති සී සෙයි; පවත්තතී ඉති, පවතීනුයී; පච්චනීයං, පච්චනීයනම්—"විදති අත්ථඤ්ච සද්දඤ්ච විජානාතීති විඤ්ඤූ" තෙන විඤ්ඤුනා—විදති සී සෙයි; අත්ථංච, අර්ථයද; සද්දංච, ශබ්දයද; විජානාති ඉති, දනීනුයී; විඤ්ඤූ, විඤ්ඤූනම්—"චිත්‍රං සඤ්ඤං යස්ස සො චිත්‍රසඤ්ඤී" තෙන චිත්‍රසඤ්ඤිනා—චිත්‍රං, විසිතුරුවූ; සඤ්ඤං,

21 පුබ්බෙ ච අනුලොමෙන, වුත්තෙ තප්පටිපක්ඛතො
භාසිතං පච්ඡිමං තඤ්ච, බ්‍යතිරෙකං විභාවිනා.

22 නිපාතය සහිතෙ වගෙ, පුබ්බෙ තස්ස ගණ්හනං
පසංසිත්වාන යෙනෙතං, සම්භාවනන්ති භාසිතං.

---

ඥනය; යස්ස, යමෙක්හටද; සො, හේතෙම; විභූෂණී, විභූෂණීනම්—මේ ගාථාවෙන් අන්වය ලක්ෂණය දක්වනලදී)

21 ච, ඉදින්; අනුලොමෙන, අවිරුද්ධභාවයෙන්; පුබ්බෙ, පූර්වවාක්‍යය; වුත්තෙ, කිකල්හි; තප්පටිපක්ඛතො, ඒ පූර්වවාක්‍යයට ප්‍රතිපක්ෂභාවයෙන්; පච්ඡිමං, (යම්) පශ්චිමවචනයෙක්; භාසිතං, කියනලද්දේනම්; තංච, ඒද; බ්‍යතිරෙකං, ව්‍යතිරෙකයයි; විභාවිනා, ප්‍රාඥයාවිසින් කියනුලැබේ.

(මෙහි වනාහි පෙර කියනලද අප්‍රතිපක්ෂාර්ථ වචනයට ප්‍රතිපක්ෂභාවයෙන් ප්‍රතිලොම නම් වූ—පසුව කියනලද වචනය ව්‍යතිරෙකනම්--මේ පශ්චිමවචනයෙහි **හි ච පන** ශබ්දයන් අතුරෙන් එක්තරා ශබ්දයක් යොදන්මය—**හි ච පන** ශබ්දයෝ ව්‍යතිරෙකද්‍යොතක නම් වෙත්--''තස්ස පුබ්බෙ වුත්තස්ස පටිපක්ඛං තප්පටිපක්ඛං'' තතො තප්පටිපක්ඛතො—තස්ස, ඒ; පුබ්බෙ, පෙර; වුත්තස්ස, කියනලද්දට; පටිපක්ඛං, ප්‍රතිපක්ෂවූයේ; තප්පටිපක්ඛං, තප්පටිපක්ඛනම්—''භාසියතෙ කථියතෙති භාසිතං'' භාසියතෙ යී සේයී; කථියතෙ ඉති, කියනුලැබේනුයී; භාසිතං, භාසිතනම්—''විභාවයන් පාකටං කරොන් වචනවචනත්ථානිති විභාවී'' විභාවයති යී සේයී; වචනවචනත්ථානි, වචනවචනාර්ථයන්; පාකටං කරොති ඉති, ප්‍රකට කෙරේනුයී; විභාවී, විභාවීනම්—(හේ පණ්ඩිතයි) ''විභාවයති වචනපථානි විභූතං කරොති එතෙනාති වා විභාවො'' විභාවයති යී සේයී; එතෙන, මේ කාරණකොටගෙණ; වචනපථානි, වාක්පථයන්; විභූතං කරොති ඉති වා, පහළකෙරේනුයී හෝ; විභාවො, විභාවනම්; (හේ ඥනයි) ''විභාවො එතස්ස අත්ථීති විභාවී'' තෙන විභාවිනා—විභාවො, ඥනය; එතස්ස, මොහුට; අත්ථි ඉති, ඇත්තේනුයී; විභාවී, විභාවීනම් (හේ පණ්ඩිතයි)--මේ ගාථාවෙන් ව්‍යතිරෙකලක්ෂණය දක්වන ලදී)

22 පුබ්බෙ, පූර්වවාක්‍යයෙහි; අපෙ, අපිය, **නිපාතය සහිතෙ**

23 පගග්හවචනෙ වුත්තෙ, චොදකෙනෙව වෙ පුරෙ
යථාභූතෙන නිදස්සනං, පච්ඡිමං ගරහත්ථකං.

---

එව, නිදසුවහා යුක්තකල්හිම්; තස්ස, ඒ පූර්වාක්‍යයාගේ; යෙන, යම්වචනයකින්; පසංසිත්වාන, පසසා; ගණ්හනං, ගැනීමෙන්; නොහොත් කිමෙක් වේද; එතං, මේ; සම්භාවනං ඉති, සම්භාවනයයි; භාසිතං, කියනලද්දේය.

("නින්දීයතෙ ගරහීයතෙ ති නින්දා" තාය නින්දාය—නින්දීයතෙ යි සේයි, ගරහීයතෙ ඉති, ගරහණලැබේනුයි; නින්දා, නින්දානම්—"සහ අයන්ති පවත්තන්තීති සහිතො" තස්මිං සහිතෙ- සහ, සමග; අයන්ති යී සේයී, පවත්තන්ති ඉති, පවතිනුයි; සහිතො, සන්නම්—"පුරිමෙ තස්ස කථනං" යී කිවමනානන්හි ගාථාවෙහි සැපසපිණිස 'පුරිමෙ තස්ස ගණ්හනං' යී කියනලද්දී හැකේ—නොහොත් ගහධාතුනෙමේ "චසද්දගහණ්හා' යන ආදීයෙහි මෙන් කථනාර්ථද වේ—මේ ගාථාවෙන් සම්භාවනලක්ෂණය ප්‍රකාශකරණලදී)

23 වෙ, ඉදින්; චොදකෙන එව, චොදකයා විසින්ම; පුරෙ, පූර්වාක්‍යයෙහි; පගග්හ වචනෙ, පසසාගන්නාලද වචනය; වුත්තෙ, කීකල්හි, යථාභූතෙන, විද්‍යමානවූ යම් යම් දෙෂයක් ගෙනහැරදක්වාගෙණ; නිදස්සනං, නිදසුනකරන්නාවූ; පච්ඡිමං, පශ්චිමවචනය; ගරහත්ථකං, ගර්හාර්ථනම් වේ.

("පසංසිත්වා ගණ්හනං කථනං පගග්හං" පසංසිත්වා, පසසා; ගණ්හනංයි සේයී, කථනං, කීම: පගග්හං, පගග්හනම්—"පගග්හං එව වචනං පගග්හ වචනං" තස්මිං පගග්හවචනෙ—පගග්හං එව, පගග්හයම්; වචනං, වචනවූයේ; පගග්හවචනං, පගග්හ වචනනම්—"චොදයති ජානිතුං වා තදත්ථවෙදනාදිඅත්ථාය වා පුච්ඡං කරොතීති චොදකො" තෙන චොදකෙන—(චුද පුච්ඡීතකරණෙ—ණ්වු) චොදයති යී සේයී; ජානිතුං වා, දැනගන්ට හෝ; තදත්ථවෙදනාදි අත්ථායවා, සැකයිඳීම්ආදියපිණිස හෝ; පුච්ඡං කරොති ඉති, විචාරම් කෙරේනුයි; චොදකො, චොදකනම්—මෙහි එවශබ්දය නියමාර්ථයි-"යො යො භූතො විජ්ජමානො දෙසො යථාභූතො" තෙන යථා භූතෙන--භූතො යී සේයී; විජ්ජමානො, විද්‍යමානවූ; යො යො දෙසො, යම් යම් දෙෂයෙ

24 විත්ථාරවචනෙ තාව, වුත්තෙන එවං හි දුක්කරං
සඞ්ඛාරෙතුං හි සඞ්ඛිත්තං, පච්ඡා සඞ්ඛෙප නාමකං.

25 විසෙසවචනෙ වුත්තෙ, පඨමං තස්ස යං පුන
අභෙදං වුච්චතෙ පච්ඡා, එතං සාමඤ්ඤ නාමකං.

---

ත්; යථාභූතො, යථාභූතනම් — මේ හෙත්වර්ථයෙහි තෘතීයා යි — "නින්දති ගරහතීති නින්දනං" නින්දතියි සේයි, ගරහ ති ඉති, ගරහාතුයි; නින්දනං, නින්දන්තනම් — "ගරහා අත්ථො එතස්සාති ගරහත්ථකං" ගරහා, ගර්හාව; අත්ථො, අර්ථවූයේ; එ තස්ස ඉති, මෝහටතුයි; ගරහත්ථකං, ගරහත්කනම් (ගේ පශ්චිම වචනයි) බහුව්‍රීහිසමාසාන්තයෙහි කප්‍රත්‍යය වේ — මේ ගාථාවෙන් ගර්හාර්ථලක්ෂණය දක්වනලදී)

(මෙසේ **හි ච පන** ශබ්දයන්ගේ වූපරිද්දෙන් වාදශාර්ථය න් කියනලදහෙයින් ඔවුන්ගේ ලක්ෂණයෝ දක්වනලද්දාහු වෙත් — හුදෙක් ඒ **හි ච පන** ශබ්දයෝ වාදශාර්ථයන්හිද නො වෙත් ඉක්බිතිව කිසිකලෙක්හි සංක්ෂේපාර්ථ සාමාන්‍යාර්ථය න්හිද වෙත්යයි ඒ අර්ථයන්ගේ ලක්ෂණය දක්වන්නේ "වි ත්ථාරවචනෙ තාව" යනා ආදී ගාථාවය කිය)

24 විත්ථාරවචනෙ, විස්තාරවචනය; තාව, පළමුකොට; වු ත්තෙන, කීකල්හි, පච්ඡා, පසුව; සඞ්ඛිත්තං, සංක්ෂේපකරණ ලද වචනය; එවං හි, මෙසේවනාහි; සඞ්ඛාරෙතුං, සනිටුහ න්කරන්ට; දුක්කරං හි, දුෂ්කරමය; සඞ්ඛෙපනාමකං; (ඒ) සඞ්ඛෙපනම් වේ.

(ආචාර්‍ය්‍යයෝ ඒ සංක්ෂේපවචනය **හි ච පන** ශබ්දයන්හා යුක්ත කොටම කියත් — මෙහි **හි ච පන** ශබ්දයෝ සංක්ෂේප ද්‍යොතක වෙත් — ඔවුන් අතුරෙන් පනශබ්දයතෙම බොහෝ සෙයින් සංක්ෂේපද්‍යොතක වේ — අනික් ශබ්දයෝ දෙදෙන ස්වල්පවශයෙන් සංක්ෂේපද්‍යොතක වෙත් — "සඞ්ඛෙපං කත්වා වුච්චතීති සඞ්ඛිත්තං" 'සංඛෙපං කත්වා, සංක්ෂේප කොට; වුච්චති ඉති, කියනුලැබේනුයි; සඞ්ඛිත්තං, සඞ්ඛිත්තනම් (ගේ පශ්චිම වචනයි — මේ ගාථාවෙන් සංක්ෂේපය කියනලදී)

25 පඨමං, පළමුකොට; විසෙසවචනෙ, විශෙෂවචනය; වු ත්තෙ, කීකල්හි; පුන, නැවත; යං අභෙදං, යම් සාමාන්‍යව

---~~O~~---

26 නතාව සුවිඤ්ඤු විභූතං, ලක්ඛණේ යෙව භාසිතෙ
තස්මා පයොග මෙතෙසං, භාසිස්සාමි යථාබලං—

---

විනාශයක්; තස්ස, ඒ පූර්වවචනයට; පච්ඡං, පසුව; වුච්චතෙ, කියනුලැබේද; එතං, මේ, සාමඤ්ඤනාමකං, සාමාන්‍ය නම් වේ—

(ග්‍රන්ථකාරාචාර්‍ය්‍යයෝ ඒ සාමාන්‍යවචනය **ගි ච පන** ශබ්ද යන්හා දුක්නකොටම කියත්—මෙහි **ගි ච පන** ශබ්දයෝ සාමාන්‍ය දෙෂතකනාම් වෙත්—ඔවුන් අතුරෙන්නුදු ගි **ච** ශබ්දයෝ දෙදෙන බොහෝසෙයින් සාමාන්‍ය දෙෂතක වෙත්—අනික් **පන** ශබ්දයතෙමේ ස්වල්පවශයෙන් සාමාන්‍යදෙෂතක වේ—"විසුංභාවෙ ඨසියතෙ ඉච්ඡියතෙ ති විසෙසො" විසුංභාවෙ, වෙන්වූවන්; ඨසියතෙයි සේයි, ඉච්ඡියතෙ ඉති, කැමැතිවනුලැබේනුයි; විසෙශසා, විසෙසනම් (ශේ හෙළ,පිඩි) "විසෙසං වුච්චති එතෙනාති විසෙසවචනං" තස්මිං විසෙසවචනෙ—එතෙන, මේ කරණකොටගෙණ; විසෙසං, විශෙෂය; වුච්චති ඉති, කියනුලැබේනුයි; විසෙසවචනං, විසෙසවචනනම්—"න භෙදියතෙ න විසෙසියතෙ ති අභෙදං"—නභෙදියතෙයි සේයි, න විසෙසියතෙ ඉති, නො වෙසෙසනුලැබේනුයි; අභෙදං, අභෙදනම්—මේ ගාථාවෙන් සාමාන්‍යලක්ෂණය දක්වනලදී)

(මෙසේ විස්තරාදීන්ගේ ලක්ෂණයන් දක්වා දූන් ඔවුන්ගේ උදාහරණයන් දක්වන්නාවූ **අභිසවංසාචාර්‍ය්‍ය** තෙමේ "නාව සුවිඤ්ඤුවිභූතං" යන ආදි තෙළෙස්ගාථාවන් කීය)

**26** නාව, ඒනාක්; ලක්ඛණෙ එව, (විස්තරාදීන්ගේ) ලක්ෂණයම; භාසිතෙ, (අපවිසින්) කියනලදකල්හි; සුවිඤ්ඤු, ප්‍රත්‍යක්ෂවශයෙන්; න විභූතං, (යම්හෙයකින්) ප්‍රකටනුවූයේද; තස්මා, එසේහෙයින්; එතෙසං, මේ ගි **ච පන** ශබ්දන්ගේ; පයොගං, (ස්වල්පමාත්‍ර) උදාහරණයක්; යථාබලං, (ඥාන) ශක්ති යවූපරිද්දෙන්; භාසිස්සාමි, කියන්නෙමි—

(මෙහි සුශබ්දයාකෙරෙත් '**ඥසුගි විදු**' යන සූත්‍රයෙන්හෝ **මහානිරුක්ති** සූත්‍රයෙන්හෝ විදුප්‍රත්‍යයකළකල්හි 'සුවිඤ්ඤු' යී රූපය වේ—ශේ ස්යලු විභක්තිවචන ව්‍යාපක අව්‍යය ප්‍රත්‍යයෙක් වේ—මෙහි නාදින්ක්‍යත්‍යයෙහි වේ—"විභාජියතෙ පානු

27 වෙදනාදිසු විසෙසක්ඛයෙන, සුඛසද්දොති පාඨකෙ
අයංහි සුඛස්සචාදි, විත්ථාරෙව විත්ථාරණං—

භූයතෙති විභූතං'' විභාවීයතෙයි සේයි, පාතුභූයතෙ ඉති, ප්‍රකාශකරණුලැබේනුයි; විභූතං, විභූතනම්—''ලක්ඛීයතී තප්පයොගො එතෙනාති ලක්ඛණං'' තස්මිං ලක්ඛණෙ—එතෙන, මේ කරණකොටගෙණ; තප්පයොගො ඔවුන්ගේ ප්‍රයොගය; ලක්ඛියති ඉති, දන්නාලැබේනුයි; ලක්ඛණං, ලක්ඛණනම්—''පයුජ්ජතෙ ලක්ඛණෙනාති පයොගො'' තං පයොගං—ලක්ඛණෙන, ලක්ෂණය කරණකොටගෙණ; පයුජ්ජතෙ ඉති, යොදනුලැබේනුයි; පයොගො, පයොගනම්—''බලස්ස අනුරූපං යථාබලං'' බලස්ස, බලයට; අනුරූපං, සුදුසුවූයේ; යථාබලං, යථාබලනම්)

27 වෙදනාදිසු විසෙසක්ඛයෙන සුඛසද්දො ඉති, වෙදනාදිසු විසෙසක්ඛයෙන සුඛසද්දො, යන; පාඨකෙ, (සංක්ෂිප්ත) පාඨයෙහි; විත්ථාරණං එව, විස්තරකරන්නාවූම; අයං හි සුඛස්සචාදි; අයං හි සුඛස්සච යන ආදිය; විත්ථාරෙ, විස්තර නම් වේ—

(මේ උදාහරණ වචනය අර්ථමාත්‍රය ගෙණ කියනලදී—පාඨය අපරිද්දෙන්ම නොකියනලදී—මේ ආචාර්‍ය්‍යතෙම ගාථාබන්ධනයෙන් මේ ප්‍රකරණය රචනාකරන්නේ යම් පාඨයක් උදාහරණකරණුකැමැත්තේ වේද ඉදින් ඒය ගාථා පාදයෙන් පොහොනේ වේද සිටිපරිද්දෙන්ම ඒ පාඨය උදාහරණ කෙරේ—ඉදින් වනාහි නොපොහෝනේ වේද ඒ පාඨයාගේ අර්ථමාත්‍රය ගෙණ ගාථාබන්ධනය කොට උදාහරණ කෙරේ—''සුඛසද්දො තාව සුඛවෙදනා සුඛමූල සුඛාරම්මණ සුඛහෙතු සුඛපච්චය ඨාන අබ්‍යාපජ්ඣ නිබ්බාණාදිසු දිස්සති අයං 'හි' සු සුඛස්සච පහාණායාති ආදිසු සුඛවෙදනායං දිස්සති'' යන මේ අර්ථකථාපාඨය මෙහි උදාහරණ කටයුත්තේවී එයේ ඇතිකල්හිදු මනාකොට අර්ථය ප්‍රකට වේයයි දතයුතු—'සුඛස්සචාදි' යන මෙහි ආදිශබ්දයෙන් ''කුසලසද්දො තාව ආරොග්‍ය අනවජ්ජ ඡෙක සුඛවිපාකෙසු දිස්සති අයංහි කච්චිනුභොතො කුසලං කච්චිනු භොතො අනාමයන්ති ආදිසු ආරොග්‍යෙ දිස්සති'' යන ආදි උදාහරණයත් ගැණේ—එහි ''සුඛසද්දො තාව—පෙ—නිබ්බාණාදිසු දිස්සති'' යන ප්‍රථමවචනය සං

———※○※———

28 එත්ථහි බහුධා අත්ථං, රතනානං පණාමනෙ
පපඤ්චෙන්ති ආදිසු, වාක්‍යාරම්භො පදිස්සරෙ.—

---

ක්ෂෙපනම් වේ—"අයං ඛී—පෙ—නායං දිස්සති" යන පශ්චිම වචනය විස්තරනම් වේ—මෙහි චශබ්දය විස්තරද්‍යොතකනම් වේයයි දතයුතු)

29 එත්ථහි බහුධා අත්ථං රතනානං පණාමනෙ පපඤ්චෙන්ති ඉති, එත්ථහි—පෙ—පපඤ්චෙන්ති යන; ආදිසු, මේආදි ප්‍රයොග යන්හි; වාක්‍යාරම්භො, වාක්‍යාරම්භයතෙම, පදිස්සරෙ, දක්නාලැබේ—

(එත්ථහි, මෙහි; රතනානං, (ත්‍රිවිධ) රත්නයන්ට, පණාමනෙ, ප්‍රණාමය කිරීමෙහි; අත්ථං, ප්‍රයොජනය; බහුධා, බොහෝ ප්‍රකාරයෙන්, පපඤ්චෙන්ති, (ආචාර්‍ය්‍යයෝ) විස්තරකෙරෙත් යි උදාහරණාර්ථයි—මෙහි හිශබ්දය වාක්‍යාරම්භද්‍යොතකයයි දතයුතු—"පයොජනම්පන ඉමිනාව සම්බන්ධෙන සාමත්ථියතො දස්සිතමෙව" යන වචනය අරබයා මේ 'එත්ථහි' යන ආදි වාක්‍යාරම්භසඞ්ඛ්‍යාත පශ්චිමවචනයාගේ කියනලදහෙයින්—ගන්ධාභරණසඞ්ගහටීකාවෙහි "තත්ථරතනත්තයප්පයොජනං නාව බහුධා පපඤ්චෙන්ති ආචරියා" යි හිශබ්දරහිත පාඨයෙක් දක්නාලැබේ එසේඇතිකල්හිදු 'එත්ථහි' යන මෙය ඒ පාඨයාගේ අර්ථය දක්වනමාත්‍රයෙන්ද හිශබ්දයාගේ ලුප්ත නිර්දෙශවයය දැක්වීමෙන්ද ගෙණෙනලද පාඨයෙක් වන්නේය—සාරත්ථදීපනියෙහි "එත්ථච සංවණ්ණනාරම්භෙ රතනත්තය පණාම කරණප්පයොජනං අත්ථං බහුධා පපඤ්චෙන්ති ආචරියා" යි කියනලදී—ශබ්දබින්දුටීකාවෙහිද "එත්ථහි පකරණාරම්භෙ—පෙ—පපඤ්චෙන්ති ආචරියා" යි කියනලදී—ඒ ඒ පාඨයන්හි හි ච යන පදවය එකාර්ථ වේ—එතශබ්දයා තමා අභිධෙයාර්ථයෙන් කිසිතලෙක්හි තශබ්දාර්ථයෙහිද කිසිකලෙක්හි ඉමශබ්දාර්ථයෙහිද වැටේ—ආචාර්‍ය්‍යයෝ වනාහි තශබ්දයතෙම දූරාර්ථවාචකය ඉමශබ්දයතෙම සමීපාර්ථවාචකයයි කියති—සාරත්ථදීපනියෙහිද ශබ්දබින්දුටීකාවෙහිද චශබ්ද හිශබ්දයෝ වාක්‍යාරම්භද්‍යොතක වෙහිසීද අභිධම්මත්ථසඞ්ගහ ටීකාවෙහි හිශබ්දය ලුප්තනිර්දෙශවයයයිද දතයුතු—'පදිස්සරෙ' යන මෙහි තෙවිභක්තිහට "අනාගතෙනාපද නිපරසසපද

29 අත්ථෝ'ක්ඛරසඤ්ඤාතො, විපත්තියං හි දුන්නයො
තස්මා හිච්චාදි පාඨේසු, කාරණජෝතකො භවෙ—

30 දානං දාතබ්බමෙවාහි, දානං හි භොගසම්පදං
ආවහන්ති හි චාදිසු, නිපාතා ඵලජෝතකා—

---

තනං" යන සූත්‍රයෙහි **'සදහනං'** යන භාවනිද්දේශයෙන් රෙ යන ආදෙශ වේ—**මහානිරුක්තියෙහි** මේවසූත්‍රයෙහි **'සදහනං'** යන භාවනිද්දේශයෙන් හි අනත් තෙ අන්තෙ යන මේ විභක්තින්ට රෙ යන ආදෙශය වේයයි කියනලදහෙයිනි— 'පපඤ්චනතිහි ආදිසු' යන මෙහි ආදිශබ්දයෙන් "රතනත්තය පණාමොහි අත්ථො පණාමකිරියා නිප්ඵාදිකා කාමාවචරකුසලචෙතනා" යන ආදි උදාහරණයන් ගැණේ—මේ වාක්‍යයෙහිද හිශබ්දය වාක්‍යාරම්භද්‍යෝතක වේ)

29 අත්ථෝ, අර්ථයතෙම; අක්ඛරසඤ්ඤාතො, අක්ෂරයෙන් දන්නාලද්දේය; විපත්තියං, (අක්ෂරයන්ගේ) අන්‍යථාපදවෘත්ති යක් ඇතිකල්හි; හි, සම්භෙදයකින්; දුන්නයො, දුරවබොධය වේද; තස්මා ඉතිච, එසේහෙයින් යන; ආදිපාඨේසු, මේආදි පාඨයන්හි; කාරණජෝතකො භවෙ, (හිශබ්දයතෙම) කාරණද්‍යෝතකනම් වේ—

(මෙහි අර්ථමාත්‍රයද ගෙණ මේ ප්‍රයොගය දක්නාලැබේ— මෙසේ මේපාඨය සිටියේ වේ—"අත්ථො අක්ඛරසඤ්ඤාතො— සබ්බවචනාන මත්ථො අක්ඛරෙහෙව සඤ්ඤායතෙ අක්ඛරවිපත්තියං හි අත්ථස්ස දුන්නයතා හොති තස්මා අක්ඛරකොසල්ලං බහූපකාරං සුත්තන්තෙසු" යී—"අක්ඛරවිපත්තියං හි" යනු මෙහි හිශබ්දයතෙම කාරණද්‍යෝතක නම් වේ—'දුන්නයතා' යන මෙහි තාශබ්දය තද්භාවාර්ථයයි කියා 'දුන්නයො' යී කියනලදී—"චාදිපාඨේසු" යන මෙහි චශබ්දය පදපූරණයෙහිද පක්ෂාන්තරයෙහිද වැටේ—ආදිශබ්දයෙන් චනාහි "සතෙතාහි ඛන්ධසන්තානො—යත්ථ හි සත්තපඤ්ඤත්ති හි ච—කුසලාදිනම්පිහි විඤ්ඤාණානං—ධාතුකථායං සඞ්ඛාරපච්චයා විඤ්ඤාණාදි පදෙහි සඞ්ගහිතත්තා චූළදසපදනිද්දෙසෙ විපාකධම්මාහි ඉමස්ස විස්සජ්ජනාසදිසෙන තෙසං විස්සජ්ජනෙන දස්සිතා තිච" යන මේආදි උදාහරණයන් ගැණේ)

30 දානං දාතබ්බමෙවාහි දානං හි භොගසම්පදං ආවහන්ති ඉ

---

31 පුඤ්ඤවා පඤ්ඤවා චෙව, දුල්ලභා විධ තෙසුහි
පඤ්ඤවා යෙව මිච්චෙවං,විසෙසො ලබ්භතෙ සදා—

---

තිච, දානං—පෙ—ආවහති යන; ආදීසු, මේආදි ප්‍රයොගයන්හි; නිපාතා,(ච පන ශබ්දසඞ්ඛ්‍යාත) නිපාතයෝ; ඵලජොතකා, ඵලද්‍යොතක නම් වෙත්—

(“දානං හි” යන මෙහි හිශබ්දයතෙම ඵලද්‍යොතකනම්—මෙහිදු යම්හෙයකින් දානය නම් සම්පත්තීන්ට මූලකාරණ වේද එසේහෙයින් “දානං දාතබ්බමෙව” යන කාරණයාගේ ඵලය ප්‍රකාශකරන්නාවූ පශ්චිමවචනය ඵලද්‍යොතකනම්— “වාදීසු” යන මෙහි වශබ්දය පදපූරණාර්ථයෙහි හෝ පක්ෂාන්තරාර්ථයෙහි හෝ වැටේ—ආදිශබ්දයෙන් වනාහි

අතික්කමිතුකාමො චෙ, සංසාරං දුරතික්කමං
දානං සීලං භාවනඤ්ච, පරිපූරෙථ පණ්ඩිතො—

දානං හි පාළියං සෙට්ඨං, සංසාරෙ පරිභුඤ්ජතො
සීලං ආජානියා සෙට්ඨං, අපායං සමතික්කමං
මෙත්තාදිභාවනා වුද්ධා, නානාභයනිවාරණං—

යන මේ ආදීන් ගැණේ—මේ ගාථාවෙහිද 'හිසද්දො ඵලජොතකො' යි නොකියා “නිපාතා ඵලජොතකා” යි කියනලද හෙයින් එම ආදිශබ්දයෙන් ච පන ශබ්දයන්ගේද උදාහරණ යත් ගැණේ—කෙසේද? “වුට්ඨාහි චායස්මා මහාකස්සපො තම්හා ආබාධා” යන ආදියෙහි චශබ්දය ඵලද්‍යොතකනම්— “ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි” යන ආදියෙහි පන ශබ්දය ඵලද්‍යොතක නම් වේ-මෙහි චශබ්දය වාක්‍යාරම්භද්‍යොතකයයි දතයුතු)

81 පුඤ්ඤවා පඤ්ඤවා චෙව දුල්ලභා විධ තෙසුහි පඤ්ඤවා යෙව ඉති එවං, පුඤ්ඤවා—පෙ—පඤ්ඤවා යෙව යන මේ ආදියෙන්; විසෙසො, විශේෂයතෙම; සදා, හැමකල්හි; ලබ්භතෙ, ලැබේ; නොහොත් දන්නාලැබේ—

(පුඤ්ඤවා, පින්ඇත්තේද; පඤ්ඤවාච එව, පැනැත්තේද යනාමොහු; ඉධ, මේ සත්වලොකයෙහි; දුල්ලභා එව, දුර්ලභම

———✲○✲———

32 යථාපි සකුණො රුක්ඛං, යං නිස්සාය නිලීයති
තථෙව නිග්ගහීතන්ති, තප්පාකටිකරණං භවෙ—

33 වුත්තං හි භගවතාති, වුත්තං ආගමදල්හියං
බුද්ධාදි වචනෙනෙව, න ච ඤ්ඤං අත්ථි තං විනා
ඉච්චාදි යුත්තානි සෙසානං, ඉදං ච සාධනං භවෙ—

---

වෙත්; හි, මේ විශෙෂය වේ; තෙසු, ඔවුන් අතුරෙන්; පඤ්ඤා එව, පැනැත්තේම, ඉතා දුලීභ වේ යනු උදාහරණයි මෙහි හිශබ්දය විශෙෂද්‍යොතක නම්—"තථා පතිනොචාය ස්මතො මහාකස්සපස්ස සො ආබාධො අහොසි" යන මේආදී යෙහි චශබ්දයතෙමේද **නෙත්තිඅට්ඨකථාවෙහි** "දන්ධසඤ්ඤාව ධම්මං ජානාතීති තණ්හාචරිතස්ස මන්දපඤ්ඤස්ස වසෙන වුත්තං තික්ඛපඤ්ඤො පන ඛිප්පං ජානාති" යන ආදියෙහි පනශබ්දයතෙමේද විශෙෂද්‍යොතකයයි දතයුතු—"ඉච්චෙවං" යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථයි එවං ශබ්දය අවධාරණාර්ථයි)

32 යථාපි සකුණො රුක්ඛං යං නිස්සාය නිලීයති තථෙව නිග්ගහීතං ඉති, යථාපි—පෙ—නිග්ගහීතං යන ආදියෙහි; තප්පාකටිකරණං භවෙ, තප්පාකටිකරණ නම් වේ—

(හි, එය ප්‍රකටකරමි; යථා, යම්සේ; සකුණො, පක්ෂියතෙමේ; යංරුක්ඛං, යම් රුකක්; නිස්සාය, නිසා; නිලීයති, හිඳී; නිග්ගහීතං, නිග්ගහීතය; තථෙව, එසේමය යනු නිදර්ශනාර්ථයි- යම්සේ පක්ෂියෙක් යම්වෘක්ෂයක් නිසා ඉඳිද ඒ වෘක්ෂය නටකල්හි අනික් රුකක් නිසා වෙසේද එසේම නිග්ගහීතයතෙම යම් ස්වරයක් නිසා සිටිද ඒස්වරය නටකල්හි අනික් ස්වරයක් නිසා සිටී--මෙහි ප්‍රයොගය ආචාර්‍ය්‍යයා විසින් ස්වල්පමාත්‍රයක්ම ගෙණහැරදක්වනලද්දේය--'න සබ්බසො හි' යන මෙහි හිශබ්දය තප්පාකටීකරණ ද්‍යොතකනම්--ච පන ශබ්දයන්ගේ ප්‍රයොගයෝ අපවිසින් පෙර ගෙණහැර දක්වනලද්ද බලා අනිකෙක් ප්‍රයොගවිචක්ෂණයන් විසින් උදාහරණකටයුතු--'නිග්ගහීතනති'යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද අවධාරණාර්ථද වේ)

33 වුත්තං හි භගවතා ඉති, වුත්තං හි භගවතා යනු; ආගමදල්හියං, ආගමදල්හියයි; වුත්තං, කියනලද්දේය; බුද්ධාදී වච

34 යම්පන තං මහාරක්ඛ, උන්නාදෙත්වාන පඨවිං
ඉච්චෙවමාදිකෙ පාඨෙ, වුච්චතෙ යං පක්ඛන්තරො.

---

නෙයෳාව නාගරක්ඛං අත්ථි තං විනා ඉති, බුඩාදී—පෙ--තං වි
නා යන; ආදි, මේ ආදිය; සුතානි, සුක්තිදල්ශිය නම් වේ--ඉදං
එව, මේ උදාහරණයම; සෙසානං, සෙසු (හිච්පනනිපාතය) ආ
ගමයුක්ති අල්ඞකාරණයන්ට; සාධනං භවෙ, නිදර්ශන වේ.

(හි, ඒ වචනය සැබව; භගවතා, බුදුන් විසින්; වුත්තං, (රු
ප්පනීති බො ඊක්ඛවෙ රුප්පනීති වුච්චති යි) වදාරණලද්දේය-
බුඩාදී, බුඩාදීනු; විජ්ජෙයන එව, වැන්දපුත්තාහුමිය; හි, ඒ ව
චනය සැබව; තං විනා, ඒ රත්නත්‍රයහැර; අඤ්ඤං, (වැඩිදුනු
තුවු) අනිකෙක්; නාත්ථි, නැත්තේය යනු නිදර්ශනාර්ථයි; 'භ
ගවතාති' යන මෙහි ඉතිශබ්දයද 'ඉච්චාදි' යන මෙහි ඉතිශබ්ද
යද නිදර්ශනාර්ථයි)

34 අයං, මේ පනශබ්දයතෙම; යම්පනතංමහාරක්ඛ, උ
න්නාදෙත්වාන පඨවිං ඉති, යම්පන තං මහාරක්ඛ උන්නාදෙ
ත්වාන පඨවිං යන; එවමාදිකෙ, මේ ආදිවූ; පාඨෙ, පාඨය
තෙම; පක්ඛන්තරො, පක්ෂාන්තරයයි; වුච්චතෙ, කියනු
ලැබේ.

(පන, අනිස්පක්ෂයක්කියම්; රක්ඛ, රජහු විසින්; යං තං මහාපඨ
විං, යම් ඒ මහපොළවක්; උන්නාදෙත්වා, හඬවා යනු උදාහරණ
ර්ථයි-මෙහි ගාථාබන්ධසූචය පිණිස අනර්ථනප්‍රයුක්තවූ මහාශබ්ද
යතෙම 'පඨවිං' යන මේ පදය හා සම්බන්ධ කටයුතු—දොළෙහි
සම්පන තං රක්ඛ මහාපඨවිං උන්නාදෙත්වා" යි ආදේශ—මෙහි
පනශබ්දය පක්ෂාන්තරදෙශනකනම්-'ඉච්චෙවමාදිකෙ පාඨෙ'
යන මෙහි සිහට **'ස්‍යාච'** යන මෙහි විග්‍රහණයෙන් එකාරාදෙ
ශ වේ—'චතප්පගුම්බෙ න එවං වතනඩෙබ යෙ අචිතකෙකා
අච්චාරෙ තෙ පණිතතරෙ' යන ආදියෙහි මෙති—පෙර කිය
නලද වාක්‍යයාගේ නිරවශෙෂයෙන් අර්ථය ප්‍රකාශකරන්
නාවූ පශ්චිම වාක්‍යය අර්ථාන්තරාරම්භයෙන් වාක්‍යාරම්භයයි
කියනුලැබේ—පෙර කියනලද වාක්‍යය හැර කොටස්‍යාන්ත
රය දක්වන්නාවූ පශ්චිම වාක්‍යය පක්ෂාන්තරයයි කියනුලැ
බේ- මේ වාක්‍යාරම්භපක්ෂාන්තරයන්ගේ විශෙෂයයි—

——※0※——

35 නෙවිච්ඡං පණ්ඩිතො සෙවෙ, වඤ්චනං හි ඉත්ථියා මනං
ඉච්චාදි අන්වයං වුත්තං, විඤ්ඤූනා සාරමතිනා—

---

"අනන්තකෙනාපි පනනස්ස, ජගිත්වා මානුසං භවං
කිං හි තස්ස සකං හොති, කිං නු ආදාය ගච්ඡති"

යන ආදියෙහි හිශබ්දයතෙමේ පක්ෂාන්තරද්‍යොතක නම් වේ—හිශබ්දයාගේ පක්ෂාන්තරභෙදය සමල්පමය—ඒ මේ හි ශබ්දයාගේ අර්ථස්වරූප ගාථාවෙහි පක්ෂාන්තරය නොකිය නලද්දේය—මෙහිද හිශබ්දප්‍රයොගය නොගෙණ පනශබ්ද යාගේ ප්‍රයොගය දක්වනලද්දේය එහි **පන** ශබ්දයාගේ බොහෝ සෙයින් පක්ෂාන්තරද්‍යොතකත්වය වශබ්දය මෙන් දතයුත්තේය—එසේහෙයින් මේ ප්‍රයොගය වේ—"එවංච පාළියං හිනාගතා අවිභජිතානම්පි සතිපට්ඨාන පදානං ඝණ්ඩිත්වා ගහණං කරොන්තං නෙසං භිඤ්ඤිත්වාපි විස්සජ්ජෙතබ්බං තං දස්සෙතිති දට්ඨබ්බං" යන ආදියෙහි වශබ්දය පක්ෂාන්තරාර්ථයී—වාක්‍යාරම්භයයි සමහරු කියති)

**35** නෙවිච්ඡං පණ්ඩිතො සෙවෙ වඤ්චනං හි ඉත්ථියා මනං ඉති, නෙවිච්ඡං—පෙ—මනං යන; ආදි, මේ ආදියතෙම; අන්වයං, අන්වයයි; සාරමතිනා, සාරවූ ප්‍රඥාඇති; විඤ්ඤූනා, පණ්ඩිතයා විසින්; වුත්තං, කියනලද්දේය—

(පණ්ඩිතො,. පණ්ඩිතතෙම; ඉත්ථිං, ස්ත්‍රිය; නසෙවෙ එව, සෙවනය නොකරන්නේමය; හි, මේ සෙවනය නො කිරීමට අනුලොම්කිරීමයි; ඉත්ථියා, ස්ත්‍රියගේ; මනං, සිත; වඤ්චනං, ඇදය යනු උදාහරණයයි—මෙහි හිශබ්දය අන්වය ද්‍යොතකනම්—'මනංඉච්චාදි' යන මෙහි ආදිශබ්දයෙන් "සමු දයසච්චං තිහි ඛන්ධෙහි විප්පයුත්තන්ති න වුත්තං අභිභාගෙහි තෙහි විප්පයුත්තවචනස්ස අප්පවත්තනතො විභාගෙහි සඞ්ඛං සමුද යසච්චං සුඛදුක්ඛසොමනස්සින්ද්‍රියෙහි මනොවිඤ්ඤාණධාතු තො අඤ්ඤ විඤ්ඤාණධාතූහි විප්පයුත්තන්ති විප්පයුත්තනං ව තුං" යන ආදි හිශබ්ද සහිත උදාහරණයන්හා "මාතුගා මො නාම නවිස්සාසිතබ්බො තස්ස වචනං නසද්දහිතබ්බං මාතුගාමස්ස ච චිත්ත මනොජ්ජකං කුටිලං වඤ්චනමෙව යන ආදි වශබ්දසහිත උදාහරණයන්ද—

36 ඉතරට්ඨාහි තථාදීසු, ව්‍යතිරෙකන්ති නො මතී
න චෙත මධිප්පෙතන්ති, ටීකායං වුත්ත මීදිසං

37 අසණ්ඨිතම්පි උබ්බචං, ජනකසන්තියා පන
විපාකධම්ම මෙතන්ති, සම්භාවනං පකාසයෙ

---

''නාවමඤ්ඤෙථ වුඩ්ඪං ව, සුසීලිනං තපොචරං
සාවකං දහතෙ බාලං, සො පන සක තෙජසා''

යනා ආදි පනශබ්ද සහිත උදාහරණයන්ද ගැණේ—මෙහි ච පනශබ්දයෝ අන්වය ද්‍යොතකනම් වෙත්)

36 ඉතරට්ඨාහි ඉති, ඉතරට්ඨාහි යනා; ආදීසු, මේ ආදියෙහි; ව්‍යතිරෙකං ඉති, ව්‍යතිරෙකයයි; නො, අපට; මතී, රුචි වේ; නචෙතමධිප්පෙතං ඉති, නචෙතමධිප්පෙතං යනු; ටීකායං, (ගන්ධට්ඨි) ටීකාවෙහි; ඊදිසං, මේ ව්‍යතිරෙකයයි; වුත්තං, කියනලද්දේය.

(''එත්ථ විනිච්ඡයො පහාතබ්බා හෙතූ එතෙසන්ති එව මත්ථං අගහෙත්වා පහාතබ්බා හෙතු එතෙසං අත්ථීති එව මත්ථො ගහෙතබ්බො—ඉතරට්ඨාහි අහෙතුකානං අගහණං භවෙය්‍ය'' සී පළමුකොට අනුලොම වචනය කියා මේ පශ්චිම පච්චනීය වචනය ව්‍යතිරෙකනම්—මෙහි හිශබ්දය ව්‍යතිරෙකද්‍යොතකනම්—ආදිශබ්දයෙන් ''කුසලා පන අකුසලා ධම්මා කෙනෙහි විභත්තා නෙව කුසලෙහි නච තෙසං සම්පදාරෙක දෙසභාවො තදෙකදෙස සමුදයභාවො වා'' යන ආදි චශබ්ද සහිත උදාහරණයන්ද ''විප්පයොගෙ පන අවිජ්ජමානතාදීපකො භෙදෙ ගහිතෙ තෙනෙව විසභාගතා එවාති භෙදො භෙදෙ පන අග්ගහිතෙ න විප්පයොගො'' යන ආදි පනශබ්ද සහිත උදාහරණයන්ද ගැණේ)

37 අසණ්ඨිතම්පි උබ්බචං ජනකසන්තියා පන විපාකධම්ම මෙතං ඉති, අසණ්ඨිතම්පි—පෙ—මෙතං යනා ආදිය; සම්භාවනං, සම්භාවනයයි; පකාසයෙ, ප්‍රකාශකරන්නේය.

(මෙහි පනශබ්දය සම්භාවන ද්‍යොතකනම්—''විපාකධම්ම මෙතන්ති'' යනා මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද

38 සන්තත්තා සුඛසම්භූතා, උපෙක්ඛා පන නිච්චතො
දුක්ඛන්ති කථිතා වෙති, ගරහා ඉධ ජානියා—

39 පදපූරණමත්තෙපි, අවධාරෙ පවත්තරෙ
හිච පනාදිකා සද්දා, යථා යොගං කදාචිපි—

---

වේ—ඒ අදහස්යෙන් "යදිපි කදාචි යොනිසො මනසිකාරා අකුසල චෙතනා නප්පවත්තන්ති අනුසයා පන අප්පහීනාති තෙ අකුසලස්ස අභිසඞ්ඛාර විඤ්ඤාණස්ස පතිට්ඨා හොන්ති යෙව" සීද "කිඤ්චාපි තෙ හොන්ති භූසප්පමත්තා නතෙ භවං අට්ඨමං ආදියන්ති--සත්තමෙ භවෙ විපස්සනං ආරභිත්වා අරහත්තං පාපුණන්තීති අත්ථො" සීද පට්ඨානවාරයෙහි **නෙත්ති අට්ඨකථාවෙහි** ආවාවූ ප්‍රයොගයන් ගැණේ සෙසුතැන්හි උදාහරණයෝ සඞ්ග්‍රහකටයුත්තාහුය)

38 සන්තත්තා සුඛසම්භූතා උපෙක්ඛා පන නිච්චතො දුක්ඛන්ති කථිතාව ඉති, සන්තත්තා—පෙ---කථිතාව යන; ඉධ, මේ ප්‍රයොගයෙහි; ගරහා, ගර්හාතොමෝ; ජානියා, දතයුත්තිය—

(උපෙක්ඛා, උපෙක්ෂාවෙදනාතොමෝ; සුඛසම්භූතා, සැපයෙන් උපන්නිය; සන්තත්තා, ශාන්ත බැවිනි—පන, ගර්හාවෙකි; අනිච්චතො, අනිත්‍යභාවයෙන්; දුක්ඛං ඉති එව, දුක් යයිම; කථිතා, වදාරණලද්දිය යනු නිදර්ශනාර්ථයි—මෙහි පන ශබ්දය ගර්හාද්‍යොතකනම්—'කථිතාව' යන මෙහි එවශබ්දය අස්ථානප්‍රයුක්තයි එසේ හෙයින් "දුක්ඛං ඉති එව" යී සම්බන්ධ වේ—"කථිතා වෙති" යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ ඒ අදහස්යෙන් "යදිපි නහි රතා දුක්ඛන්ති තණ්හා තිච ජනන්ති ඉමං දුක්ඛං එත්තකං දුක්ඛන්ති අයං තණ්හා අයං තස්ස සමාදා විභාගො නිච පන පරිච්ඡෙදය පහාතබ්බභාවෙච නජනන්ති ඉති පවත්තිහෙතුමත්තම්පි නජානන්ති කාංපනකථා නිවත්තිහෙතුභූති අහ ඉතො බහිද්ධා නත්ථි සබ්බමෙව පවත්තානං" යන ආදින් ගැණේ)

39 හිචපනාදිකා, හි ච පන යන ආදිවූ; සද්දා, (නිපාත) ශබ්දයෝ; පදපූරණමත්තෙ අපි, පදපූරණමාත්‍රයෙහිද; අවධාරෙ, අවධාරණයෙහිද; කදාචිපි, කිසිකලෙකත්; යථා යොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්, පවත්තරෙ, පවතිත්—

40 තෙනාපි තාඅදිකෙ පාඨෙ, හිසද්දො පදපූරණෙ
ජිනවචනාපූලානං හි, අවධාරෙ පකාසිතො.

41 සච්චෙච මයන්තාදිසු, චසද්දො පදපූරණෙ
විචිකිච්ඡා පන චෙති, අවධාරෙව සො මතො.

42 යො පන භික්ඛු මිච්චාදො, පදපූරණකො මතො
පති‍තොච පනිච්චාදො, පනසද්දොව ධාරණෙ.

43 නියමෙවාව ධාරෙව, සනිට්ඨානෙ පවුච්චතෙ
පදපූරණමත්තෙපි, එවසද්දො විභාවිනා.

---

40 තෙනාපි ඉති, තෙනාපි යන; ආදිකෙ, මේ ආදිවූ; පාඨෙ, පාඨයෙහි; හිසද්දො, හිශබ්දයතෙම; පදපූරණෙ, පදපූරණ යෙහි වේ; ජිනවචනාපූලානංහි, ජිනවචනාපූනානංහි යන මෙහි; අවධාරෙ, අවධාරණයෙහි වේයයි; පකාසිතො, ප්‍රකාශකරණ ලද්දේය.

41 සචෙච්චමයං ඉති, සචෙච්චමයං යන; ආදිසු, මේආදිප්‍රයො ගයන්හි; චසද්දො, චශබ්දයතෙම; පදපූරණෙ, පදපූරණ වැවේ; විචිකිච්ඡාපනච ඉති, විචිකිච්ඡාපනච යන මෙහි; සො, ඒ චශබ්දයතෙම; අවධාරෙ එව, අවධාරණයෙහිම වැවේ යයි; මතො, දන්නාලද්දේය.

('සචෙච්චමයන්තාදිසු' යන මෙහි ආදිග්‍රහණයෙන් 'වුච්ච තානුපනරං චිත්තං චත්තාප්‍රසච්ඡං තිච" යන ආදින් ගැණේ–දෙවන උදාහරණයෙහි "විචිකිච්ඡා චිතෙතාච" යන අභිධම්ම ර්ථසඞ්ග්‍රහ පාඨය උදාහරණකරත්නාහු විසින් ගාථාබන්ධනසු ඛය පිණිස 'විචිකිච්ඡා පනච' යනු කියනලද්දේය—ශ්‍රුතිදු ඉන්ශබ්දය නිදශිනාර්ථද ඇත්ර්ථද වේ– ඒ අර්ථයෙන් 'සුනං ඛිසුච' යන ආදින් ගැණේ)

42 යොපනාහික්ඛු ඉනි අදො, යොපනාභික්ඛු යන ආදියෙහි; පනසද්දො, පනශබ්දයතෙම; පදපූරණකො, පදපූරණයයි; මතො, දන්නාලද්දේය; පති‍තොච පන ඉනි, පති‍තොචපන යන; ආදො, මේ ආදියෙහි; අවධාරණෙ, අවධාරණාර්ථ වේ.

(දැන් එවශබ්දයාගේ අර්ථදක්වනු පිණිස "නියමෙච" යන ආදිය කිය)

43 එවසද්දො, එවශබ්දයතෙම; නියමෙව, නියමයෙහිද; අ

——❋0❋——

44 එවසහිත පදස්ස, පෙක්ඛිතං යං පදං භවෙ
යො තං තෙන නියමෙති, නියමොති හි සො මතො—

45 සද්දෙන යෙනට්ඨිතොච, දබ්බ ගුණ ක්‍රියාහි ච
යො නිවත්තෙති තදඤ්ඤංහි, සොවධාරෙති වුච්චතෙ—

46 නිච්ඡිතබ්බස්ස යො අත්ථො, ගුණ දබ්බ ක්‍රියාහිච
යො නිච්ඡතෙව සඤ්ඤා, සො,සන්නිට්ඨානො විභාවිතො—

---

වධාරෙච, නිවෘත්තනාවධාරණාර්ථයෙහිද; සන්නිට්ඨානෙ, සනිටුහනෙහිද; පදපූරණමත්තෙ අපි, පදපූරණමාත්‍රයෙහි ද වැටේයයි විභාවිනා, ප්‍රාඥයාවිසින්; පවුච්චතෙ, කියනු ලැබේ—

('පදපූරණමත්තපි' යන මෙහි පිශබ්දය චශබ්දාර්ථයි හේ සමුච්චයාර්ථයි)

(මෙසේ එවශබ්දයාගේ අර්ථය ස්වරූපයෙන් දක්වා ඔවුන් අතුරෙන් නියමස්වභාවලක්‍ෂණය දක්වන්නේ '**එවසහිතපදස්ස**' යන ආදි ගාථාව කිය)

44 යංපදං,යම්(ප්‍රධාන)පදයෙක්තෙමේ; එවසහිතපදස්ස,(අප්‍රධානවූ) එවශබ්දයසහිතවූ පදයාගේ අර්ථය; පෙක්ඛිතං භවෙ, අපෙක්‍ෂාකරන්නේ වේද; යො, යම් එවශබ්දයෙක් තෙමේ; තං, ඒ (ප්‍රධානවූ) පදාර්ථය; තෙන, ඒ (අප්‍රධානවූ) පදාර්ථයෙන්; නියමෙති, නියම කෙරේද; සො, හේතෙමේ; නියමො ඉතිහි, නියමයයිම; මතො, දන්නාලද්දේය—

(දැන් අවධාරණය දක්වන්නේ '**සද්දෙන යෙන**' යන ආදි ගාථාව කිය)

45 යො, යම් එවශබ්දයෙක්; ගුණදබ්බක්‍රියාහිච, ගුණද්‍රව්‍ය ක්‍රියාවන් අතුරෙන්; යෙන සද්දෙන, යම් ශබ්දයක් හා; ඨිතොච, පැවැත්තේද; තං, ඒ ශබ්දය; අඤ්ඤංහි, අන්‍යශබ්දයන්කෙරෙන්; නිවත්තෙති, වලකාද; සො, හේ; අවධාරෙ ඉති, අවධාරණයයි; වුච්චතෙ, කියනුලැබේ—

46 යො අත්ථො, යම් අර්ථයෙක් තෙමේ; ගුණදබ්බක්‍රියාහිච, ගුණද්‍රව්‍ය ක්‍රියාවලින්ද; නිච්ඡිතබ්බො අස්ස, සනිටුහන්කට

---

**47** ජත්තිංසෙව විපාකානි, ඉදං පුබ්බනිදස්සනං
නිසෙසා ධනුබ්බරො එව, ඉච්චාදි පරදස්සනං—

**48** මත්තමෙවානි පනෙත්ථ, මත්තසද්දො'ව ධාරණෙ
එවසද්දො සන්නිට්ඨානෙ, යථෙවාති විග්ගහෙ—

**49** සමුච්චයෙ විකප්පනෙථ, සම්පිණ්ඩනෙ පවත්තතෙ
අනුකඩ්ඪනෙ චසද්දො, යථා යොගං පකාසයෙ—

---

යුක්තතේ වේද; යො, යම් එවශබ්දයෙක්තෙමෙ; නිවජති, (අන්‍යගුණද්‍රව්‍ය ක්‍රියාසඞ්ඛ්‍යාත විශෙෂයෙන්) සන්‍නිවුහන්කෙරේද; සො එවසද්දො, ඒ එවශබ්දයතෙම; සන්නිට්ඨානො, සන්නිවුහනැයි; විභාවිතො, ප්‍රකාශ කරණලද්දේය—

(මෙසේ ඔවුන්ගේ ලක්‍ෂණය දක්වා '**ජත්තිංසෙව විපාකානි**' යන ආදියෙන් උදාහරණ කිය)

**47** ජත්තිංසෙවවිපාකානි, ජත්තිංසෙවවිපාකානි යන; ඉදං, මේ; පුබ්බනිදස්සනං, පූර්‍ව නියමාර්ථඑවශබ්දයට උදාහරණය; නිසෙසාධනුබ්බරො එව ඉති, නිසෙසාධනුබ්බරො එව යන; ආදි, මේ ආදිය; පරදස්සනං, අනික් අවධාරණාර්‍ථ එවශබ්දයට නිදර්‍ශිතයි—

("ජත්තිංසෙව" යන මෙහි එවශබ්දය අස්ථානප්‍රයුක්තයි— "ජත්තිංසෙව විපාකානි ක්‍රියාචිත්තානි වීසති" යන මෙහි පර වීසතිශබ්දය ගෙණ එවශබ්දයහා සම්බන්ධ කටයුතු)

(සන්නිට්ඨානොදාහරණය "**මත්තමෙවානි පනෙත්ථ**" යන ආදියෙන් දක්වයි)

**48** මත්තමෙව ඉති, මත්තමෙව යන; එත්ථ පන, මෙහි වනාහි; මත්තසද්දො, මත්තශබ්දයතෙම; අවධාරණෙ, අවධාරණයෙහි වේ; යථෙව ඉති, යථෙව යන මෙහි; එවසද්දො, එවශබ්දයතෙම; සන්නිට්ඨානෙ, සන්නිවුහන්හි වේයයි; විග්ගහෙ, අර්‍ථවිග්‍රහයෙහි කියනලද්දේය—

(මෙසේ එවශබ්දයාගේ අර්‍ථයන් දක්වා චශබ්දයාගේ යට කියනලද අර්‍ථයන්හි පමණක් නොව වෙනත් අර්‍ථයන්හි වැටෙන බව දක්වන්නේ "**සමුච්චයෙ විකප්පනෙ**" යන ආදිය කිය)

**49** චසද්දො, චශබ්දයතෙම; සමුච්චයෙ, සමුච්චයාර්ථයෙ

---

50 පදවාක්‍යවසෙනාපි, සමුච්චයො ද්විධා මතො
වුත්තා වුත්ත මුභින්නඤ්ච, වසෙනාපි තිධා පුන—

51 සමාන විභත්තිකානං, පදානං හි සමුච්චයො
පද සමුච්චයො සොච, තිස්සො ඵුස්සොච ගච්ඡති—

---

හිද; විකප්පනෙ, විකල්පාර්ථයෙහිද; සම්පිණ්ඩනෙ, සම්පිණ්ඩනාර්ථයෙහිද; අනුකඩ්ඪනෙ, අනුකඩ්ඪනාර්ථයෙහිද; යථායොගං, යෙදෙනපරිද්දෙන්; පවත්තතෙ, පවතියි; පකාසයෙ, ප්‍රකාශ කරන්නේය—

(සමානවිභක්තිඇත්තාවූ සමානක්‍රියාවන්ගේ හෝ සමාන පදයන්ගේ හෝ ග්‍රහණතුල්‍යයොගය සමුච්චය නම් වේ)

(ඒ සමුච්චයාගේ භෙදය දක්වන්නේ '**පදවාක්‍යවසෙනාපි**' යන ආදිය කිය)

50 සමුච්චයො, සමුච්චයතෙම; පදවාක්‍යවසෙන අපි, පද වාක්‍යයන්ගේ භෙදයෙන්ද; ද්විධා, දෙපරිද්දකින්: මතො, ද න්නාලද්දේය; පුන, නැවත; වුත්තා, උක්තසමුච්චය; අවුත්ත, අනුක්තසමුච්චය; උභින්නංච, උක්තානුක්තසමුච්චය යන මො වුන්ගේ වනාහි; වසෙන අපි, භෙදයෙන්ද; තිධා, තුන්පරිද් දකින් වේ—

(මෙසේ පඤ්චප්‍රකාර සමුච්චය දක්වා දැන් ප්‍රථමච්ඡිද්ධභෙදයා ගේ ලක්ෂණද උදාහරණද පළමුකොට දක්වන්නේ '**සමාන විභත්තිකානං**' යන ආදි ගාථාමය කිය)

51 සමානවිභත්තිකානං, සමානවිභක්තිඇත්තාවූ; පදානං හි, පදයන්ගේ වනාහි; සමුච්චයො, එක්කොටගැන්ම; පදස මුච්චයො, පදසමුච්චය නම් වේ; සො එව, හෙම; තිස්සො ඵුස්සොච ගච්ඡති, තිස්සො ඵුස්සොච ගච්ඡති යනු වේ—

(මෙහි ත්‍රිපාදයකින් හා අර්ධයකින් පදසමුච්චය ලක්ෂණය කි යනලදී—සතරවන පාදයෙන් හා අර්ධයෙන් උදාහරණ දක්ව නලද්දී දතයුතු—'තිස්සොච'යී කිවම්නාතන්හි චශබ්දයහට ලොප් කොට 'තිස්සො' යී කියනලදී—'තිස්සො ච ඵුස්සො ච ගච්ඡති—සත්ථා ච සාරිපුත්තො ච ධම්මං දෙසෙති' යනු පාඨයි)

---

52 ක්‍රියායපි සහිතානං, පදානඤ්ච සමුච්චයො
වාක්‍ය සමුච්චයො සොයං, ධම්මං සංඝඤ්ච ත්‍යාදිසු—

53 පච්චක්ඛවුත්ත මත්ථානං, යෙඃයෙහ වුත්ත සමුච්චයො
ථේරො ච දහරොචෙව, පිණ්ඩාය චරන්තිති ච—

---

52 ක්‍රියාය අපි, ක්‍රියාවහාද; සහිතානං, යුක්තවූ; පදානංච, පදයන්ගේද; සමුච්චයො, එක්කොටගැන්ම; වාක්‍යසමුච්ච යො, වාක්‍යසමුච්චයනම්; සොඅයං, ඒ මේ වාක්‍යසමුච්චය තෙම්; ධම්මං සඞ්ඝංච ඉති, ධම්මං සඞ්ඝඤ්ච යන, ආදිසු; මේ ආදියෙහි වේ—

(මෙහි තුන් පාදයකින් වාක්‍ය සමුච්චය ලක්‍ෂණය කියන ලදී—සතරවන පාදයෙන් උදාහරණ දක්වනලදී—ධම්මංවයී කිච්චනාතන්හි චශබ්දය ලොප් කොට 'ධම්මං' යී කියන ලදී—මෙහි ආදිග්‍රහණයෙන්—

"සෙඨං තිලොක මහිතං අභිවන්දි යග්ගං
බුද්ධඤ්ච ධම්මමමලං ගණ මුත්ත මඤ්ච"

යන ආදිය ගැණේ—

"සාසනස්ස ච ලොකස්ස, වුඩ්ඪි භවතු සබ්බදා
සාසනම්පි ච ලොකඤ්ච, දෙවා රක්ඛන්තු සබ්බදා"

යන මේ ආදියෙහිද චශබ්දය වාක්‍යසමුච්චය නම් වේ—

"යක්ඛා දෙවාච බ්‍රහ්මනො—සබ්බෙ තං අනුමොදිංසු" යන ආදියෙහි චශබ්දයතෙම පදසමුච්චය නම් වේ—ප්‍ර ථමාන්තපදයා කෙරෙන් පරවූ චශබ්දය පදසමුච්චය න ම්—විතියාන්ත පදයා කෙරෙන් පරවූ චශබ්දය වාක්‍යස මුච්චය නම්)

(මෙසේ ද්විප්‍රකාර සමුච්චය දක්වා ත්‍රිප්‍රකාර සමුච්චයාගේ ලක්‍ෂණද උදාහරණද දක්වන පිණිස **'පච්චක්ඛ වුත්තම ත්ථානං'** යන ආදිය ගාථාත්‍රය කීය)

53 පච්චක්ඛ වුත්ත මත්ථානං, ප්‍රත්‍යක්‍ෂ වශයෙන් කියනලද අර්ථ ඇති පදයන්ගේ; වුත්ත සමුච්චයො, උක්ත සමුච්චය

———※○※———

54 නොචමාදිහි සුත්තස්මිං, සොචා වුත්තසමුච්චයො
සසඤ්චාගමා වුත්තස්සාපි, ගය්හතො ඤෙය්‍ය මීදිසං—

55 ආදිතො ඔච ඉච්චාදෙ, වුත්තා වුත්ත සමුච්චයො
අමාදෙසස්සඤ්ඤාදෙසං, ආදිතො චෙව ගය්හතො—

---

තෙම; ඤෙයෙ‍්‍යා, දතයුත්තේය; ථෙරෙ ච දහරෙ චෙව පිණ්ඩාය චරන්ති ඉතිච, ථෙරෙරුව දහරෙරුව එව පිණ්ඩාය චරන්ති යනුද නිදර්ශනයි—

('චෙව' යන මෙහි චශබ්දය සමුච්චයාර්ථයි-එවශබ්දය පදපූරණයි—'ඉතිච' යන මෙහි ඉති ශබ්දය නිදර්ශනාර්ථද අඬඝාර්ථද වේ)

54 නොච මාදි ඉති සූත්තස්මිං, නොචමාදිතො යන සූත්‍රයෙහි; සොච, ඒ චශබ්දයතෙම චනාහි, අවුත්ත සමුච්චයො, අනුක්තසමුච්චය නම් වේ; සසං ඉති ආගම අවුත්තස්ස අපි, (සූත්‍රයෙහි) නොකියන ලද සසං යන ආගමයාගේද; ගය්හතො, ගතයුතුහෙයින්; ඊදිසං, මෙබඳු උදාහරණය, ඤෙය්‍යං, දතයුත්තේය—

(මෙහි 'සසං ඉති ආගම' කියා පදච්ඡේදයි—නිග්‍රහීතයා කෙරෙන් පර ඉකාරයගට ලෙප්ද තිකාරයහට චකාරදකොට 'සසඤ්චාගම' යී සන්ධි වේ—අපි ශබ්දය සම්භාවනාර්ථයි—එහින් මේ සූත්‍රයෙන් හුදෙක් නකාරාගමද නොවේ ඉක්බිතිව සසං යන ආගමද වේ යයි දක්වයි—'ඤෙය්‍ය මීදිසං' යන මෙයින් ආදිශබ්දයාගේ අර්ථය දක්වයි—'නොච මාදිතො' යන මෙහි ඉති ශබ්දය අඬඝාර්ථයි)

58 ආදිතො ඔච ඉති, ආදෙ, ආදිතොඔච යන මේ ආදි සූත්‍රයෙහි; (චශබ්දයතෙම) වුත්තාවුත්තසමුච්චයො, උක්තා නුක්ත සමුච්චයනම් වේ; ආදිතො ච එව, ආදිශබ්දයා කෙරෙන්ද; අමාදෙසස්ස, අංයන ආදෙසයාගේද; අඤ්ඤාදෙසං, අනික් (ආආදි) ආදෙශයන්ගේද; ගය්හතො,ගතයුතු හෙයිනි—

('ඉච්චාදෙ' යන මෙහි ආදි ශබ්දයෙන් 'සුඛිතාසුච' යන ආදින් ගැණේ—'චෙව' යන නිපාත සමුදායතෙම සමුච්චයෙහි වැටේ-එයින් 'අඤ්ඤස්මාපි' යන පදය සමුච්චය කෙරේ)

56 වාසද්දත්ථොපි චසද්දො, දිස්සතෙ සො විකප්පනෙ
බාධන්ති තාපෙන්ති චාති, සඞ්කිලෙසත්තිකෙ මතො—

(මෙසේ චශබ්දයාගේ සමුච්චයාර්ථය දක්වා විකල්පාර්ථය දක්වන්නේ '**වාසද්දත්ථොපි චසද්දෙ**' යනා දිය කිය)

56 අපි, අනිස්පසඤ්ඤත්තියයි; වාසද්දත්ථො, වාශබ්දාර්ථය අර්ථකොට ඇත්තාවූ; නොහොත් වාශබ්දාර්ථවූ, චසද්දො, චශබ්දයෙක්; දිස්සතෙ, දක්නාලැබේ; සො, හේ, විකප්පනෙ, විකල්පාර්ථයි, සංක්ලෙසත්තිකෙ, සංකිලෙසත්‍රිකයාගේඅර්ථකථාවෙහි; බාධන්තිතාපෙන්තිච ඉති, බාධන් තාපෙන්තිච යනා දිය; මතො, දන්නාලද්දේය—

('වාසද්දස්ස අත්ථො වාසද්දත්ථො' වාසද්දස්ස; වාශබ්දයාගේ අත්ථො, අර්ථයතෙම; වාසද්දත්ථො, වාසද්දත්ථනම් (හේ විකල්පාර්ථයි) ''වාසද්දො අත්ථො එතස්සාති වාසද්දත්ථො'' වාසද්දත්ථො, වාශබ්දාර්ථය; අත්ථො, අර්ථවූයේ; එතස්ස ඉති, මොහටයි; වාසද්දත්ථො, වාසද්දත්ථනම්—එක් අන්‍යශබ්දයක්හට ලොප් වේ-''වාසද්දත්ථො එතස්ස අත්ථිවා වාසද්දත්ථො'' වාසද්දත්ථො, වාශබ්දයාගේ අර්ථය; එතස්ස, මොහට; අත්ථිවා, ඇත්තේනුයි හෝ; වාසද්දත්ථො, වාසද්දත්ථනම්—මෙහි පිශබ්දය පදාන්තරාර්ථයි සම්භාවනාර්ථහෝ වේ—''විකප්පනං විසුං අත්ථස්ස පටිපාදනං විකප්පො'' විකප්පනං යි සේයි; විසුං, වෙන් කොට; අත්ථස්ස, අර්ථයාගේ; පටිපාදනං, ප්‍රතිපාදනය කිරීම; විකප්පො, විකප්පනම්—''විකප්පො එව අත්ථො විකප්පත්ථො'' විකප්පො එව, විකල්පයම; අත්ථො, අර්ථවූයේ; විකප්පත්ථො, විකප්පත්ථනම්—''සඞ්කිලෙසෙන්ති සංකිලෙසො'' සංකිලෙසෙති ඉති, කිලුටු කෙරේනුයි; සංකිලෙසො, සංකිලෙසනම්—'විබාධන්ති උපතාපෙන්ති ච' යනු **අර්ථසාලිණී** පාඨයි- මෙහි. ''සංකිලෙසසද්දො විබාධනං වා උපතාපනං වා වදතීති චසද්දො වාසද්දත්ථො'' යි කියනලද්—'චාති' යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ)—

(මෙසේ චශබ්දයාගේ විකල්පාර්ථය දක්වා සම්පිණ්ඩනාර්ථය දක්වන පිණිස '**සසුතෙන පිණ්ඩයෙ**' යනා දිය කිය)

57 සඤ්ඤොත පිණ්ඩයෙ අත්ථං, සම්පිණ්ඩන මුදීරිතො
ලොපඤ්ච තත්‍රාකාරොති, ජානිතබ්බං විචක්ඛණා—

58 පරස්මිං නානුවත්තත්ථං, කඩ්ඪනං පුබ්බසුත්තතො
අනුකඩ්ඪන විඤ්ඤෙය්‍යං *, පුබ්බෙබාචාති නිදස්සනා—

---

57 සඤ්ඤොත, සකාරසූත්‍රයෙහි; (චශබ්දයතෙම) අත්ථං,(දෙවන) අර්ථය; පිණ්ඩයෙ, පිඩු කරන්නේය; සම්පිණ්ඩනො, සම්පිණ්ඩනයයි; උදීරිතො, කියලනද්දේය; ලොපඤ්ච තත්‍රාකාරෙ ඉති, ලොපඤ්චතත්‍රාකාරෙ යන උදාහරණය; විචක්ඛණා, පණ්ඩිතයන් විසින්; ජානිතබ්බං, දතයුත්තේය—

("සම්පිණ්ඩන මුදීරිතො" යන මෙහි "සම්පිණ්ඩනො උදීරිතො" යී සිටුවා **යවමදාදි** සූත්‍රයෙන් මකාරාගම කොට "**ලොපඤ්ච තත්‍රාකාරො** යන සූත්‍රයෙන් ඔකාර ලොප් කොට අකාරාගම කොට රූපසිද්ධි වේ—'විරාගො තෙසං අග්ග මක්ඛායති' යන ආදියෙහි මෙනි—'තත්‍රාකාරොති' යන මෙහි ඉති ශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ—ඒ ආද්‍යර්ථයෙන් "තතො නමම්පහිම්හා ලුතෙතච සමාසෙ—සනතසද්දස්ස සොපෙ බොධෙතනා" යන ආදින් ගැණේ—'විචක්ඛණා' යනු තෘතියාර්ථයෙහි ප්‍රථමායි)

(මෙසේ චශබ්දයාගේ සම්පිණ්ඩනාර්ථය දක්වා ඔහුගේ අනුකඩ්ඪනාර්ථය දක්වනපිණිස '**පරස්මිං නානුවත්තත්ථං**' යන ආදිය කිය)—

58 පුබ්බසුත්තතො, පූර්වසූත්‍රයෙන්; පරස්මිං, පරසූත්‍රයට; නානුවත්තත්ථං, නොවැටීමපිණිස, කඩ්ඪනං, ඇදීම; අනුකඩ්ඪනං, අනුකඩ්ඪනයයි; විඤ්ඤෙය්‍යං, දතයුත්තේය; පුබ්බෙබා ච ඉති, පුබ්බෙබාච යන ආදිය, නිදස්සනං, නිදර්ශනයී—

('අනුකඩ්ඪන විඤ්ඤෙය්‍යං' යන මෙහි නකාරයාතෙරෙන් පරවූ නිග්ගහීතහට ලොප් වේ—"**පුබ්බෙබාචාති**" යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ—ඒ ආද්‍යර්ථයෙන් "පසඤ්ඤස්සච—සබ්බනාමානං නම්හිච" යන ආදින් ගැණේ)

---

* අනුකඩ්ඪන විඤ්ඤෙය්‍යොති පොත්තෙසු,

59 සමුච්චයෙ අපෙක්ඛච සම්භාවනෙච නින්දනෙ
පිසද්දො අපිසද්දොච, චතුවත්ථෙසු පකාසිතො—

(මෙසේ චශබ්දයාගේ අර්ථයා සමග උදාහරණ දක්වා පිශබ්ද අපි ශබ්දයන්ගේද අර්ථෝදාහරණයන් දක්වනු පිණිස **'සමුච්චයෙ අපෙක්ඛච'** යන ආදිය කිය)

59 පිසද්දො, පිශබ්දයද, අපිසද්දොච, අපිශබ්දයද, සමුච්චයෙ, සමුච්චයාර්ථයෙහිද, අපෙක්ඛච, අපෙක්ෂාර්ථයෙහිද; සම්භාවනෙච, ප්‍රශංසාර්ථයෙහිද, නින්දනෙ, ගර්හාර්ථයෙහිද, (යන) චතුවත්ථෙසු, සතරඅර්ථයන්හි (වෙයයි) පකාසිතො, ප්‍රකාශ කරණ ලද්දේය—

("මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡාන ගතායපි" යන ආදියෙහි පිශබ්දය සමුච්චයාර්ථයෙහි වැටේ— "අයම්පි පාරාජිකො හොති- අයම්පි ධම්මො අනියතො" යන ආදියෙහි අපෙක්ෂාර්ථයෙහි වැටේ—

"මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස, නමත්තං ආගමිස්සති
උදබින්දුනිපාතෙන, උදකුම්භොපි පූරති"

යන ආදියෙහි ප්‍රශංසාර්ථයෙහි වැටේ—"නොපි පතීරයෙථ" යන ආදියෙහි ගර්හාර්ථයෙහි වැටේ—හුදෙක් සතරඅර්ථයන්හිම නොවැටේ ඉක්බිති "සොපි සඞ්ඝභෙදො—තත්ථ පි ඛන්ධාදි හෙව නියමෙතබ්බා වුත්තෙන" යන ආදියෙහි සම්පිණ්ඩනයෙහිද වැටේ—අපි ශබ්දයතෙම "සබ්බම්පි ධම්මසඞ්ඛාණිං කාථයාම" යන ආදියෙහි සමුච්චයාර්ථයෙහි වැටේ —"අක්ඛරපාදයො එකචත්තාළීසං" යන ආදියෙහි අපෙක්ෂාර්ථයෙහි වැටේ— සො පඤ්ඤෙය්‍යොපි—එකස්සාපි මග්ගස්සච ඵලස්සච භඞ්ගක්ඛණෙ සමඞ්ගිනො උභයකොට්ඨාස භාජනතො" යන ආදියෙහි ප්‍රශංසාර්ථයෙහි වැටේ—,'ඉමිනා පි බ්‍යඤ්ජනෙන තස්සෙව ත්‍ථස්ස සම්භවතො ති ඉද මෙවං නසක්කා වත්තුං" යන ආදියෙහි ගර්හාවෙහි වැටේ—හුදෙක් මේ අර්ථයන්හිම නොවැටේ ඉක්බිතිව සම්පිණ්ඩනාර්ථයෙහිද අවධාරණාර්ථයෙහිද වැටේ—"පටිසන්ධිචිත්තස්සාපි භඞ්ගක්ඛණස්ස ගහණං දට්ඨබ්බං" යන ආදියෙහි සම්පිණ්ඩනාර්ථයෙහි වැටේ—"අඝොරස්ස මෙකවචනයොස්වපිච" යන ආදියෙහි අවධාරණාර්ථයෙහි වැටේ)

———✻○✻———

60 ඨානයොගො අයොගොච, සමුච්චයො විධා මතො
දානඤ්ච දානබ්බත්තාදි, කටඤ්ඤුතා රූපන්තිච—

61 පුබ්බෙ වුත්තඤ්ච යො අත්ථං, පච්ඡිමන්තෝපි පෙක්ඛතෙ
අයම්පි පාරාජිකොති, ඤෙය්‍යො සො චෙව පෙක්ඛණො—

---

(දැන් සමුච්චය ප්‍රභේදය දක්වන්නේ '**ඨානයොගො අයොගොච**' යන ආදි ගාථාව කීය)

60 සමුච්චයො,සමුච්චයතෙම; ඨානයොගො,ස්ථානයොගය ද;අයොගොච,අස්ථානයොගයදැයි; විධා,දෙපරිද්දකින්; මතො, දන්නාලද්දේය; දානඤ්ච දානබ්බං ඉති ආදි, දානඤ්චදානබ්බං යන ආදියද; කටඤ්ඤුතාරූපං ඉති ච, කටඤ්ඤුතාරූපං යන ආදියද නිදර්ශිතයි—

(මෙහි තමා සමුච්චයකටපූනුයයි කියනලද ස්ව ස්ථානයෙහි යෙදූයේ ස්ථානයොගනම්—ස්වස්ථානයෙහි නොයෙදුනේ අස්ථානයොගනම්—ස්ථානප්‍රයුක්තයයිද අස්ථානප්‍රයුක්තයයිද ඔවුන්ටම නම්හුයි—මෙහි ආදිශබ්දයෙන් ''බහූ දෙවා මනුස්සා ච—අසෙවනාච බාලානං'' යන ආදිය ගැණේ—'රූපන්තිච' යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ—ආද්‍යර්ථයෙන් ''පණ්ඩිතානඤ්ච සෙවනා—පුබ්බෙච කතපුඤ්ඤතා'' යන ආදිය ගැණේ)

(දැන් අපෙක්ෂාලක්ෂණයද උදාහරණද දක්වන්නේ ''**පුබ්බෙ වුත්තඤ්ච යො අත්ථං**'' යන ආදිය කීය)

61 යොපච්ඡිමන්තොපි,යම් පශ්චිමාර්ථයෙක්තෙමේද;පුබ්බෙ, පෙර; වුත්තංච, කියනලද්දාවූද; අත්ථං, අර්ථය; පෙක්ඛතෙ, බලාද්; සොච එව, ඒ පශ්චිමාර්ථයද වනාහි; පෙක්ඛණො, අපෙක්ෂාර්ථද්‍යොතක නම් වේ; අයම්පිපාරාජිකො ඉති, අයම්පි පාරාජිකො යන ආදිය; ඤෙය්‍යො, දතයුත්තේය—

('පච්ඡිමන්තොපි' යන මෙහි පිශබ්දය අපෙක්ෂාද්‍යොතක නම් වේ'පෙක්ඛතෙ' යන මෙහි පකාරය ආගමසන්ධිජයි-'චෙව' යන මෙහි චශබ්දය පදශබ්දාර්ථයි—එවශබ්දය සමුච්චයාර්ථයි—'අයම්පි' යන මෙහි පිශබ්දය අපෙක්ෂාර්ථද්‍යොතකනාම්—'පාරාජිකොති' යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ)

62 වාඅථවානි විකප්පො, වුත්තො පුබ්බාවලම්පකො
පරිච්චාගෙපි භාසන්ති, පණ්ඩිතා නයකොවිදා.—

---

62 වාඅථවා ඉති, වා අථවා යන නිපාතයුග්මයතෙම; විකප්පො, විකල්පාර්ථ වේ; පුබ්බාවලම්පකො, පූර්වනයනොහරණේයයි; වුත්තො, කියනලද්දේය; පි, නොහොත්; පරිච්චාගෙ,පරිත්‍යාගයෙහි පවත්නේයයි; නයකොවිදා,නයෙහි දක්ෂවූ; පණ්ඩිතා, පණ්ඩිතයෝ; භාසන්ති, කියත්.—

("පුබ්බිනයං අවලම්පයති නපරිච්චජතීති පුබ්බාවලම්පකො" පුබ්බිනයං, පූර්වනය; අවලම්පයතීයි සේයි, නපරිච්චජති ඉති, නොහරින්නුයි; පුබ්බාවලම්පකො, පුබ්බාවලම්පකනම්- "පූන නයස්ස පරිච්චජනං පරිච්චාගො" තස්මිං පරිච්චාගෙ— පූන, නැවත; නයස්ස, නයයාගේ; පරිච්චජනං, හැරීම; පරිච්චාගො, පරිච්චාගනම්—මෙහි පිශබ්දය අථවාශබ්දයාගේ අර්ථයි—"සද්දානං වත්තිච්ඡාවසෙන නයනං අත්ථස්ස ඤාපනං නයො" සද්දානං, ශබ්දයන්ගේ; වත්තිච්ඡාවසෙන, වක්තෲච්ඡාවශයෙන්; නයනං යී සේයි; අත්ථස්ස, අර්ථයාගේ; ඤාපනං, හැඟවීම; නයො, නයනම්—"නයස්මිං කොවිදා නයකොවිදා" නයස්මිං, නයයෙහි; කොවිදා, දක්ෂවූවෝ, නයකොවිදා, නයකොවිද නම් වෙත්)—"අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා—කුච්ජිතානං සානතො තනුකරණතො ඤාණං කුසං නාම තෙන කුසෙන ලාතබ්බා පවත්තෙතබ්බා කුසලා—ධාතුකථාපකරණං දෙසෙන්තො භගවා යස්මිං සමයෙ දෙසෙසි තං සමයං දස්සෙතුං ව්‍යාඛ්‍යානන්තරං දෙසිතස්ස පකරණස්ස ධාතුකථාභාගත්ථං දස්සෙතුං වා අට්ඨාරසහිති ආදිමාහ" යන මෙහි විකල්පාර්ථය පූර්වාවලම්පකනම්—"තණ්හාචරිතා රූපවන්තං අත්තානං උපගච්ඡන්ති අත්තනිවා රූපං රූපස්මිං වා අත්තානන්තිච එතෙනතංගහනා පන අසමාධිසභාවා සාමඤ්ඤසද්දෙනෙව සාමඤ්ඤවිසෙසසද්දෙහිච සමාධිසභාවාති විධාන්‍යෙන එතෙනතංගහනා අසාධාරණාචෙව අප්පවිසයාච, ඉමං උද්දෙසං න අරහති අඤ්ඤාපිචා ඵස්සාදීනං විය පාකටත්තා භාවතො අඤ්ඤධම්ම නිස්සයෙන වත්තබ්බතොච සා ජීවිතින්ද්‍රියඤ්ච න අරහති" යන මේ ආදියෙහි පූර්වනයපරිත්‍යාගනම්—මෙහි පිශබ්දය ගහිතාර්ථයි—අථවා ශබ්දයතෙම "සාසනස්ස පට්ඨානන්ති සාස

63 වසද්දතෙථාපි වාසද්දෙ, දිස්සතෙ සො සමුච්චයො
අභිධම්මං විනයං වා, දෙසෙතීති නිදස්සනං—

නාපට්ඨානං සාසනං දෙසනාසාසනෙ වෙනෙය්‍ය ජ්ඣාසයා නුරූපං තෙසං හිත සුඛ නිප්ඵාදනත්ථං පකාරෙහි ඨානං පවත්ති සාසනපට්ඨානං—අථවා සාසනං අධිසීලසික්ඛාදයො ධම්මා තෙසං පවත්තානුපායසභාවතො පතිට්ඨිතානි සා සනපට්ඨානානිසංස කිලෙසභාගියාදී ධම්මානිච අවත්වා යථා සබ්බාපි—පෙ—සමාතිකානි අයං ධාතු කථා මාතිකානොති වා වුත්තං එවං අවත්වානි අත්ථො—අථවා එවං අවත්වානි යථා සබ්බාපි—පෙ—මාතිකාති එතෙන වචනෙන ධාතුකථාතො බහිභූතා කුසලාදී අරණන්තා මාතිකා පකරණනන්තරතො වුත්තා, එවං අවත්වා—එකවීසසතංවාථ විභජන්ති විචක්ඛණා'' යනා මේ ආදියෙහි ජිකල්ලාඣය පූර්වාවලම්පක නම් වේ- ''තත්ථ තදෙවාති එවසද්දෙන තං කදාචි අසඞ්ගහිතෙන සඞ්ගහිතං නහොතීති උද්දෙසොව අසඞ්ගහිතෙන සඞ්ගහිතන්‍යාවෙන නියමං අඤ්ඤස්සච අනියතතං දස්සෙතීති දට්ඨබ්බං, අථවා තදෙවාති පුච්ඡාය උබ්බටමේව එවං පකාර මෙව ගුත්වා යෙහි අසඞ්ගහිතානති තස්සා පුච්ඡාය උබ්බභා වෙන එවං අසඞ්ගහිතෙන සඞ්ගහිතභාවනියමත්ථො එවස දෙදා, න අඤ්ඤස්ස අසඞ්ගහිතතා නිවාරණත්ථොති දට්ඨබ්බා'' යන ආදියෙහි පූර්වනය පරිත්‍යගාඣිනම්)

(නැවත අනිකුදු වාශබ්දාඣයක් දක්වනු පිණිස ''**වසද්ද තෙථාපි වාසද්දෙ**'' යන ආදිය කිය)

63 අපි, වැලිදු; වසද්දතෙථා, වශබ්දයාගේ අඣඇත්තාවූ; වාසද්දෙ, වාශබ්දයෙක්; දිස්සතෙ, දක්නාලැබේ; සො, හේ තෙමේ; සමුච්චයො, සමුච්චයාඣ නම් වේ; අභිධම්මං විනයං වා දෙසෙති ඉති, අභිධම්මං විනයං වා දෙසෙති යනු; නිදස්ස නං, උදාහරණයී—

(මෙහි ඉතිශබ්දය නිදශීනාඣද අඤාඣද වේ—ඒ අඤාඣයෙ න්''රාජතො වා චොරතො වා—පෙ—නානාඋපද්දවතො වා ආරක්ඛං ගණ්හාන්තු—යානිධභූතානි සමාගතානි භුම්මානිවා යානිව අන්තලික්ඛෙ'' යන ආදිත් ගැණේ)

64 අපිච අපරෙ මෙච, වුත්තා තෙ නාවවලම්පකා
නානත්ථ විකප්පත්ථාච, ජානිතබ්බා සුධිමතා.

65 කිඤ්චාපි යදිපි යත්ථ, කාමඤ්චාපි සචෙද, හවෙ
පුච්ඡාච චොදනා භොගා, ජානිතබ්බා තහිං සදා.

---

(දැන් අනිකුදු විකල්පාර්ථනිපාතශබ්දයන් දක්වන්නේ '**අපිච අපරෙ මෙච**' යන ආදිය කිය)

64 අපිච, වැලිදු; අපරෙ, අන්‍යවූ; මෙ, (ච පන යන) නිපාතයෝ දෙදෙන; අවලම්පකා, පූර්වනයාවලම්පකවෙත්යයි; න වුත්තා, (ප්‍රාඥයන් විසින්) නොකියනලද්දාහුය; ච, මේ වචනය සැබව; තෙ, ඒ නිපාතයෝ දෙදෙන; සුධිමතා, සුප්‍රාඥයාවිසින්; නානත්ථවිකප්පත්ථාච, නානාර්ථවිකල්පාර්ථඇත්තාහුමයයි; ජානිතබ්බා, දතයුත්තාහුය.

('මෙච' යන මෙහි චශබ්දය දළ්හීයද්‍යෝතකයි; 'නානත්ථ විකප්පත්ථාච' යන මෙහි චශබ්දය ඒවශබ්දාර්ථයි)

(දැන් යම් නිපාතශබ්දයකින් පෘච්ඡාචොදනා ආභොගයෝ දන්නාලැබෙද්ද ඒ නිපාතශබ්දයන් දක්වන්නේ "**කිඤ්චාපි යදිපි යත්ථ**' යන ආදි ගාථාව කිය)

65 යත්ථ, යම් වාක්‍යයෙක්හි; කිඤ්චාපි, කිඤ්චාපිශබ්දය හෝ; යදිපි, යදිපිශබ්දය හෝ; කාමඤ්චසචෙද අපි, කාමඤ්ච ශබ්දය හෝ; හවෙ, වන්නේද; තහිං, ඒ වාක්‍යයෙහි; පුච්ඡාච, ප්‍රශ්නයද; චොදනා භොගා, චොදනා ආභොගයෝද; සදා, හැමකල්හි; ජානිතබ්බා, දතයුත්තාහුය.

(මෙහි 'කාමඤ්චාපි' යන මෙහි අපිශබ්දය ප්‍රපඤ්චාර්ථද්‍යෝතකයි; අන්‍යොන්‍යාපෙක්ෂාර්ථ හෝ සමුච්චයාර්ථ හෝ වේ, එසින් 'චෙ සචෙ අපිනාම' යන ආදින් සමුච්චය කෙරේ--'සචෙද' යන මේ පදය 'කිඤ්චාපි' යන ආදි පදයන්හා වෙන වෙනම සම්බන්ධ කටයුතු—මෙහි විකල්පාර්ථවූ වාශබ්ද යෙක් ලුප්තනිර්දිෂ්ටයි—එම අපිශබ්දය හෝ වාශබ්දාර්ථයි—මෙම විකල්පාර්ථයෙන් මේ නිපාතයන්ගේ ප්‍රයොගයාගේ අනියතබව දක්වනලද්දී වේ—කිසිතැනෙක්හි කිඤ්චාපි ශබ්දයද කිසිතැ

66 තථාපි පන පිසද්දා, යුජ්ජන්ත තදනන්තරං
අථ ඛො හිපි ජොතෙන්ති, මතං තෙ පරිහාරකෙ—

තෙන්හි යදිපි ශබ්දයද කිසිතැනෙක්හි කාමඤ්චශබ්දයද යොදත්—ඉදින් වනාහි මේ ගාථාතොමෝ

යත්ථ යදිපි කිඤ්චාපි, සචෙද, කාමඤ්ච වා භවෙ
පුච්ඡාච චොදනා භොගො, දස්සිතො තත්ථ විඤ්ඤුහි

යී මෙසේ කියනලද්දී නම් ඉතා සුන්දරමය, ප්‍රසන්නවූ පදනී ඇත්තිද කැමැතිවිනලද අර්ථඇත්තිද වේ—හවත් **අශ්වඝොෂාචාර්යයන්** විසින් වනාහි "කිඤ්චාපි යදිපි කාමඤ්ච තථාපි පන අපිසද්දාච ගරහත්ථා හොන්ති" යී **ශබ්දවිධි** ප්‍රකරණයෙහි ආ ක්‍රමය දැක මෙසේ කියනලද්දී වන්නීය)

(දැන් පරිහාරාභොග ද්‍යොතක නිපාතශබ්දයන් දක්වන්නේ **'තථාපි පනාපිසද්දා'** යනා ආදිය කිය)

66 තථාපි පන පිසද්දා, තථාපිශබ්ද පනශබ්ද අපිශබ්දයෝද; අථබො ඉති පි, අථබො යන ශබ්දයද යන මොහු; තදනන්තරං, ඒ පෘච්ඡාවාක්‍යයට අනතුරුව; පරිහාරකෙ, පරිහාරවාක්‍යයෙහි; යුජ්ජන්ත, (ප්‍රාඥයන් විසින්) යොදනුලැබෙත්; තෙ, ඒ ශබ්දයෝ; (එසේ යොදනලද්දාහු) මතං, අභිප්‍රාය; ජොතෙන්ති, ප්‍රකාශකෙරෙත්—

('අථබො ඉති පි' යන මෙහි ඉතිශබ්දය නිදර්ශනාර්ථයී—පිශබ්දය පූර්වාපෙක්ෂකයී—මේ ග්‍රන්ථකාරකාචාර්යයන්ගේ ප්‍රකෘතියෙකි පරිහාරයද ආභොගයද දක්වන්නාහු පශ්චිමවාක්‍යයාගේ ආදියෙහිද ආදිපදයාගේ අවසානයෙහිද 'තථාපි අථබො' ශබ්දයන් යොදත්--ඔවුන් අතුරෙන් 'තථාපි අථබො' ශබ්දයෝ නිත්‍යයෙන් ඒ වාක්‍යයාගේ ආදියෙහි යෙදුනාහු වෙත්—පන අපිශබ්දයෝ ඒ වාක්‍යයාගේ ආදි පදයාගේ අවසානයෙහි යෙදුනාහු වෙතියී දතයුතු—ඒ ශබ්දයෝ පරිහාර ආභොගද්‍යොතකාම වෙත්--මෙහි තථා යන වෙනම්පදයෙක්ද ඇත. යම් කලක වෙන්වූ තථාශබ්දය ථප්‍රත්‍යයාන්ත වේද එකල්හි ප්‍රකාරාර්ථයී-ඉදින් නිපාතශබ්දයෙක්හෝ වේනම් උපමෙය ද්‍යොතකයී—පිශබ්දය හෝ අපිශබ්දය හෝ සම්භාව

67 ආද්‍යත්ථේච පකාරෙච, හෙතුම්හේචාවධාරණේ
නිදස්සනෙ පදත්ථානං, විපල්ලාසෙ පවුච්චතෙ
පරිසමාපනෙ චාපි, ඉතිසද්දො විභාවිනා.

නාඞ්ගයි—"යථාහි චොරාදීනං චොරජෙට්ඨකාදයො අධිපති නො සෙට්ඨා තථා තෙසං මනො සෙට්ඨො" යන ආදියෙහි තථාශබ්දය මෙනි—යම්කලක එකපද නිපාතසමුදායෙක් වේද එකල්හි යථොක්ත පරිහාරාදි දෙකතක වේ, නිෂ්ක්‍රාන්ත ප්‍රවෙශනාකාරශූපකද වේ—"යදිපි අවිජ්ජය සඞ්කුසූජනාභාවො තණ්හායච නිවරණභාවො පාළියං වුත්තො, 'තථාපි' අවිජ්ජාය පටිච්ඡාදනාදි නහෙවහි තණ්හා සත්ථෙ පයොජෙන්ති ඉමස්ස අත්ථස්ස දස්සනත්ථං අවිජ්ජානිවරණං තණ්හා සංයොජනන්ති වුත්තං" යන ආදියෙහි තථාපිශබ්දයමෙනි-- 'අථ' යන වෙන්වූ පදයෙක්ද ඇත්තේය, ඒ අථශබ්දය කාල වාචක නිපාතශබ්දයෙකි, ඛොශබ්දයද වාක්‍යාලඞ්කාරාර්ථ නිපාතශබ්දයෙකි—ගේ අධිකාරාන්තර දෙකතක හෝ වේ—"අථ ඛො අඤ්ඤතරා දෙවතා" යන ආදියෙහි 'අථඛො' ශබ්දයමෙනි—එකපද නිපාතසමුදායෙක් වේද එකල්හි යථොක්ත පරිහාරාදිය දෙකතක වේ—නිෂ්ක්‍රාන්ත ප්‍රවෙශනාකාරශූපකද වේ—"යං ලභති යංච නලභති තං සබ්බං පුච්ඡාය ගහිතන්ති ඉදං රූපක්ඛන්ධාදීනි පදානි සන්ධාය වුත්තං, අථඛො සම්පයොගපදං විප්පයොගපදඤ්ච" යන මෙහි අථඛො ශබ්දය මෙනි—මෙහි තථාපි පන අපිශබ්දයෝ 'කිඤ්චාපි යදිපි කාමඤ්ච' යන ශබ්දයන් පූර්වකොට ඇත්තෝය—අථඛො ශබ්දය පන ශබ්දය පූර්වකොට ඇත්තේය)

(ඉති යන නිපාතශබ්දයාගේ අනෙකාර්ථවාචකභාවය දක්වන්නේ "**ආද්‍යත්ථෙච පකාරෙච**" යන ආදි ෂට්පදගාථාවකිය)

67 ඉතිසද්දො, ඉති යන නිපාතශබ්දයතෙම; ආද්‍යත්ථෙච, ආදිශබ්දයාගේ අර්ථයෙහිද; පකාරෙච, ප්‍රකාරාර්ථයෙහිද; හෙතුම්හෙච, කාරණාර්ථයෙහිද; අවධාරණෙ, අවධාරණාර්ථයෙහිද; නිදස්සනෙ, නිදර්ශනාර්ථයෙහිද; පදත්ථානං, පදාර්ථයන්ගේ: විපල්ලාසෙ, විපරීතකරණාර්ථයෙහිද; පරිසමාපනෙච අපි, පරිසමාප්ත්‍යර්ථයෙහිද වේයයි; විභාවිනා, ප්‍රාඥයාවිසින්; පවුච්චතෙ, කියනලැබේ.

68 මූලානි යානීති තස්ස, විස්සජ්ජනං සියා ඉති
ආද්‍යත්‍ථෙච පකාරෙච, ඉතිසද්දො පදිස්සරෙ.

69 රුප්පතීතිච භූතාදි, තස්මා රූපන්ති වුච්චති
දිස්සතෙ යමිතිසද්දො, හෙතවත්‍ථෙ ගෙය්‍යමීදිසං.

---

(ඔවුන්ගේ උදාහරණ දක්වන්නේ "මූලානියානීති තස්ස" යන ආදී සතර ගාථාවන් කිය)

68 මූලානි යානීති තස්ස විස්සජ්ජනං සියා ඉති, මූලානි —පෙ—සියා යන ආදියෙහි; ඉතිසද්දො, ඉතිශබ්දයතෙම; අ ද්‍යත්‍ථෙච, ආදිශබ්දයාගේ අර්ථයෙහිද; පකාරෙච, ප්‍රකාරාර්ථ යෙහිද වේයයි; පදිස්සරෙ, දක්නාලැබේ.

(මෙහිදු "මූලානි—පෙ—සියා" යන මෙය යථාස්ථිත පාඨයා ගේ දක්වීම නොවේ—ඉක්බිතිව ඒ පාඨයාගේ අර්ථමාත්‍රය ගෙණ දක්වීමයි—**යමකප්‍රකරණාර්ථකථා** පාඨය මෙසේයි— "කුසලමූලෙන එකමූලානීති පුච්ඡාය කථාය මූලානි යානි එකතො උප්පජ්ජන්තීති හෙට්ඨා වුත්තනයෙනෙව විස්සජ්ජ නං කාතබ්බං භවෙය්‍යානි එකතො උප්පජ්ජන්ති" යි—මෙ හි ඉතිශබ්දයතෙම ආද්‍යර්ථහෝ ප්‍රකාරාර්ථහෝ වේ—'සියාඉ ති' යන මෙහි **ඉති**ශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ—ඒ ආද්‍ය ර්ථයෙන් "තත්‍ථ කතමො දෙසනාහාරො? අස්සාදාදීනවතාති ගාථානීච-තෙනාහ භගවා 'යො දුක්ඛමද්දක්ඛි යතො නිදානං" යනා මේආදිය ගැණේ—මෙහිද ඉතිශබ්දය ආද්‍යර්ථයි—එම අ ද්‍යර්ථයෙන් "ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි" යන ආදියද ගැණේ— මෙහිදු ඉතිශබ්දය ප්‍රකාරාර්ථයි)

69 අයං ඉතිසද්දො, මෙ ඉතිශබ්දයතෙම; රුප්පතීතිච භූ තාදි තස්මා රූපන්ති වුච්චති (ඉති) රුප්පතීති—පෙ—වුච්චති යන ආදියෙහි; හෙතවත්‍ථෙ, හෙතවර්ථයෙහි, දිස්සතෙ, දක් නාලැබේ; ඊදිසං, මේබඳු නිදර්ශනය; ඤෙය්‍යං,(ප්‍රාඥයන්විසින්) දතයුතු.

('වුච්චතීති' යි කිවමනා තන්හි ඉතිශබ්දය ලොප් කොට 'වු ච්චති' යි කියනලදි—ඒ ඉතිශබ්දය නිදර්ශනාර්ථද ආද්‍යර්ථද වේ—ඒ ආද්‍යර්ථයෙන් "සඞ්ඝහා සඞ්ඝභ විසෙසොච අඤ්ඤ

70 සමුද්දෙ චෙව සඞ්ඛ්‍යානං, දිස්සතෙ යං වධාරණෙ
ගො ඉච්චෙවතස්ස චාදිසු, නිදස්සනෙ පකාසිතො—

71 පකාරෙ ති යං රවො සඞ්ඛ්‍ය, ගණනපරිච්ඡෙදකො
වුච්චතෙ යං ඉතිසද්දො, පදත්ථානං විනාසනෙ—

ඛ්‍යනිස්සිතො වුච්චමානො සුවිසෙසූයෙහ ගොතිති සඞ්ඛ
ගොතිති අසඞ්ඛගොති නාය මූලා මාතිකා ඨපිතානි—ඉතිහි
දං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤකොණ්ඩඤ්ඤො
ත්වෙව නාමං අහොසි—ඉතිපි සො භගවා අරහං'' යන මේ
ආදීන් ගැණේ)

70 අයං, මේ ඉතිශබ්දයතෙම; සමුද්දෙ චෙවසඞ්ඛ්‍යා ඉති,
සමුද්දෙ චෙව සඞ්ඛ්‍යං යන ආදියෙහි; අවධාරණෙ, අවධාර
ණයෙහි; දිස්සතෙ, දක්නාලැබේ; ගො ඉච්චෙවතස්ස ඉති,
ගො ඉච්චෙවතස්ස යන; ආදිසු, මේආදි ප්‍රයොගයන්හි; නිදස්ස
නෙ; නිදර්‍ශනයෙහි; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය—.

(මෙහි ''සමන්තතො වීචියො එත්‍ථ උදෙන්තීතිබො, සමු
ද්දො, චෙව සමඤ්ඤා උදපාදි'' යනු පාළිය—'සමුද්දො චෙ
ච' යන සමහි 'සමුද්දො ඉති එව' කියා ඡෙදනය කොට 'වා
පරෙ' යන ආදිසූත්‍රයෙන් ඔකාරයාකෙරෙන් පර ඉකාරයහ
ට ලොප් කොට සරයා පරනිමිතින් 'වමොදු' යන ආදිසූත්‍ර
යෙහි අන්තග්‍රහණයෙන් ඉකාරයහට වකාර කොට ත්‍ව යන
නිත්‍යවය පරක්‍ෂරකරා පමුණුවා 'චෙව' සී රූපසෙවේ—එ
වශබ්දය අවධාරණාර්ථයි—'සඞ්ඛ්‍යං ඉති' යන මෙහි ඉතිශබ්ද
ය නිදර්‍ශනාර්ථයි—'තස්සවාදිසු' යන මෙහි 'තස්ස ඉච්චාදිසු'යි
ඡෙදනය කොට අකාරයාකෙරෙන් පරවූ ඉකාරයහට 'වාප
රෙ' යන ආදි සූත්‍රයෙන් ලොප් කොට චකාරය විසංයොග
කොට රූපය වේ—මේ ආදිශබ්දයෙන් 'එකාදස ක්‍රියාවෙති ච
තුපඤ්ඤාස සබ්බේථා—සබ්බම්පි විපාකවිඤ්ඤාණානි විපාකග
හණෙන විසෙසනං න කාතබ්බං'' යන මේආදින් ගැණේ-
මෙහිද ඉතිශබ්දය නිදර්‍ශනාර්ථයි)

71 පකාරෙති යං රවො සඞ්ඛ්‍ය ගණනාපරිච්ඡෙදකො,(ඉති)ප
කාරෙතියං—පෙ—පරිච්ඡෙදකො යන ආදියෙහි; අයං ඉතිස

——※o※——

72 පදත්ථවිපල්ලාසෙන, ඉතිසද්දෙන යොජිතො
සද්දපදත්ථකො සොච, සෙසෙහෘත්ථ පදත්ථකො—

---

ද්දෙ, මේ ඉතිශබ්දයතෙම; පදත්ථානං, පදාර්ථයන්ගේ; විනා සනෙ, විපර්‍යාසයෙහි (වේයයි) වුච්චතෙ, කියනුලැබේ—

(අයං රවො, මේ ශබ්දයතෙම; පඤ්ච ඉති, පඤ්ච යන; සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යාවාචකය; ගණනපරිච්ඡෙදකො, ගණනයගේ පරිච්ඡෙදයට හෙතුය යනු නිදර්ශනාර්ථයි—මෙහි ‘පඤ්චාති’ යනු යට ‘සඞ්ඛ්‍යා’ යන පදයහා යෙදියයුතු, එබැවින් මෙහි ඉතිශබ්දය පදාර්ථ විපර්‍යාස වාචකයි—**අර්ථකථාවෙහි** “පඤ්චාති ගණනපරිච්ඡෙදෙ, තෙන නකතො හෙට්ඨා න උද්ධන්ති දස්සෙති බන්ධාදි පරිච්ඡින්නන ධම්මනිදස්සනං” යි මෙපමණෙක්ම ඇයේය—“රවීයතෙ උච්චාරීයතෙ ති රවො” රවීයතෙ යි සේයි; උච්චාරියතෙ ඉති, කියනුලැබේනුයි; රවො, රවනමි; (යෙ ශබ්දයි) “සඞ්ඛ්‍යායතෙති සඞ්ඛ්‍යා” සඞ්ඛ්‍යායතෙ ඉති, ගණින්නුලැබේනුයි, සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යා නම්—“සඞ්ඛ්‍යායවාචකො සඞ්ඛ්‍යා” සඞ්ඛ්‍යාය, සඞ්ඛ්‍යාව; වාචකො, කියන්නේ; සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යානම්—මේ උත්තරපදලොප වශයෙන්—“ගණනං පරිච්ඡිජ්ජති එතෙනාති ගණනපරිච්ඡෙදො” එතෙන, මේකරණකොටගෙණ; ගණනං. ගණන; පරිච්ඡිජ්ජති ඉති, පිරිසිඳිනුයි; ගණනපරිච්ඡෙදෙ, ගණනපරිච්ඡෙදනම්—“සො එව ගණනප්පරිච්ඡෙදකො” සොඑව, ඒ ගණනපරිච්ඡෙදයම; ගණනපරිච්ඡෙදකො, ගණනපරිච්ඡෙදක නම්—මෙපදයාකෙරෙන් පැවූ ඉතිශබ්දයතෙම ලොප් කරණලදී—‘ගණන පරිච්ඡෙදකො’ යන පාඨය ‘ගණනපරිච්ඡෙදිති’ යි සුන්දරතරයි—එසේ ඇතිකල්හි ‘ගණනපරිච්ඡෙදෙ ඉති’ යි පදච්ඡෙදයි—නිදර්ශනාර්ථවූද අන්‍යාර්ථවූද ඉතිශබ්දය අලුප්තවන්නේයි)

(යථොක්තාර්ථඇති ඉතිශබ්දය දෙපරිද්දකින් දක්වන්නේ **‘පදත්ථවිපල්ලාසෙන’** යන ආදිය කිය)

72 පදත්ථවිපල්ලාසෙන, පදාර්ථයන් විපර්‍යාස කරන්නාවූ; ඉතිසද්දෙන, ඉතිශබ්දයහා; යොජිතො,(යම්ශබ්දයෙක්)යොදනලද්දේද; සොඑව, ඒ (පුරිසාදි) ශබ්දයතෙමේම: සද්දප

73 අන්නොනීතඤ්ච නික්ඛන්තං,  පදුද්ධාරං පවෙසනං
තෙසමා යොග මාකාරං,  අත්ථං ඤෙය්‍ය පණ්ඩිතො—

74 අනෙනානීතනානි විසෙක්ඛෙය්‍ය, චොදනා හි වාක්‍යන්තරෙ
තස්සා යෙව පරිහාරෙ,  නික්ඛන්තානිච සො ඔතො—

---

දත්ථකො, ශබ්දපදාර්ථනම් වේ—සෙසෙහි, සෙස්සන්හා යො දනලද්දේ; අත්ථපදත්ථකො,  අර්ථපදාර්ථනම් වේ—

(යම්ශබ්දයෙක් පදාර්ථවිපර්‍ය්‍යාසය තරන්නාවූ ඉතිශබ්දයහා යොදනලද්දේ  ශබ්ද ද්‍රව්‍යය කියාද හේ ශබ්දපදාර්ථනම් වේ-යම්ශබ්දයෙක් ඉතිශබ්දයෙන් නොයොදනලදුයේ  අර්ථද්‍රව්‍යයම කියාද හේ අර්ථපදාර්ථනම් වේ)

(දූත් චොදනා පරිහාරයන්හි යෙදෙන යෙදෙන පරිද්දෙන් ලභ්‍යමාන ඝටනයයන් දක්වන්නේ "අනෙනා නිතඤ්ච නික්ඛන්තං" යන ආදි ගාථාව කිය)

**73** අනෙනානීතංච, වාක්‍යාන්‍යන්තරගත චොදනාවද; නො හොත් ද්‍රව්‍යාන්‍යන්තරගත චොදනාවද;  නික්ඛන්තං,  චොදනාවෙන් නික්මීම්සඞ්ඛ්‍යාත පරිහාරයද;  පදුද්ධාරං, (ඊප්ෂිතානීප්ෂිත පදයාගේ) උදුරාකිමද;  පවෙසනං,  (ඊප්ෂිතපදයාගේ පිහිටවීම් සංඛ්‍යාත) අනුප්‍රවෙශනයද;  නොහොත් (අනීප්ෂිත පදයාගේ තැබීම්සඞ්ඛ්‍යාත) ප්‍රවෙශනයද;  අයොගං, මනස්කාරයද; තෙසං, ඒ චොදනාපරිහාරයන්ගේ; ආකාරං, ආකාරයද; පණ්ඩිතො, පණ්ඩිතතෙම;  ඤෙය්‍ය, දැනගන්ට සමර්ථවන්නේය;  අත්ථං, (කැමැතිවනලද) අර්ථය  (ප්‍රත්‍යක්ෂවශයෙන්) වන්නේය—

(යම්සේ **විශුද්ධිමාර්ගයෙහි "සොඉමංවිජටයෙ ජටං"** යන මෙහි 'විජටයෙ'යනපදයාගේ ක්‍රියාසමුදෙයෙකත්වය මෙනෙහි කොට 'විජටෙතුං සමත්ථො භවෙය්‍ය'යී අර්ථ කියනලද්දේද—එසේම මෙහි 'විජානෙය්‍ය' යන මොහුගේ  ක්‍රියාසමුදාය ලැබේයයී කියා 'දැනගන්ට හැකිවන්නේ' යයී අර්ථ කිමූ)

(ඔවුන්ගේ ස්වරූපයෙන් අර්ථය  සමර්ථනය කරණුකැමැත්තේ '**අනෙනා නීත ත්ති විසේසෙය්‍යා**' යන ආදිය කිය)

**74** චොදනාහි, චොදනා තොමෝ වනාහි;  වාක්‍යන්තරෙ,

75 අනිච්ඡිතස්ස පදස්ස, උද්ධාරෙ පදුද්ධාරණං
තස්සෙව පදප්පවෙසො, පවෙසො තිච සො මතො.

76 උද්ධාරො චොදනාපක්ඛෙ, පවෙසො පරිහාරකෙ
චොදනාය පවෙසො ච, ඉතරො පරිහාරකෙ.

77 චොදනාපරිහාරානං, මනස්මිං අත්ථ කාරණං
සො භොගො නාම අත්ථානං, ආකාරොව විභජ්ජනං.

78 අයුත්තතා චෙව ආභොගො, බ්‍යතිරෙකාඛ්‍යා තථා
චතුධා චොදනා භෙදා, නිපාතෙහ්‍යුපලක්ඛිතා.

---

වාක්‍යාභ්‍යන්තරයෙහි; අනෙනානිතං ඉති, අනෙනානිතයයි; විශෙෂ්‍යයක, දතයුත්තිය; තස්සා එව, [ඒ චොදනාවගේම; පරිහාරො, (යම්) පරිහාරයෙක් වේද; සො, හේ පරිහාරයතෙමේ; නික්ඛන්තං ඉතිච, නික්ඛාන්තයයිද, මතො, දත්නාලද්දේය.

75 අනිච්ඡිතස්ස, අනිච්ඡිතවූ; පදස්ස, පදයාගේ; පදුද්ධාරණං, (ඊප්සිත) පදයෙන් ඉදිරීම, උද්ධාරො, උද්ධාරනම් වේ; තස්සෙව, ඒ (ඊප්සිතපදයාගේම හෝ; ඒ අනීප්සිත)පදයාගේම (හෝ;) පදප්පවෙසො, (යම් ඊප්සිතවූ හෝ අනීප්සිතවූහෝ) පදයාගේ ප්‍රවෙශයෙක් වේද; සො, හේ; පවෙසො ඉතිච, ප්‍රවෙශයයිද; මතො, දත්නාලද්දේය.

76 උද්ධාරො, උද්ධාරයතෙම; චොදනාපක්ඛෙ, චොදනාපක්ෂයෙහි වේ; පවෙසො, ප්‍රවෙශයතෙම; පරිහාරකෙ, පරිහාරපක්ෂයෙහි වේ; චොදනාය, චොදනාවෙහි; පවෙසොච, ප්‍රවෙශයද; පරිහාරකෙ, පරිහාරයෙහි; ඉතරො, අනික් උද්ධාරයද (වේ).

77 චොදනාපරිහාරානං, චොදනාපරිහාරයන්ගේ; මනස්මිං, සිත්හි; අත්ථකාරණං, (යම්) අර්ථයාගේ ආවර්ජනාකොට තබනආකාරයෙක් වේද; සො. හේතෙමේ; ආභොගොනාම, ආභොගනම් වේ; අත්ථානං එව, (යථෙප්සිත) අර්ථයන්ගේම; විභජ්ජනං, බෙදීම; ආකාරො, ආකාරනම් වේ.

(දැන් චොදනාභෙදය දක්වන්නේ "අයුත්තතා චෙව ආභොගා", යන ආදිය කිය)

78 චොදනාභෙදා, චොදනාවිශෙෂයෝ; අයුත්තතාව එව,

79 කථං කස්මා කිමත්ථන්ති, ලක්ඛ්‍ය අයුත්තචොදනා
නන්වාදි ලක්ඛිතාභොගා, බ්‍යතිරෙකා යදාදිනා
තෙනා තස්මාති ලක්ඛ්‍යාව, අන්වයචොදනා භවෙ—

80 යුත්තොත්තාචෙව ආභොගොච, බ්‍යතිරෙකන්වයො පිච
චතුධා නික්ඛන්තභෙදා, නිපාතෙහෙව ලක්ඛිතා—

---

අයුක්තචොදනාවද; ආභොගා, ආභොගචොදනාවද; තථා, එසේම; බ්‍යතිරෙකා, ව්‍යතිරෙක චොදනාවද; අන්වයා, අන්වයචොදනාවදැයි; නිපාතෙහි,(නනු යන ආදි)නිපාතශබ්දයෙන්, චතුධා, සතරප්‍රකාරයකින්; උපලක්ඛිතා, සලකුණුකරණලද්දෑහුය—

(ඒ චොදනාවින්ගේ විශෙෂලක්ෂණය දක්වනුපිණිස "**කථං කස්මා කිමත්ථන්ති**" යන ආදි ෂට්පද ගාථාව කීය)

79 කථං කස්මා කිමත්ථං ඉති, කථං කස්මා කිමත්ථං යන ආදී ශබ්දයෙන්, ලක්ඛ්‍ය, උපලක්ෂණය කරණලද්දී; අයුක්තචොදනා, අයුක්තචොදනානම් වේ; නනු ඉති, නනු යන ආදී ශබ්දයෙන්; ලක්ඛිතා, සලකුණුකරණලද්දී; ආභොගා, ආභොගචොදනානම් වේ; යදාදිනා, යදි චෙ සචෙ යන ආදි ශබ්දයෙන් (උපලක්ෂණයකරණලද්දී) බ්‍යතිරෙකා, ව්‍යතිරෙක චොදනානම් වේ; තෙන තස්මා ඉති, තෙන තස්මා යන ආදි ශබ්දයෙන්; ලක්ඛ්‍ය එව, සලකුණුකරණලද්දීම; අන්වයචොදනා භවෙ, අන්වයචොදනානම් වේ—

(පරිහාරභෙදය දක්වන්නේ "**යුත්තොත්තාචෙව ආභොගොච**" යන ආදිය කීය)

80 නික්ඛන්තභෙදා, පරිහාරවිශෙෂයෝ; යුත්තොත්තාච එව, යුක්තපරිහාරයද; ආභොගොච, ආභොගපරිහාරයද; බ්‍යතිරෙකො, ව්‍යතිරෙකපරිහාරයද; අන්වයො අපිච, අන්වයපරිහාරයදැයි; චතුධා, සතරප්‍රකාරයකින්; ලක්ඛිතා, සලකුණුකරණලද්දෑහුය; නිපාතෙහි එව, (නො හි ච යන ආදි) නිපාතශබ්දයෙන්ම වෙත්—

(ඒ පරිහාරයන්ගේ භෙදලක්ෂණය දක්වනු පිණිස "**එතෙසු යුත්තපරිහාරෙ**" යන ආදී ෂට්පද ගාථාව කීය)

---

81 තෙසු ඥුතන්ත පරිහාරෙ, ඥුතන්තංනොච්චාදි ලක්ඛියො
හිචලක්ඛ්‍යපි ආභොගො, බ්‍යතිරෙකො පනාදිනා
තෙන තස්මා දිනා ලක්ඛ්‍ය, පරිහාරොන්වයො භවෙ.

82 නාමපද ක්‍රියානංවා, උපගන්ත්වා තහිං තහිං
නානාඅත්ථං සජනන්ති, තෙනෙවොපසග්ගා බ්‍රවුං.

83 පරා නි නී උ දු සං වි, අවා නු පරි පතී සු
අධ්‍ය භි ආ අත්‍ය ප්‍ය ප, පූ පාතී වීසධා සියුං.

---

81 තෙසු, ඔවුන්අතුරෙන්; ඥුතන්තං නො ඉති, ඥුතන්තං නො යන; ආදි, මේආදිශබ්දයෙන්; ලක්ඛියො, සලකුණුකරණලද්දේ; ඥුතන්තපරිහාරෙ, ඥුතන්තපරිහාරනම් වේ; හිචලක්ඛ්‍යඅපි, හිශබ්ද චශබ්දයෙන් සලකුණුකරණලද්දේම; ආභොගො, ආභොගපරිහාරනම් වේ; පනාදිනා, පන යන ආදිශබ්දයෙන් සලකුණුකරණලද්දේ; බ්‍යතිරෙකො, ව්‍යතිරෙක පරිහාරනම් වේ; තෙන තස්මාදිනා, තෙන තස්මා යන ආදිශබ්දයෙන්; ලක්ඛ්‍ය, සලකුණුකරණලද්දේ; අන්වයො පරිහාරො භවෙ, අන්වයපරිහාරනම් වේ.

(මෙසේ කිසිනිපාතකෙණෙකුන්ගේ අර්ථ දක්වා උපසර්ගයන්ගේද වාගර්ථස්වරූපාර්ථයන් හා වාච්‍යාර්ථයන් දක්වන්නේ "**නාමපදක්‍රියානංවා,**" යන ආදි ගාථාත්‍රය කිය)

82 උපගන්ත්වා, එළඹ; තහිං තහිං, ඒ ඒ ප්‍රයොගයෙහි; නාමපදක්‍රියානංවා, නාමපද ක්‍රියාපදයන්ගේ හෝ; නානාඅත්ථං, නොයෙක් අර්ථය; ඉති, යම්හෙයකින්; සජනන්ති, ප්‍රකාශකෙරෙද්ද; තෙන එව, එහෙයින්ම; උපසග්ගා, උපසර්ගයෝයයි; අබ්‍රවුං, කීහු.

("සජනන්තීති" යන මෙහි ඉතිශබ්දය "රුප්පතීතිඛො තස්මා රූපං" යන මෙහි මෙන් කාරණවාචකයි)

83 පරා, පරායන උපසර්ගයද; නි, නියන උපසර්ගයද; නී, නීයන උපසර්ගයද; උ, උයන උපසර්ගයද; දු, දුයන උපසර්ගයද; සං, සංයන උපසර්ගයද; වි, වියන උපසර්ගයද; අව, අවයන උපසර්ගයද; අනු, අනුයන උපසර්ගයද; පරි, පරියන උපසර්ගයද; පති, පතියන උපසර්ගයද; සු, සුයන උපසර්ගයද; අධි, අධියන උපසර්ගයද; අභි, අභියන උපසර්ගයද; ආ, ආයන උපසර්

84 ධාත්වත්ථං බාධතෙ කොචි, කොචි තං අනුවත්තතෙ
තමෙව අඤ්ඤෙ විසෙසෙන්ති, උපසග්ගගති තිධා—

85 ජිනො භිභවතෙ ලොකං, ආහාරං පරිභුඤ්ජති
උග්ගතො සූරියො චෙව, සිද්ධං තං ලක්ඛ්‍යං කමා—

---

යද; අති, අතියන උපසර්ගයද; අපි, අපියන උපසර්ගයද; අප,අපයන උපසර්ගයද; ප, පයන උපසර්ගයද; උපඉති, උපයන උපසර්ගයදැයි; විසධා,විසිපරිච්ඡෙදකින්; සියුං,වන්නාහුය—

84 කොචි, සමහර උපසර්ගයෙක්; ධාත්වත්ථං, ධාතුහුගේ අර්ථය; බාධතෙ, වළකයි; කොචි, සමහරඋපසර්ගයෙක්; තං, ඒ ධාත්වර්ථයට, අනුවත්තතෙ,අනුවපවති; අඤ්ඤෙ,අනික්උපසර්ගයෙක් තෙම; තං එව, ඒ ධාත්වර්ථයම; විසෙසෙන්ති, වෙසෙසයි; උපසග්ගගති, උපසර්ගයාගේ පැවැත්ම; තිධා, තුන්පරිච්ඡෙදකින් වේ—

(ඔවුන්ගේ උදාහරණ දක්වනුපිණිස "**ජිනොභිභවතෙ ලොකං**"යන ආදිය කිය)

85 ජිනො භිභවතෙ ලොකං ආහාරං පරිභුඤ්ජති උග්ගතො සූරියො ඉති එව, ජිනොභිභවතෙ ලොකං ආහාරං පරිභුඤ්ජති උග්ගතො සූරියො යන ආදියෙහිම; තං ලක්ඛියං,ඔවුන්ගේ උදාහරණ; කමා, පිළිවෙළින්; සිද්ධං, ප්‍රකටයි—

(ජිනො, සර්වඥතෙම; ලොකං, ලොකයා; අභිභවතෙ, මැඩපවත්වයි—මෙහි 'අභිභවතෙ'යනු 'ධාත්වත්ථං බාධතෙ' යන මීට උදාහරණයි—'අභිභවතෙ'යන මෙහි භූධාතුතෙම [illegible]ම්අර්ථයෙහි වැටේ—අභි යන උපසර්ගය පූර්වබැවින් ස්වාර්ථය හැර විජයාර්ථය කියයි එසේහෙයින් අභිශබ්දය ධාත්වර්ථබාධක නම්—'පරාභවති' පරිහාරෙ-විභොති රූපං' යන ආදියෙහිද මෙම නයයි—ආහාරං, අහර; පරිභුඤ්ජති, පරිභොගකෙරේ—'පරිභුඤ්ජති' යන මෙය 'තං අනුවත්තතෙ' යන මීට නිදර්ශනයි—'පරිභුඤ්ජති' යන මෙහි භුජධාතුතෙම භොජනාර්ථයෙහි වැටේ—පරියන උපසර්ගය පූර්වකොට ඇතිබැවින් ස්වාර්ථය නොහරියි විශෙෂාර්ථයද නොකියයි, ඉක්බිතිව භොජනාර්ථසඞ්ඛ්‍යාත ස්වාර්ථයම කියයි—එහෙයින් පරිශබ්දය ධාත්වර්ථානුවර්තික නම්—'පරියොසාපෙති-සංකිලෙසෙති-නීහරති'

86 සයමෙවෙත්ථ තිට්ඨන්ති, නිපාතා අත්ථජෝතනා
පදනිස්සිතකා යෙවො, පසග්ගාති විසෙසතා—

87 උපසග්ගා නිපාතාච, පච්චයාච ඉමෙ තයො*
නෙකෙ නෙකත්ථවිසයා, ඉති නෙරුත්තිකා බ්‍රවුං—

---

යන ආදියෙහිද මෙම නයයි—සූරියො, හිරුතෙමේ; උග්ගතො, නැංගේය—'උග්ගතො' යනු 'තමෙවඅක්ඛු විසෙසෙති' යන ඊට නිදර්ශනයි—'උග්ගතො' යන මෙහි ගම්ධාතුවෙම ගත්‍යර්ථයෙහිද ජානනාර්ථයෙහිද වැටේ—උ යන උපසර්ගය පූර්වවූයේ උද්ගමනාර්ථසඞ්ඛ්‍යාත විශෙෂාර්ථය කියයි—උ ශබ්දය ධාත්වර්ථවිශෙෂක නමි-'විජානාති-සඤ්ජානාති-උපගච්ඡති' යන ආදියෙහිද මෙම නයයි)

(නැවත උපසර්ගනිපාතයන්ගේ විශෙෂය දක්වනු පිණිස **'සය මෙව එත්ථ තිට්ඨන්ති'** යන ආදිය කිය)

86 එත්ථ, මේ උපසර්ගනිපාතයන් අතුරෙන්; නිපාතා, නිපාතයෝ; සයංඑව, තමාම, අත්ථජෝතනා, අර්ථප්‍රකාශකරන්නාහු; තිට්ඨන්ති, සිටිත්, උපසග්ගා, උපසර්ගයෝ; (සයං එව, තුමාම) පදනිස්සිතකා එව, (නාමපද ක්‍රියාපදයන) පදයන් ආශ්‍රයකරන්නාහුම (තිට්ඨන්ති, සිටිත්) ය; ඉති, මෙසේ; විසෙසතා, විශෙෂත්වය වේ—

(ඔවුන්ගේ අනෙකාර්ථභාවය දක්වන්නේ **"උපසග්ගා නිපාතාච"** යනා ආදිය කිය)

87 උපසග්ගා, උපසර්ගයෝද; නිපාතාච, නිපාතයෝද; පච්චයාච, ප්‍රත්‍යයෝද; (යන) ඉමෙතයො, මොහුතුන්දෙන; අනෙකෙ, බොහෝවෙත්; අනෙකත්ථවිසයා ඉති, බොහෝඅර්ථ විෂයකොට ඇත්තාහුවෙත්යයි; නෙරුත්තිකා, නෛරුක්තිකයෝ; අබ්‍රවුං, කීහු—

("පටිච්චෙතං අත්ථවිසෙසං ඊයන්තෙන ඤායන්තෙති පච්චයා" එතං අත්ථවිසෙසං, මේ අර්ථවිශෙෂය; පටිච්ච, නිසා; ඊයන්තෙයි සේයි; ඤායන්තෙ ඉති, දන්නාලැබෙත්නුයි; පච්චයා, පච්චයනම් වෙත්—"නාමසද්දංවා ධාතුසද්දංවා පටි

---

* 'පච්චයා ධාතවො ච්මෙ' ති පදභෙදදීපනී දිස්සති

88 විවිධාචෙව විචිත්තා, සද්දනයා පකාසිතා
නානාගන්ථෙසුච තස්මා, සබ්බෙ තෙ නිධ භාසිතා—

89 ඉති මෙ පුඤ්ඤකාමෙන, ගන්ධාභරණ නාමකො
රචිතො යං වරො ගන්ථො, සිඛියාව නිට්ඨං ගතො—

---

චච අසන්තිනිචා පච්චයා'' නාමසද්දංවා, නාමශබ්දයක්හෝ; ධාතුසද්දංවා, ධාතුශබ්දයක්හෝ; පටිච්ච, නිසා; අයන්ති ඉ ත්වා, දනිත්නුයිහෝ; පච්චයා, පච්චයනම් වෙත්—මෙහි පත් පූර්ව ඉ ගතිම්හි යන ධාතුනු කෙරෙන්'**විසරුජපදාදිතොණ**'යන සූත්‍රයෙන් කර්මාර්ථයෙහිහෝ කර්තෘර්ථයෙහිහෝ ණප්‍රත්‍යය කොට ඕහට කාරිතවත් කොට ණකාරානුබන්ධය ලොප් කො ට ''අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ'' යන සූත්‍රයෙන් ඉ යන ධාතුහට එකාර වෘද්ධි කොට '**එ අය**' යන සූත්‍රයෙන් එකාරය හට අය යන ආදෙශ කොට සකාරය අකාරයකරා පමුණු වා '**සබ්බොචචන්ති**' යන සූත්‍රයෙන් ත්‍යකාරයහට චකාර කොට නැවත චකාර ඊත්ව කොට පරාක්ෂරයා කරා පමුණුවා නම්වත් කොට විභක්ත්‍යුත්පත්‍යාදිය කළකල්හි රූපය ද්වි—ප්‍රත්‍යයන්ගේ විභාගය මත්කෘත **මුඛමත්තදීපනී ව්‍යාඛ්‍යාවෙන්** දැනගත යුතු)

(ඒශබ්දය නිරවශෙෂයෙන් කියන්ට නොහැක්කේයයි දක් වන්නේ '**විවිධාචෙව විචිත්තා**' යන ආදිය කිය)

88 නානාගන්ථෙසුච, නොයෙක් ග්‍රන්ථයන්හි වනාහි; විවිධාච එව, නොයෙක් ප්‍රකාරවූද; විචිත්තා, විසිතුරුවූද; සද්දනයා, ශබ්දනයයෝ; පකාසිතා, (යම්හෙයකින්) ප්‍රකාශකරණ ලද්දාහුද; තස්මා, එසේහෙයින්; තෙ සබ්බෙ, ඒ සියල්ලෝ; ඉධ, මේ **ගන්ධාභරණ** ග්‍රන්ථයෙහි; නභාසිතා, නොකියනලද්දා හුය—

(මෙතෙකින් තමාවිසින් කියන්ට පටන්ගන්නාලද **චිවප නාදි** නිපාතයන්ගේද උපසර්ගයන්ගේද ලක්ෂණොදාහරණ සහිත නානාප්‍රකාර අර්ථයන් දක්වා යම් පුණ්‍යයක් කරණකො ටගෙණ මේ ග්‍රන්ථය රචනාකෙරේද ඒ පුණ්‍යයාගේ ආනුභා වය දක්වන්නේ "**ඉති මෙ පුඤ්ඤකාමෙන**" යන ආදිය කිය)

89 ඉති, මෙසේ; පුඤ්ඤකාමෙන, පින්කැමැත්තාවූ; මෙ,

90 පාළිටීකාදි යං ගන්ථං, භාසිතං හි ජිනාදිනා
සබ්බං තම්පි නිපාතෙහි, විවිධෙහෙව සොඤ්ඤතං.

91 අසික්ඛිත්වා නිපාතානං, යො ගන්ථං ඉධ සික්ඛති
අලාබුවස්ස තොයම්හි, චිත්තං නාධිමුත්තං සදා.

92 යං තං භාසති සො මන්දො, ලොකිකම්පිව තං විනා
උම්මත්තක වචනං ච, අසොභං තස්ස භාසිතං.

---

මාවිසින්; රචිතො, රචනාකරණලද; වරො, උතුම්වූ; ගන්ථාභරණනාමකො, ගන්ථාභරණනම්වූ; අයං ගන්ථො, මේ ග්‍රන්ථයතෙම; සිද්ධියා එව, නිෂ්පත්තියෙන්ම; නොහොත් සුවසේම නොහොත්(වන්දනාපූර්වංගමවූ ජෙකතාවාපෙක්ෂක කුශලකර්මයාගේ) ආනුභාවයෙන්ම; නිට්ඨං, නිෂ්ඨාවට; ගතො, ගියේය.

(යම් කාරණයකින් මේ නිපාතයෝ ග්‍රන්ථාලංකාරකරන්නාහු වෙද්ද හෙය දක්වන්නේ "**පාළිටීකාදි යං ගන්ථං**" යන ආදිය කිය)

90 හි, යම්හෙයකින්; ජිනාදිනා, සර්වඥයන්වහන්සේ ආදි ප්‍රාඥයන්විසින්; පාළිටීකාදි, පාළිටීකාදිවූ; යං ගන්ථං, යම් ග්‍රන්ථයෙක්; භාසිතං, කියනලද්දේද; තං සබ්බං අපි, ඒ සියල්ලම; විවිධෙහි, නොයෙක්ප්‍රකාරවූ; නිපාතෙහි, නිපාතයෙන්; සොඤ්ඤතං එව, හෙබියේමය.

(දැන් මේග්‍රන්ථයාගේ නිපාතොපසර්ගයන්ගේ ප්‍රකාශිතභාවයෙන් ඒ ඒ ශාස්ත්‍රයන්හි ශිෂ්‍යයන්ගේ ජෙකතාවය කිමෙන් මේ ග්‍රන්ථයාගේ උද්ග්‍රහණ පරිපෘච්ඡන ධාරණාදියෙහි උත්සාහය උපදවන්නේ අශික්ෂණප්‍රත්‍යයාදිනවානිසංසදීපන පූර්වකවූ "**අසික්ඛිත්වා නිපාතානං**" යන ආදි ගාථා චතුෂ්කය කිය)

91 ඉධ, මේශාසනයෙහි; යො, යම් කුලපුත්‍රයෙක්තෙමේ; නිපාතානං, නිපාතයන්; අසික්ඛිත්වා, නොඋගෙණ; ගන්ථං (යම්කිසි) ග්‍රන්ථයක්; සික්ඛති, උගණීද; අස්ස, ඒ කුලපුත්‍රයාගේ; චිත්තං, (ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුශල) චිත්තය; තොයම්හි, ජලයෙහි; අලාබුඉව, (හිස්වූ වියලුනු) ලබුකබලයක් මෙන්; සදා, හැමකල්හි; නඅධිමුච්චතං, නොබැස ගන්නේ වේ.

92 සො මන්දො, ඒ දුර්වලප්‍රඥඇති තැනැත්තේ; තං ජිනා,

93 සික්ඛිත්වා පනිමං ගන්ථං, සික්ඛනෙතා පිටකත්තයං
පාපුණෙය්‍යෙව මෙධාවී, යථාභූතාව බොධනං.

94 සඞ්ඛ්‍යානිත්වා පනිච්චෙවං, ගුණසාර මනාකුලං
සික්ඛිතබ්බොවයංගන්ථො,සෙකාදෙසොපි සාසනෙ.

95 පුඤ්ඤවාපඤ්ඤවා යොසො, පාකටො සබ්බභූතලෙ
අජ්ජවො මද්දවො සන්තො, සුතෙනා පටිපත්තිහිච.

---

ඒ නිපාත හැර; ලොකිකං අපිච, ලෞකිකවූද; යං තං, යම් ඒ වචනයක්; භාසති, කියාද; තස්ස, ඔහුගේ; භාසිතං, වචනය, උම්මත්තකවචනං ඉව, උමතුවන්ගේ වචනය මෙන්; අසොභනං, අයහපත් වේ.

93 මෙධාවී, ප්‍රාඥතෙමේ; ඉමං ගන්ථං, මේ ග්‍රන්ථය; සික්ඛිත්වා පන, ඉගෙණ වනාහි; පිටකත්තයං, පිටකත්‍රය; සික්ඛන්තෙනා, ඉගෙණගන්නේ; යථාභූතාවබොධනං, යථාභූතාව බොධයට; පාපුණෙය්‍ය එව, පැමිණෙන්නේ මය.

94 ඉති එවං, මෙසේ, අනාකුලං, නිරවුල්වූ; ගුණසාරං, සාරවූ ආනිසංසය; සඞ්ඛ්‍යානිත්වා හැඳින; පන, එහෙයින්; සාසනෙ,ශාසනයෙහි;සෙකාදෙසො අපි,ප්‍රවාහණයකරණලද දෙෂඥත්තාවූද; අයං ගන්ථො, මේ ග්‍රන්ථයතෙම; සික්ඛිතබ්බො එව, ඉගෙණගතයුත්තේමය.

('සඞ්ඛ්‍යානිත්වා පන' යන මෙහි පන ශබ්දය කාරණාර්ථයී— "සික්ඛියතෙ පවාහීයතෙති සෙකො" සික්ඛියතෙ ඉති සේසී; පවාහීයතෙ ඉති, ප්‍රවාහණයකරණුලැබේනුයී; සෙකො, සෙකානම්—'සෙකො දෙසො එතස්සාති සෙකාදෙසො' සෙකො, ප්‍රවාහණය කරණලද; දෙසො, දෙශ; එතස්ස ඉති, මොහුගේනුයී; සෙකාදෙසො, සෙකාදෙස නම්—මෙහි අපි ශබ්දය සම්පිණ්ඩනාර්ථයී)

(අපවිසින් මෙසේ නිපාතාර්ථයන්ගේ අශික්ෂණයෙහි දෝෂද ශික්ෂණයෙහි ආනිසංසද දක්වා ඒ ශික්ෂණයෙහිද උත්සාහ උපදවා කෙබඳු ගුණයකින් යුත් කවරෙකුවිසින් මේ **ගන්ධාභරණ ග්‍රන්ථය** කරණලද්දේද? යන පැනය මෙනෙහි කොට ඒ පරිහරණය කරන්නේ පරියොසාන ගාථාවය කියයි)
95 යොසො, යම් ඒ භික්ෂුවෙක්; පුඤ්ඤවා, පිණැත්තේද;

96 තෙනෙව හිතකාමෙන, යතිපොතාන මුත්තමො
**අරියවංස** නාමෙන, කතො යං මතිවඩ්ඪනො ති—

# ගන්ධාභරණං නිට්ඨිතං.

---

පක්ඛුවා, පැනැත්තේද; සබ්බභූතලෙ, (සෂමරාෂ්ට්‍රනම්වූ) සියලුපෘථිවිතලයෙහි; පාකටො, ප්‍රකට වේද; අජ්ජවො, (කාය වාක් දෙදෙනාගේ වංකභාවය නැතිහෙයින්) සෘජුභාවයෙන් යුක්ත වේද; මද්දවො, මෘදුභාවයෙන් යුක්ත වේද; සනෙතා, සත්පුරුෂ වේද; පටිපත්තිහි, (අභිසමාචාරික ආදි බ්‍රහ්මචරියකාදි සම්‍යක්) ප්‍රතිපත්තියෙන්; යුතෙතාච, යුක්ත වේද—

96 යතිපොතානං, (පිටකත්‍රය ඉගෙණීමෙහිව්‍යාවෘතවූ) භික්ෂු පොතකයන්ට; හිතකාමෙන, වැඩකැමැත්තාවූ; අරිවංසනාමෙන, අරියවංසනම්වූ; තෙන එව, ඒ භික්ෂුවවිසින්ම; උත්තමො, උතුම්වූ; මතිවඩ්ඪනො, ප්‍රඥාවවර්ධනය කරණයිලිවූ; අයං, මේ **ගන්ධාභරණ**ග්‍රන්ථයතෙම; කතො ඉති, කරණලද් දේයි—

# ගන්ධාභරණය නිමි.

---

1 සද්ධම්මවිනයෙ චෙව, සද්දසත්ථෙච සික්ඛිතො
සලෙලක්ඛයො ගුණවාසො, සබ්බො විස්සුතකිත්තිමා—

2 පටිපත්තිරතො සාධු, අජ්ජවො මද්දවො සුධී
සද්ධම්මදෙසනෙ දක්ඛො, මජ්ඣිමාගම භාණකො—

3 සික්ඛාසු ගාරවො චාරු, සීලාභරණ භූසිතො
**පදුමාරාම** නාමො යො, මහාථෙර වරො අහු—

4 පාදච්ඡායාය තස්සෙව, වඩ්ඪිතෙන සුධීමතො
පධාන සිස්සභූතෙන, ගරුභත්ති සමඞ්ගිනා—

5 අරියවංසාලඞ්කාර, සංසදිත්ථාභි ධානිනා
උක්කාණ්ඩාදි මහාතිස්ස, පරනාමයුතෙනච—

6 ඤාණතිලක විඛ්‍යාත, නාමිකෙන මයා පන
ගන්ධාභරණ ව්‍යාඛ්‍යායං කතා සීහළභාසයා—

7 සොහං න්‍යාසස්ස ව්‍යාඛ්‍යඤ්ච, ව්‍යාඛ්‍යඤ්ච සද්දබින්දුනො
කච්චායනසාර ව්‍යාඛ්‍යඤ්ච, ව්‍යාඛ්‍යානං කාරිකායච—

8 එකක්ඛරාදිකොසස්ස, ව්‍යාඛ්‍යානඤ්ච සඞ්ගහං
වච්චවාචක ව්‍යාඛ්‍යඤ්ච, ව්‍යාඛ්‍යඤ්ච සද්දවුත්තියා—

9 නිරුත්තිසඞ්ගහස්සාපි, ව්‍යාඛ්‍යානං මතිවඩ්ඪනං
ව්‍යාඛ්‍යං සංවණ්ණනානය, දීපනී පොත්ථකස්ස ච—

10 වාචකොපදෙසස්ස, ව්‍යාඛ්‍යඤ්ච බුද්ධිවඩ්ඪනං
විභත්‍යත්ථදීපනියා, ව්‍යාඛ්‍යං, සිස්සහිතං සුභං—

11 ව්‍යාඛ්‍යං ගන්ධට්ඨි ගන්ථස්ස, මොහමුග්ගර වණ්ණනං
අඤ්ජනාදිනිදානස්ස, සිඞ්ගාරතිලකස්සච—

12 සාසනවංසදීපස්ස, ව්‍යාඛ්‍යඤ්ච දීපභාසයා
කාරිං නිට්ඨාපිතා එකෙ, මුද්දාපෙතබ්බා තෙසු හි—

13 ලඞ්කාදීපමුපාගතො, චූළාලඞ්කාර නාමිකො
තෙජස්සී කාරිකා ව්‍යාඛ්‍යං, ස්‍යාමරාජා පටිග්ගහි—

14 පණෙතබ්බ දුත්‍යෙ වාරෙ; නිරුත්තිරතනාකරං
පටිගය්හ අදා මය්හං, ගරුනාමං සභූපති—

15 න්‍යාසව්‍යාඛ්‍යං පටිගය්හ, ජිජ්ජෙව නාම නරාධිපො
මරම්මවංසිකානග්ග, නායකත්තං අදා මමං—

16 ජාතො විප්පකුලෙ සුද්ධෙ, පහූත ධනධඤ්ඤවා
ධනං සමක්ඛකො මය්හං, ජනකොසි කුටුම්බිකො—

17 බ්‍රහ්මබන්ධුකුලෙ ජාතා, සබ්බාසීල ගුණාකරා
අසි මෙ ජනනි සෙනා, පතිනා ව්‍යවහාය ශ්‍රුතා—


18 ඩී. ඈස්. පී. රාජකරුණා, මනාතිඥෙ, කතවෙදිනො
පධානදායකො මය්හං, සුවිජ්ජපඤ්ඤ සුඛිනාවො—

19 සාලිස්ද සිල්වාමුනිඥ, දුසස්ස බ්‍රහ්මබන්ධුනො
පීතියා පනිමං මුද්දා, පනපාය අදාසහං—

20 සුරාසුරාච බ්‍රහ්මානො, ගරු මෙ අභිතා හිතා
ගතප්පකතපුඤ්ඤෙන, මොක්ඛං යන්තු බිලම්බිනො—

21 ඉමිනා පුඤ්ඤකම්මෙන, පණ්ඩිතොව භවාභවෙ
ලද්ධා පණ්ඩිත සංවාසං, බුද්ධො හොමි අනාගතෙ—

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු